# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

# இலங்கை ரூபவாஹினி கூட்டுத்தாபனம்

# Sri Lanka Rupavahini Corporation


P.O. Box : 2204, Independence Square, Colombo 07, Sri Lanka

Telephone : 011 250 1050 / 011 259 9505

Fax : 011 258 0131

E - Mail : chmn@rupavahini.lk

Website : www.rupavahini.lk

ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙතටයි.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වන අප 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය යටතේ 2020 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමු.

ගිණුම් වාර්තාද අමුණා ඇත.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වෙනුවෙන්

වෛද්‍ය නිහාල් ජයතිලක
සභාපති
ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

## දැක්ම

ඇසිදිසි මාධ්‍යයේ නිබඳ ශ්‍රී ලාංකේය මුද්‍රාව

## මෙහෙවර

දැනුම විනෝදය අධ්‍යාපනය සපිරි කාලෝචිත අර්ථපූර්ණ ප්‍රතිභාසම්පන්න වැඩසටහන් කැපවීමෙන් යුතුව එක්සත්ව නිර්මාණය කර නව තාක්ෂණයන් ඔප්නංවා සිවුදෙස විසිරි ශ්‍රී ලාංකිකයන්ගේ අපේක්ෂා අභිබවමින් විසුරුවා හැරීම

## ඉලක්ක

රූපවාහිනී වැඩසටහන්වල ආකෘතිමය වෙනස්කම් තුළින් ආකර්ෂණීයභාවය විවිධත්වය හා අර්ථපූර්ණභාවය වැඩි දියුණු කිරීම.

නව තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් පර්යේෂකයින් වෙත පහසුවෙන් ළඟාවීම.

ආයතනයේ භෞතික හා මානව සම්පත් ඵලදායී ලෙස වැඩි දියුණු කිරීම.

ආයතනයට අතිරේක ආදායම් උත්පාදන මාර්ග හඳුන්වාදීම.

තරඟකාරීත්වයට ගැලපෙන පරිදි ආයතනයේ ව්‍යවස්ථාපිත රාමුව සංශෝධනය කිරීම.

# පටුන


සභාපතිතුමාගෙන් 05

සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය 06

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය 07

සම්මානනීය ජයග්‍රහණ 08

වැඩසටහන් අංශය 10

අධ්‍යාපන වැඩසටහන් අංශය 23

ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශය 32

නිෂ්පාදන සේවා අංශය 39

ඉංජිනේරු අංශය 54

අලෙවි අංශය 63

පරිපාලන අංශය 66

මුදල් අංශය 86

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය 87

මූල්‍ය වාර්තාව 88

විගණන වාර්තාව 144



## සභාපතිතුමාගෙන්

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව එහි සභාපතිවරයා ලෙස පළමු කොට මාගේ සතුට පළ කරමි.

මුළු මහත් දේශය තුළම දේශපාලන, සමාජ හා ආර්ථික පරිවර්තනයක් සිදුවෙමින් පැවතියදී රටේ ප්‍රධාන විද්‍යුත් මාධ්‍යයේ මුල් පුටුව හොබවන්නට ලැබීම අතිශය අසීරු සහ වගකීම් සහගත අභියෝගයකි. විධිමත් සැලැස්මක් යටතේ ජාතික රූපවාහිනියේ පරිවර්තනයක් සිදුකරන්නට ආරම්භ කරන විටම පළමුව ලොව පුරා සහ දෙවනුව ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය විසින් එකී සියලු සැලසුම් අකර්මන්‍ය කෙරිණි. මුළු මහත් රටම අඩපණ විය. විටෙක රට වසා දැමිණි. එහෙත් එබඳු තත්වයක වුවද කාලෝචිතව සැලසුම් වෙනස් කරමින් රටට හා ජනතාවට අවශ්‍ය නිවැරදි සන්නිවේදනය සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ ලබා දෙන්නට ජාතික රූපවාහිනිය නිරතුරුව සහ අඛණ්ඩව ක්‍රියාත්මක විය. රටේ මෙන්ම කාර්ය මණ්ඩලයේද අවශ්‍යතා නොඅඩුව සපුරමින් මෙම දුෂ්කර කාලපරිච්ඡේදය තරණය කරන්නට ලැබීම මහත් ජයග්‍රහණයකි. අදටත් ඒ අභියෝගය හමුවේ අපට ජාතික ආයතනයක් ලෙස නොසැලී පෙරට යන්නට හැකියාව ලැබී ඇති බව මා සඳහන් කරන්නේ අභිමානයෙනි.

මෙම කාලය තුළ ගුණාත්මක බවින් ඉහළ වැඩසටහන් සහ ටෙලි නාට්‍ය විකාශය කරමින් නාලිකාවක් ලෙස ජනප්‍රසාදය හිමිකර ගන්නට අපට හැකි විය. සියලු නාලිකා අභිබවමින් වැඩිම සම්මාන හිමිකරගෙන 2020 වසරේ සම්මානනීය නාලිකාව වූයේද ජාතික රූපවාහිනියයි.

ආර්ථික, සමාජීය හා සෞඛ්‍යමය අභියෝග හමුවේ කැපවී කටයුතු කරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ කාර්ය මණ්ඩලය වෙත මාගේ ස්තූතිය පළ කරන අතර මෙතෙක් නොසැලෙන අධිෂ්ඨානයක් හමුවේ ඉදිරියට පැමිණි ආකාරයෙන්ම ඉදිරි වසර ද ජයග්‍රහණය කිරීමේ ශක්තිය අප සතු බව අවධාරණය කරමි.

වෛද්‍ය නිහාල් ජයතිලක
සභාපති
ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

## සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය

2020 වර්ෂයේ සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය හෙබ වූ සාමාජිකයන් පහත දැක්වේ

01. වෙද්‍ය නිහාල් ජයතිලක මහතා - සභාපති (ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව)
02. ප්‍රසන්න හෙන්නායක මහතා - ප්‍රවීන කැමරා ශිල්පී
03. ඉන්දික ලියනගේවගේ මහතා - ප්‍රධාන විධායක නිලධාරී
04. ඉන්දික ජයරත්න මහතා - අධ්‍යක්ෂ (සිංහල සේවය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
05. මංජුල මාකුඹුර මහතා - නීතිඥ
06. ජයන්ත ධර්මදාස මහතා - සභාපති (ජාතික චිත්‍රපට සංස්ථාව)
07. පී.කේ.එස්.සුබෝධිනී - අතිරේක ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (2020.12.15 සිට)
08. කේ.ජී.විජේසිරි මහතා - අතිරේක ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (2020.10.16 දක්වා)
09. එච්.එච්.කස්තුරිආරච්චි මහතා - අධ්‍යක්ෂ ජනරාල්, මුදල්,ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
10. එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී.සත්කුමාර - අතිරේක ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය

(මෙම වර්ෂය තුළ සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය 19 වතාවක් රැස් වී තිබේ.)

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

| | | |
|---|---|---|
| 01. සභාපති | - | වෛද්‍ය නිහාල් ජයතිලක |
| 02. අධ්‍යක්ෂ ජනරාල් | - | අජිත් ගුණරත්න නාරගල මහතා |
| 03. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) | - | පාලිත ගාල්ලගේ මහතා |
| 04. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) | - | කේ.එල්. මානෙල් කුලරත්න මහත්මිය (2020.11.07) |
| | - | පී.ජී.ආර්.හේමන්ති කුමාරි මහත්මිය (2020.11.23 සිට) |
| 05. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(වැඩසටහන්) | - | සුමේධ අතුලසිරි මහතා |
| 06. අධ්‍යක්ෂ (නි.සේ) | - | පාලිත කේ.විජේසිංහ මහතා |
| 07. ප්‍රධාන ඉංජිනේරු | - | ඩී.එම්.කේ. දසනායක මහතා |
| | - | බී.එස්.පී.පෙරේරා මහතා |
| 08. අධ්‍යක්ෂ (අධ්‍යාපන වැඩසටහන්) | - | එරීන් විජේකෝන් මහත්මිය |
| 09. ප්‍රධාන ගණකාධිකාරී | - | ඒ.එච්.ඊ.ආර්.පී.එදිරිසිංහ මහත්මිය |
| 10. අධ්‍යක්ෂ (අලෙවි) | - | මොහොමඩ් අලි අහ්ලම් මහතා (2020.02.29 දක්වා) |
| 11. අධ්‍යක්ෂ (විවිධ වැඩසටහන්) | - | විජය දිසානායක මහතා |
| 12. අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම්) | - | ඉන්දික මාරසිංහ මහතා (රා.අ) |

# සම්මානනීය ජයග්‍රහණ

## රයිගම් සම්මාන උළෙල - 2020 සම්මානලාභීන්

| සම්මානය | වැඩසටහන | නිෂ්පාදක |
|---|---|---|
| වසරේ විශිෂ්ටතම ඒකාංගික ටෙලි නාට්‍ය | අපරාරම්භ ඒකාංගික ටෙලි නාට්‍ය | සන්තුස ලියනගේ |
| වසරේ විශිෂ්ටතම අධ්‍යාපන වැඩසටහන | නොලේජ් ෆස්ට් | ජානක සුජීව |
| ජූරියේ විශේෂ ඇගයුම් සම්මානය | වැවක් වගේ කතක් | සන්ධ්‍යා විතානවසම් |
| | මිහිකත තනි නැත (වාර්තා වැඩසටහන) | චන්දන සෙනෙවිරත්න |
| වසරේ විශිෂ්ටතම කලා අධ්‍යක්ෂණය | සුදු ඇඳගෙන කළු ඇවිදින් ටෙලි නාට්‍ය | අජන්ත අලහකෝන් |
| වසරේ විශිෂ්ටතම කැමරා අධ්‍යක්ෂණය | සුදු ඇඳගෙන කළු ඇවිදින් ටෙලි නාට්‍ය | සිසිකිරණ පරණවිතාන |
| වසරේ විශිෂ්ටතම හොඳම නළුවා | සුදු ඇඳගෙන කළු ඇවිදින් ටෙලි නාට්‍ය | ආනන්ද කුමාර උන්නැහේ |
| වසරේ විශිෂ්ටතම ශබ්ද පටිගත කිරීම | වීරයා ගෙදර ඇවිත් | එස්. රාජේන්ද්‍ර |
| වසරේ විශිෂ්ටතම ටෙලි නාට්‍ය සංස්කරණය | වීරයා ගෙදර ඇවිත් | ජගත් වීරතුංග |
| වසරේ විශිෂ්ටතම සංගීත අධ්‍යක්ෂණය | වීරයා ගෙදර ඇවිත් | ගයාන් සනකධාර |
| වසරේ විශිෂ්ටතම ටෙලි නාට්‍ය අධ්‍යක්ෂණය | වීරයා ගෙදර ඇවිත් | ආනන්ද අබේනායක |
| ජූරියේ විශේෂ සම්මානය | වීරයා ගෙදර ඇවිත් | නෙතලි නානායක්කාර |
| වසරේ විශිෂ්ටතම ටෙලි නාට්‍ය තිර රචනය | වීරයා ගෙදර ඇවිත් | නාමල් ජයසිංහ |
| වසරේ විශිෂ්ටතම සහාය නිළිය | වීරයා ගෙදර ඇවිත් | දිනූපා කෝදාගොඩ |
| ජූරියේ විශේෂ සම්මානය | වීරයා ගෙදර ඇවිත් | අකිඳු මෙනුජ බණ්ඩාර |
| වසරේ විශිෂ්ටතම සහාය නළුවා | වීරයා ගෙදර ඇවිත් | කණිෂ්ක සේවියර් |
| වසරේ විශිෂ්ටතම සහාය නිළිය | සුදු ඇඳගෙන කළු ඇවිදින් ටෙලි නාට්‍යය | මිෂෙල් දිල්හාරා |
| ජූරියේ විශේෂ සම්මානය | සෙල්ලම් කරත්තය | හේෂාල් නවින් |
| වසරේ විශිෂ්ටතම ටෙලි නාට්‍ය නිෂ්පාදනය | සුදු ඇඳගෙන කළු ඇවිදින් ටෙලි නාට්‍ය | දනුෂ්ක සුදර්ශනී |
| වසරේ සම්මානනීය ටෙලි නාට්‍ය නාලිකාව | ජාතික රූපවාහිනිය | |
| වසරේ සම්මානනීය නාලිකාව | ජාතික රූපවාහිනිය | |

- රයිගම් සම්මාන උළෙලේ හොඳම අධ්‍යාපන වැඩසටහන නිර්දේශය **(ජාතික පාසල - විද්‍යාව) - නිලූෂා මොහොට්ටි**

- රයිගම් සම්මාන උළෙලේ හොඳම අධ්‍යාපන වැඩසටහන නිර්දේශය - ( සුක්කානම) - **තරංගි අතුරලිය**

- **'පුංචි අපේ ලෝකය' ළමා වැඩසටහන** රයිගම් ටෙලි සම්මාන උළෙල 2019 - වසරේ විශිෂ්ටතම ළමා වැඩසටහන ලෙස නිර්දේශ ලැබීම - නිෂ්පාදක - **තුසිත විදානපතිරණ**

- SLT Speed up - පාපැදි සවාරිය සුමති සම්මාන උළෙල 2019 - නිර්දේශිත නාමයන්- **තුෂාන් ඉන්දික**

- 2020 වසරේ රයිගම් ටෙලිසම්මාන උළෙලේ හොඳම ළමා වැඩසටහන සඳහා කුරුල්ලන්ට ගී වැඩසටහන නිර්දේශ විය - නිෂ්පාදක - **මාලතී වීරසිංහ මිය**

- මහ මැතිවරණය පිළිබඳ අන්තර් ජාතික වාර්තාකරණය සම්බන්ධව හොඳම සැලසුම්ගත ප්‍රවෘත්ති වාර්තාකරණය සම්මානය සඳහා නිර්දේශ විය. (ආසියාවේ රටවල් 35 ක් අතරින් නිර්දේශ වූයේ රටවල් තුනක් පමණි)

- 2020 වසරේ කාලීන සිදුවීම් ඒකකය මගින් නිෂ්පාදනය කරන "රටා" වැඩසටහන, රයිගම් ටෙලිසම්මාන උළෙලේ විශිෂ්ටතම වාර්තා වැඩසටහන සඳහා නිර්දේශ විය .

# වැඩසටහන් අංශය

## නාට්‍ය ඒකකය

### නාට්‍ය ඒකකයේ අරමුණ

- එදිනෙදා විකාශය වන රූපවාහිනී වැඩසටහන් අතරින් ජනප්‍රියතම අංගයක් වන ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයේ පුරෝගාමීන් ලෙස ටෙලි නාට්‍ය කලාවේ ප්‍රමිතීන් ආරක්ෂා කරමින් ප්‍රේක්ෂක රසඥතාව දියුණු කිරිම උදෙසා උසස් ඒකාංගික හා ප්‍රාසාංගික ටෙලි නාට්‍ය නිර්මාණය කිරීම. ක්ෂේත්‍රයට හැකි පමණින් නව නිර්මාණ හඳුන්වා දිම සහ නව ශිල්පීන් හඳුන්වා දීම (ලේඛකයන්,රංග ශිල්පීන් සහ සංගීතඥයින් වැනි)
- රූපවාහිනී ටෙලි නාට්‍ය කලාවට පාදක වූ කලාවන් වන වේදිකා නාට්‍ය,සිනමාව යන මාධ්‍ය ක්ෂේත්‍රවල සමගාමී වර්ධනය සඳහා පිටිවහලක් වීම (අන්තර් මාධ්‍ය පෝෂණය)
- අනාගතයේදී රූපවාහිනී ටෙලි නාට්‍ය කලාව අන්තර්ජාතික තලයකට ගෙන ඒම සඳහා කටයුතු කිරීම.
- රාජ්‍ය නාට්‍ය උළෙල,රාජ්‍ය සිනමා උළෙල, රාජ්‍ය සංස්කෘතික උත්සව,ජාතික උත්සව සජීව විකාශ හා වෙනත් කලා ප්‍රසංග ආවරණය තුළින් ජාතික මට්ටමේ සේවා ඉටු කිරීම.
- රූපවාහිනී සංස්ථාවට බැඳෙන නවක ශිල්පීන් හා මාධ්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වීමට රූපවාහිනී සංස්ථාවේ පුහුණුව හා මඟ පෙන්වීම අපේක්ෂා කරනු ලබන ශිල්පීන් පුහුණු කිරීම.
- ප්‍රවීණ කලාකරුවන් උදෙසා උපහාර වැඩසටහන් නිර්මාණය කිරීම.
- රූපවාහිනී ප්‍රේක්ෂකයා ටෙලි නාට්‍ය භාවිතය තුළින් ආනන්දයෙන් ප්‍රඥාව කරා මෙහෙයවීම.

### 2020 වසර තුළ විශේෂයෙන් සිදු කළ කාර්යයන් සහ ව්‍යාපෘති

- සිත නිවන කතා පෝය ඒකාංගික ටෙලි නාට්‍ය 06 ක් නිෂ්පාදනය කර විකාශය කිරීම.
- රාජ්‍ය නාට්‍ය උළෙල පටිගත කිරීම.
- නත්තල් ඒකාංගික ටෙලි නාට්‍ය විකාශය කිරීම.
- තාලභාෂණ වැඩසටහන් 48 ක් සෑම සෙනසුරාදා දිනකම සජීව විකාශය කිරීම.
- වාසුළිය වැඩසටහන් 32 ක් නිෂ්පාදනය කර විකාශය කිරීම
- අපේ සිංදුව වැඩසටහන් 34 ක් නිෂ්පාදනය කර විකාශය කිරීම.
- රූ Tube වැඩසටහන් 12 ක් විකාශය කිරීම.
- ඉරිදා ආයුබෝවන් සජීව විකාශය
- රංග භූමි වැඩසටහන් 30 ක් නිෂ්පාදනය

  අ.පො.ස (සා.පෙළ) හා උසස් පෙළ නාට්‍ය හා රංග කලාව විෂය නිර්දේශයට අදාලව න්‍යායික හා ප්‍රායෝගික පාඩම් මාලාවක් කොවිඩ් වසංගතය හේතුවෙන් විකාශය විය.

## <u>සංගීත ඒකකය</u>

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වැඩසටහන් අංශය යටතේ සංගීත වැඩසටහන් නිෂ්පාදන ඒකකය පවතී. “සංගීත විෂය පිළිබඳ උගත් හා විෂය පිළිබඳ අධ්‍යාපනය ලබන සියළු පොදු ජනතාවට රසවිඳිය හැකි නිර්මාණ ඉදිරිපත්කිරීම ” සංගීත ඒකකය පිළිබඳ පොදු හැඳින්වීමක් ලෙස ඉදිරිපත් කළ හැක.

- **සංගීත ඒකකය මගින් කෙරෙන කාර්යය වනුයේ,**
  අප රටේ විවිධ වයස් සීමාවන් වල සංගීත රසික රසිකාවියන්ගේ වින්දනය පිණිස සංගීත වැඩසටහන් නිෂ්පාදනය කිරීම.

- **සංගීත ඒකකය මගින් කෙරෙන සුවිශේෂී කාර්යය ලෙස,**
  ආධුනික හා ප්‍රවීන ගායන / වාදන ශිල්පීන්ගේ කුසලතා ඉදිරිපත්කිරීම හා නව සංගීත රසික පරපුරක් ඉදිරියේදී බිහිකිරීමට දරන උත්සාහය සුවිශේෂී කාර්යය ලෙස පැහැදිලි කළ හැක.

- **ඒකකයේ තනතුරු නාම සහ සේවක සංඛ්‍යාව.**

| | |
|---|---|
| ඒකක ප්‍රධානී (ස.අ. / නි.අ. / අධ්‍යක්‍ෂ) - | 01 |
| ජ්‍යෙ. නිෂ්පාදක | - 03 |
| නිෂ්පාදක , - | 02 |
| සහාය නිෂ්පාදක - | 02 |
| කා.කා.ස. | - 01 |
| එකතුව, නිලධාරීන් | **09** |

### ඒකකය විසින් නිෂ්පාදනය කරනු ලබන වැඩසටහන්

- “රජත සර” වැඩසටහන සෙනසුරාදා රාත්‍රී7.30-8.00 ගුවන් කාලයේ චැනල් අයි /නේත්‍රා හි විකාශයකර ඇත
- “සිහිනයකි රෑ” වැඩසටහනෙහි අන්තර්ගතය ලෙස ප්‍රවීන විචාරකයකු විසින් තෝරාගනු ලබන ගීත 10ක් ගායන ශිල්පියෙකු මගින් ඉදිරිපත්කිරීම දැක්විය හැකි අතර වැඩසටහන් මසක 04 බැගින් වර්ෂයකට වැඩසටහන් 48ක් ලෙස ඉරිදා රාත්‍රී 10.30-12.30 විකාශය විය.
- “ඉරිතැලුන මිනිස් මල්” නම්වූ කාලීන වැඩසටහන් 02ක් නිෂ්පාදනය කර ඇත.
- ටෙලි සිනමා වෘත්තාන්තය නැමැති විශේෂ වැඩසටහනක් නිෂ්පාදනය කර ඇත .
  (කාලය පැය 2)
- බ්‍රහස්පතින්දා “නුග සෙවන” මසකට වැඩසටහන් 04 බැගින් වැඩසටහන් 16ක් පමණ නිෂ්පාදනය කර ඇත.“
- “පාරමිතා” නම්වූ පෝදින (සජීවී) වැඩසටහනක් පෙ.ව 11.30 - 12.30 නිෂ්පාදනය කර ඇත.

<u>ක්‍රීඩා ඒකකය</u>

ක්‍රීඩා ඒකකය වැඩසටහන් අංශයට අයත් ඒකකයක් වන අතර අධ්‍යක්ෂ (ක්‍රීඩා), ජ්‍යෙෂ්ඨ නිෂ්පාදක වරියක, නිෂ්පාදකවරියක, සහය නිෂ්පාදකවරුන් 4 දෙනෙකු, නිෂ්පාදන සහකාරවරයෙකු සේවා පැවරුම් පදනම මත සේවය කරන නිෂ්පාදන සහකාරවරයෙකු , කළමනාකරණ සහකාරවරියක් සහ කාර්යාල සහකාරවරයෙකු ඇතුලත්ව නිලධාරීන් 11 දෙනෙකු පමණ රාජකාරී සිදු කරයි.තවද දේශිය සහ විදේශීය වශයෙන් ක්‍රීඩා තරග ආවරණය කිරීම ආදී විවිධ ක්‍රීඩා තොරතුරු සම්බන්ධ කටයුතු ක්‍රීඩා ඒකකය මගින් සිදු කරනු ලබයි.

තවද ක්‍රීඩා ඒකකය මගින් සතිපතා විකාශය කරන ක්‍රීඩා වැඩසටහන් අතුරින් පහත වැඩසටහන් විශේෂයෙන් සදහන් කළ යුතුය.

- දේශිය හා විදේශීය වශයෙන් සිදුවන ක්‍රීඩා ඉසව් අළලා නිෂ්පාදනය කරන ලද ක්‍රීඩා විසිතුරු වැඩසටහන සතිපතා විකාශය කිරීම.
- Beyond the Boundary වැඩසටහන දේශිය හා විදේශිය වශයෙන් සිදුවන ක්‍රීඩා විශේෂ අවස්ථාවන් අළලා ඒ පිළිබදව සමීක්ෂණය කරමින් සිදුකරනු ලබන වැඩසටහනකි. මෙය සතිපතා විකාශය වේ.

මීට අමතරව 2020 වසර තුළ සජීව ලෙස විකාශය කර ඇති වැඩසටහන්

- West India Tour of Sri Lanka (ODI) – 2020
- Sri Lanka Tour of India - 2020
- Air Force Cycle Race
- West India Tour of Sri Lanka – T20
- West India Tour of Sri Lanka - Highlight
- Vantage FFSL Presidens Cup -2020
- Sri Lanka Tour of South Africa – 1st Test
- Sri Lanka Tour of South Africa – 1st Test Highlight

  - 2020 වසර තුළ ක්‍රීඩා ඒකකයේ ගුවන් පැය 615.8 ක ක්‍රීඩා වැඩසටහන් විකාශය කර තිබේ. මෙම ගුවන් කාලය චැනල් අයි නාලිකාව තුළින් ගුවන් පැය 498.1 සහ රූපවාහිනී නාලිකාව තුළින් ගුවන් පැය 117.7 වෙයි.

## චිත්‍රපට හා හඬකැවීම් ඒකකය

<u>ඒකකයේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු</u>

| | | |
|---|---|---|
| 01. නියෝජ්‍ය අධ්‍යක්ෂ | - | 01 |
| 02. ජ්‍යේ.නිෂ්පාදක | - | 01 |
| 03. නිෂ්පාදක | - | 01 |
| 04. සහය නිෂ්පාදක | - | 06 |
| 05. නිෂ්පාදන සහකාර | - | 01 |
| 06. සජීවිකාරක | - | 06 |
| 07. හඬ කැවීම් පිටපත් සහයක් | - | 01 |

<u>වැඩසටහන් පිළිබඳ තොරතුරු</u>

- **උපසිරැසි ගන්වන ලද වැඩසටහන්**

| **වැඩසටහන** | **විකාශය වූ කොටස් ගණන** |
|---|---|
| 01. සින්දු භෛරවී | 30 mts x 185 |
| 02. අත්තිපුක්කල් | 30 mts x 39 |
| **වැඩසටහන් ගණන** | **224** |
| **ආවරණය කළ ගුවන් කාලය** | **112 hrs** |

- **හඬ කැවූ වැඩසටහන්**

| **වැඩසටහන** | **විකාශය වූ කොටස් ගණන** |
|---|---|
| 01. සසර කින්නරාවි (සිංහල හඬ කැවූ) | 30 mts x 39 |
| 02. රකුසු යාළුවෝ (සිංහල හඬ කැවූ) | 15 mts x 13 |
| 03. හැඩ වැඩ - බර්ටි සමඟ වික්ටර් (සිංහල හඬ කැවූ) | 15 mts x 20 |
| 04. හම්ටි ඩම්ටි (සිංහල හඬ කැවූ) | 30 mts x 26 |
| 05. ගෙදර යන්න පාර කියන්න(සිංහල හඬ කැවූ) | 01 hrs 24 mts x 01 |
| **වැඩසටහන් ගණන** | **99** |
| **ආවරණය කළ ගුවන් කාලය** | **42 ¼ hrs** |

**දේශීය සජීවකරණය කළ වැඩසටහන්**

| | |
|---|---|
| 01. ඩෙන්ගුවා | 05 mts x 01 |
| 02. සුර ගමරාල | |
| 2.1. වරක යකා | 03 mts x 01 |
| 2.2. දඩයම නැවැත්වූ හැටි | 03 mts 06 sec x 01 |
| 2.3. පුහුල් හොරා | 03 mts 03 sec x 01 |
| 2.4 .හඳට පොලු ගැසීම | 02 mts 39 sec x 01 |
| 2.5. වක්කඩේ හකුරු | 03 mts 09 sec x 01 |
| 2.6. අලි කරදර | 03 mts 50 sec x 01 |
| 2.7. සුරලොව නොගිය ගමන | 02 mts 32 sec x 01 |
| 2.8 .වැරදුන සූත්තරය | 02 mts 21 sec x 01 |
| 2.9. ළිං හොරු | 03 mts 23 sec x 01 |
| 2.10. ගම නැන්දා ගමේ ගිහින් | 02 mts 26 sec x 01 |
| 03. දළඹු පුංචා | |
| 3.1. දළඹු පුංචා 01 | 04 mts 48 sec x 01 |
| 3.2. දළඹු පුංචා 02 | 05 mts 00 sec x 01 |
| 3.3. දළඹු පුංචා 03 | 04 mts 58 sec x 01 |
| 3.4. දළඹු පුංචා 04 | 04 mts 52 sec x 01 |
| 3.5 .දළඹු පුංචා 05 | 05 mts 24 sec x 01 |
| 3.6. දළඹු පුංචා 06 | 04 mts 51 sec x 01 |
| 3.7. දළඹු පුංචා 07 | 05 mts 08 sec x 01 |

වෙනත් සජීවකරණ වැඩසටහන්

- පුංචි අපේ ලෝකය - දෙවන වැඩසටහන් පෙළ - කොටස් 11
- Fun With Tiny Dot - පැය 01 කොටස් 10
- Emmy Yammy - පැය 01 කොටස් 18
- මැතිවරණ කටයුතු සඳහා ග්‍රාෆික නිර්මාණය
- නිවාඩු කාලය සඳහා පූර්ව ප්‍රචාරක පට නිර්මාණය
- Covid 19 දැනුවත් කිරීමේ වීඩියෝපට 05 ක් සැකසීම
- නාලිකා ප්‍රවර්ධන ප්‍රධාන තේමාව නිර්මාණය කිරීම

**වැඩසටහන් ගණන** **18**
**ආවරණය කළ ගුවන් කාලය** **1 hrs 15 mts**

**විදේශ තරඟ සඳහා වෙනත් ඒකකවලට සහ බාහිර ආයතනවලට හඬ සහ උපසිරැසි ගැන්වූ වැඩසටහන්**

01. යුධකාමරය - war Room (සිංහල හඬකැවූ) - 02 hrs 00 mts x 01

02. දිරිය - Courageous (සිංහල හඬකැවූ) - 02 hrs 09 mts x 01

03. ගිනි ආරක්ෂණය - Fireproof(සිංහල හඬකැවූ) - 01 hrs 58 mts x 01

04. දුම්රියේ ගැටෙන අලි - සොබාධාරා (ඉංග්‍රීසි උපසිරැසි) - 30 mts x 01

05. සමාජ යටිතල (ඉංග්‍රීසි උපසිරැසි) - 15 mts x 01

06. දේශීය නිෂ්පාදන කර්මාන්ත (ඉංග්‍රීසි උපසිරැසි) - 15 mts x 01

07. ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා
නොබැඳි ජාතීන්ගේ සමුළුව අමතා කළ කතාව (දෙමළ උපසිරැසි) - 10 mts x 01
(සිංහල උපසිරැසි) - 10 mts x 01

08. පාරාදීසයේ භීෂණය (සිංහල උපසිරැසි) - 60 mts x 01

**වැඩසටහන් ගණන** **09**

**ළමා වැඩසටහන්**

01. Fun with Tiny Dot - ළමා වැඩසටහන - 60 mts x 10

02. Emmy Yammy - ළමා වැඩසටහන - 60 mts x 10

**වැඩසටහන් ගණන 28**
**ආවරණය කළ ගඅවන් කාලය 28 hrs**

**<u>NHK වැඩසටහන්</u>**

සිංහල හඬ කැවූ/ දෙමළ උපසිරැසි

| | |
|---|---|
| Project x | 43 mts x 03 |
| Pushing the limits | 15 mts x 08 |
| Small Worldwide Companies | 10 mts x 05 |
| World Cultural heritage Site in Japan | 20 mts x 05 |
| The Mark of Beauty | 25 mts x 13 |
| 10 Minutes of Science | 10 mts x 60 |
| Digital Evolution | 20 mts x 05 |
| Mathematica 2 | 15 mts x 04 |
| Antarctica | 15 mts x 10 |
| 10 Minutes of Ecology | 10 mts x 10 |

**වැඩසටහන් ගණන 123**
**ආවරණය කළ ගුවන් කාලය 28 hrs 54 mts**

**2020 වසර තුළ විකාශනය කළ වෙනත් වැඩසටහන් සංරක්ෂණය**

| | |
|---|---|
| අභීත දියණී | 45 mts x 71 |
| රහාන් | 30 mts x 19 |
| රොබෝකොප් | 30 mts x 16 |
| දොස්තර හොඳහිත | 30 mts x 15 |
| දඟර වලිග | 30 mts x 14 |
| ගලිවරයන්ගේ සුවිසැරිය | 30 mts x 14 |
| පිස්සු පූසා | 30 mts x 21 |
| හා හා හරි හාවා | 30 mts x 09 |
| මායාවරුන්ගේ ලෝකය | 60 mts x 39 |
| සූරිය දියණී | 45 mts x 51 |
| චූල කාබාසිනියා තුමා | 30 mts x 13 |

## ආගමික වැඩසටහන් ඒකකය

- බෞද්ධ ආගමික වැඩසටහන් සහ ව්‍යාපෘතින්ට අදාල වැඩසටහන් නිෂ්පාදනය කිරීම.

| තනතුරු නාමය | සිටින සේවක සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (විවිධ වැඩසටහන්) | 01 |
| ජ්‍යෙෂ්ඨ නිෂ්පාදක | 01 |
| නිෂ්පාදක | - |
| සහාය නිෂ්පාදක | 02 |
| කළමනාකරණ සහකාර | 01 |
| කාර්යාල කාර්ය සහායක | - |

- බුද්ධ ශාසන අමාත්‍යාංශ සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව අනුග්‍රහයෙන් රාජ්‍ය වෙසක් උත්සවය සිදු කිරීම.
- බුද්ධ ශාසන අමාත්‍යාංශය සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව අනුග්‍රහයෙන් රාජ්‍ය පොසොන් උත්සවය සිදු කිරීම.
- සුරිඳුනි කතරගම ඇසළ පෙරහැර නිෂ්පාදන කටයුතු සිදු කිරීම.
- මැදින් පෝය දින ශ්‍රීපාදස්ථානයේ සිට සජීව විකාශය 37 වන වරටත් සිදු කරනු ලැබූ අතර, මෙවර විශේෂ ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී පාද පද්මය ට උඩුවියන් පූජාවක් සිදු කිරීම.
- සෑම පසළොස්වක පෝය දිනකම ප්‍රජා සත්කාරක වැඩසටහනක් කිරීම.

❖ කොවිඩ් වසංගත තත්ත්වය නිසා විශේෂ ව්‍යාපෘති අවමව සිදු කිරීමට සිදු වූ නමුත් ඒකකයේ අඛණ්ඩ වැඩසටහන් නොකඩවා සිදු කරන ලදි.

## තරුණ වැඩසටහන් ඒකකය

තරුණ වැඩසටහන් ඒකකය 2020 වර්ෂය තුළ පහත වැඩසටහන් නිෂ්පාදනය කර ඇත.

| නිෂ්පාදනය කළ වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| සංහිඳ වැඩසටහන් | 10 |
| පියවර | 02 |
| සඳකඩ | 01 |
| විෂන් | - |
| බයිලා සාදය | 09 |
| සුභානි රාත් | 36 |
| ආලකමංදාව | 12 |
| ඉරිදා ආයුබෝවන් | 12 |

## වැඩසටහන් ඉදිරිපත් කිරීමේ ඒකකය

සහකාර අධ්‍යක්ෂ වරයෙක් යටතේ කටයුතු කරන වැඩසටහන් ඉදිරිපත් කිරීමේ ඒකකයේ කාර්යය වන්නේ රූපවාහිනී සංස්ථාවේ නාලිකා තුනෙහි වැඩසටහන් විකාශය සඳහා පෙළගැස්වීමයි. තරඟකාරී නාලිකාවන්හි විකාශය වන වැඩසටහන් පිළිබඳ අවබෝධයෙන් පවුලේ සියලු දෙනාටම එකට හිඳ නැරඹිය හැකි සමබර වැඩසටහන් නාලිකා තුනෙහිම විකාශය කෙරේ. මෙම කාර්යයන් ඉටු කිරීමට 15 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් මෙම ඒකකයේ සේවය කරයි.

වැඩසටහන් විකාශය සඳහා පෙළගැස්ම අදියර කිහිපයකින් සිදු වේ. ප්‍රථමයෙන් අදාළ වැඩසටහන ලේඛනගත කිරීම සිදු වේ. වැඩසටහන් සැලසුම් රැස්වීම් වලදී විකාශය වන වැඩසටහන්, දිනයන් සහ වේලාවන් පිළිබඳ තීරණය කෙරේ. එම තීරණ සහ වැඩසටහන් අංශ ප්‍රධානිගේ දැනුම් දීම අනුව ඉහත පරිදි වැඩසටහන ලේඛනගත වේ. දෙවනුව නියමිත වැඩසටහන් නිෂ්පාදක විසින් වැඩසටහන පිළිබඳ විස්තර පත්‍රිකාවක් වැඩසටහන් ඉදිරිපත් කිරීම් ඒකකයට බාරදෙනු ලැබේ. මෙම පත්‍රිකාවෙහි වැඩසටහනේ නම, ධාවන කාලය, විකාශය වන දිනය, වේලාව, කැසට් අංකය, වැඩසටහන් වර්ගය සහ ප්‍රධානීන්ගේ අනුමැතිය සඳහන් අත්සන් ද ඇතුළත් වේ. මෙම තොරතුරු පරිගණකගත කෙරේ. නිෂ්පාදකවරු විසින් වැඩසටහනට අදාළ කැසට්පටය පුස්තකාලය වෙත බාරදීම අනතුරුව සිදු වෙයි. වැඩසටහන් ඉදිරිපත් කිරීම් ඒකකයේ නිලධාරීහු එම කැසට්පටය පුස්තකාලයෙන් ලබාගෙන විකාශය සඳහා ප්‍රධාන පාලක මැදිරියට බාර දී විකාශයෙන් පසුව ප්‍රධාන පාලක මැදිරියෙන් කැසට් පටය ලබාගෙන නැවත පුස්තකාලය වෙත බාර දෙනු ලැබේ.

බාහිරින් ලැබෙන වැඩසටහන් වල කැසට්පට පූර්ව නිරීක්ෂණය කර විකාශය සඳහා ප්‍රධාන පාලක මැදිරියට භාරදෙනු ලැබේ. මෙයට අමතරව සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ උපදෙස් මත දෛනික ලේඛනයට පරිබාහිරව විශේෂිත වූ වැඩසටහන් ලේඛන ගත කිරීම සිදු කරනු ලැබේ. අලෙවි අංශයේ ඉල්ලීම පරිදි අනුග්‍රාහක බවතුන් හට ගුවන් කාලය ලබා දීමද සිදු කරන අතර නිෂ්පාදක වරුන්ගේ වැඩසටහන් වල ධාවන කාලය අඩු වූ

අවස්ථා වලදී කෙටි පූර්ව ප්‍රචාරක පට යොදා එම ගුවන් කාලය සමබරව පවත්වාගෙන යාමද අප ඒකකය විසින් සිදු කරනු ලැබේ.

තවද වැඩසටහන් සඳහා සජීවීකාරක පට නිපදවන ලද අතර විශේෂිත අවස්ථාවල පූර්ව ප්‍රචාරක පට නිෂ්පාදනය කරනු ලබයි.

වැඩසටහන් ඉදිරිපත් කිරීමේ ඒකකය 1982 සිට මේ දක්වා විකාශය වූ වැඩසටහන් පිළිබඳ විස්තර ලේඛනයක් පවත්වාගෙන යමින්, රූපවාහිනී සංස්ථාවේ වැඩසටහන් පිළිබඳ ඉතිහාසයේ සාක්ෂිකරු බවට පත්ව තිබේ.

## ඉසව් කළමණාකරණ සහ වැඩසටහන් නිෂ්පාදන ඒකකය

ඉසව් කළමණාකරණ සහ වැඩසටහන් නිෂ්පාදන ඒකකය රූපවාහිනී සංස්ථාව තුළ ස්ථාපනය කරන ලද්දේ 2017 වසරේදීය. වේගයෙන් වෙනස් වන රූපවාහිනී කර්මාන්තය පිළිබඳව සැළකිල්ලට ගෙන කර්මාන්තයේ නව මානයන් වෙත අනුගත වීම ඉලක්ක කර ගෙන සංස්ථා කළමණාකරණය විසින් මෙම ඒකකය පිහිටුවන ලදි. විශේෂයෙන් රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනයට පමණක් සීමා වී තිබූ මෙම කර්මාන්තය මේ වන විට ඉසව් කළමණාකරණය හා සම්මිශ්‍ර වෙමින් නව මානයන් වෙත ගමන් කරමින් තිබේ. තවදුරටත් සාම්ප්‍රදායික වැඩසටහන් වලින් පමණක් වෙළඳපළ ඉලක්ක ජය ගැනීම අභියෝගයක් වී ඇති පසු බිමක නව ඉසව් සහ ඊට බද්ධ වූ රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය කිරීම මෙම ඒකකයේ මූලිකම ඉලක්කයයි. එමගින් ආදායම් විවිධාංගීකරණයක් වෙත අවතීර්ණ වීම කාලීන අවශ්‍යතාවයක් ලෙස පවතී. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා නව්‍ය ඉසව් වැඩසටහන් නිර්මාණය කරමින් තරගකාරී වෙළඳපළ තුළ කටයුතු කිරීම මෙම ඒකකයේ මූලික අරමුණයි. ඒ සඳහා අවශ්‍ය කරන නව ඉසව් වැඩසටහන් යෝජනා රැසක් ඉදිරිපත් කර තිබේ. එමෙන්ම විශේෂයෙන් සෑම මසකම එවැනි විශේෂ ඉසව් වැඩසටහනක් නිෂ්පාදනය කිරීමට අදාල යෝජනා සැළසුම් කර තිබුණ නමුත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2020 මාර්තු මාසයෙන් පසුව එවැනි වැඩසටහන් නිෂ්පාදනය කිරීම ප්‍රායෝගිකව සිදු කළ නොහැකි විය.

### කාර්ය මණ්ඩලය

ඉසව් කළමණාකරණ සහ වැඩසටහන් නිෂ්පාදන ඒකකය මෙහෙය වීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයෙකු පත් කර ඇති අතර වැඩසටහන් නිෂ්පාදකවරු දෙදෙනකු, සහය නිෂ්පාදකවරයෙක් සහ නිෂ්පාදන සහකාරවරයෙකු මෙන්ම කාර්යාල කාර්ය සහයෙකයෙකු දැනට මෙම ඒකකයට අනුයුක්ත කර සිටී.

## දැනට නිෂ්පාදනය කරන වැඩසටහන්

| අංකය | වැඩසටහන | විකාශය වන දින |
|---|---|---|
| 01 | යන තැන - සංචාරක කර්මාන්තයට අදාල වැඩසටහනකි | සෑම සෙනසුරාදාම උදේ 10.30 |
| 02 | සඳුදා - නුග සෙවන | සෑම සඳුදාම උදේ 8.00-11.00 |
| 03 | බ්‍රහස්පතින්දා නුග සෙවන | සෑම බ්‍රහස්පතින්දාම උදේ 8.00-11.00 |
| 04 | ඉරිදා ආයුබෝවන් | සෑම මසකම අවසන් ඉරිදා උදේ 8.00 සිට 10.00 දක්වා |
| 05 | රූපවාහිනී අවුරුදු කුමරිය | ඉදිරියේදී විකාශය වීමට නියමිතය |

## 2020 වසර තුළ නිෂ්පාදනය කරන ලද වැඩසටහන්

| අංකය | වැඩසටහන | විකාශය කළ දින |
|---|---|---|
| 01 | ඉනෝ ටෙක් ප්‍රදර්ශණය - 2020<br>හරිත සරසවියේ සිට | ඉසව් වැඩසටහනකි. 2020.03.11/12/13 විකාශය විය. |
| 02 | රූ මංසල - ආයතනික වැඩසටහන් ප්‍රවර්ධන වැඩසටහනකි | 2020.10.30 |
| 03 | සිකුරාදා නුගසෙවන | 2020 |
| 04 | රූපවාහිනී අවුරුදු කුමරිය | |
| 05 | රූපවාහිනී අවුරුදු චාරිත්‍ර | 2020 |
| 06 | විශේෂ සංගීත ප්‍රසංග 2 - මැදිරි | 2020 |
| 07 | ඉරිදා ආයුබෝවන් | සෑම මසකම අවසන් ඉරිදා උදේ 8.00 සිට 10.00 දක්වා |

## යෝජිත වැඩසටහන්

| අංකය | වැඩසටහන | විකාශය වන දින |
|---|---|---|
| 01 | Backpacker - නොදත් තැන් | යෝජිත |
| 02 | Vision Sri Lanka Tourism රියැලිටි වැඩසටහනකි | යෝජිත |
| 03 | Breakers - ලොව ජය ගත් ශ්‍රී ලාංකික කාන්තාවන් | යෝජිත |
| 04 | Business Leaders - මෙරට ප්‍රමුඛ පෙළේ ව්‍යවසායකයින් පිළිබඳ වැඩසටහනකි. | යෝජිත |
| 05 | රූපවාහිනී මාධ්‍ය කව - Media Circles<br>පාසැල් මට්ටමින් මාධ්‍ය සමාජ පිහිටුවීම | යෝජිත |
| 06 | Sri lankan Model රියැලිටි වැඩසටහනකි | යෝජිත |
| 07 | The Musician සංගීත වැඩසටහන | යෝජිත |

## ඉදිරි සැළසුම්

කොවිඩ් වසංගත තත්ත්වය පහව ගිය පසුව නව ඉසව් වැඩසටහන් රැසක් ආරම්භ කිරීමට මේ වන විට සැළසුම් කර තිබේ. විශේෂයෙන් අනුග්‍රාහක ආයතන ඉලක්ක කර සෑම මසකම සුවිශේෂී ඉසව් වැඩසටහනක් බැගින් ක්‍රියාත්මක කිරීම ඉලක්කයයි. එමෙන්ම විශේෂ ජාතික සහ ජාත්‍යන්තර දින ඉලක්ක කර නව වැඩසටහන් පෙළක් සැළසුම් කිරීමට සහ නිෂ්පාදනය කිරීමට මේ වන විට ක්‍රියා මාර්ග ගෙන තිබේ. මෙම නව එළඹුමේ ඉලක්කය වන්නේ ආදායම් විවිධාංගීකරණයක් තුළින් තරගකාරී වෙළඳපළ තුළ කටයුතු කිරීමයි.

## වැඩසටහන් පරිපාලන ඒකකය

වැඩසටහන් පරිපාලන ඒකකයේ මූලික කාර්යය වනුයේ සංස්ථාවේ සියලුම නිෂ්පාදන අංශ හා ඒකක වලට අදාල වැඩසටහන් වල පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂා කර ඒ සඳහා නිෂ්පාදන අංක නිකුත් කිරීමේ සිට එම වැඩසටහන් නිෂ්පාදනය කර අවසන් වන තෙක් සියලුම පරිපාලන කාර්යයන් සහ වැඩසටහන් සඳහා අවශ්‍ය සේවා සැපයීම් සම්බන්ධීකරණයයි.

2020/01/01 – 2020/12/31 දක්වා වැඩසටහන් පරිපාලන ඒකකය මඟින් විවෘත කරන ලද ලිපිගොනු සංඛ්‍යාව **1184** කි.

මෙම ලිපිගොනු සංඛ්‍යාව පහත පරිදි අංශ අතර බෙදී ඇත.

| | |
|---|---|
| විවිධ වැඩසටහන් අංශය - | 399 |
| අධ්‍යාපන වැඩසටහන් අංශය - | 280 |
| ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශය - | 261 |
| අලෙවි අංශය - | 25 |
| අයි/නේත්‍රා නාලිකාව - | 219 |
| | -**1184** |

# අධ්‍යාපන වැඩසටහන් අංශය

## ළමා වැඩසටහන් ඒකකය

ළමා වැඩසටහන් ඒකකය ඒකක ප්‍රධානියෙක් යටතේ ක්‍රියාත්මක වන අතර එමගින් ලංකාවේ පරම්පරා ගණනාවක ළමයින් වෙත අධ්‍යාපනය ලබාදීමටත් ඔවුන්ගේ දැනුම හා රසාස්වාදය වැඩි දියුණු කිරීමටත් ළමා වැඩසටහන් ප්‍රමුඛ දායකත්වයක් ලබා දී ඇත.

ජාතික රූපවාහිනිය සමාරම්භයේ ශ්‍රී ලංකාවේ පැවති ප්‍රධානතම ජාතික විද්‍යුත් නාලිකාව එය වුවත් මෙ වන විට ලාභය අරමුණු කොටගත් පෞද්ගලික රූපවාහිනී නාලිකා විශාල ප්‍රමාණයක් හා නූතන සමාජ මාධ්‍යය විසින් බරපතල ලෙස ළමයා වෙළඳ භාණ්ඩයක් බවට පත් කොට ඇත.

එවන් ප්‍රශ්න ගත සමාජ වටපිටාවක් තුළ දහසකුත් බාධා මැඩගෙන ඊට ඉදුරාම වෙනස් මගක වූ අනාගත පුරවැසියා නිර්මාණය කිරීමේ අත්‍යන්ත වගකීමෙන් බැදි ජාතික කාර්යභාරයක නියැලී සිටින ජාතික රූපවාහිනී ළමා වැඩසටහන් ඒකකය  දරුවා යනු සුභාවිත සංස්කෘතික පවරාදීම් භාරගැනීමේ නොනිත් ආශාව පෙරදැරිව වැඩිහිටියන් දෙස බලා සිටින නොකිලිටි පුරවැසියෙක්ය යන්න සැබෑවක් කිරීමේ කටයුත්තේ අදද යෙදී සිටී.

## ළමා වැඩසටහන් ඒකකයේ තනතුරු නාම සහ සේවක සංඛ්‍යාව

| | |
|---|---|
| ඒකක ප්‍රධානී - | 01 |
| ජේ්‍යෂ්ඨ වැඩසටහන නිෂ්පාදක - | 02 |
| වැඩසටහන් නිෂ්පාදකවරු - | 02 |
| සහය නිෂ්පාදකවරු - | 03 |
| නිෂ්පාදන සහකාර - | 01 |
| කළමනාකරණ සහකාර - | 01 |
| කාර්යාල සහයක - | 01 |
| **සමස්ත සේවක සංඛ්‍යාව -** | **11** |

## ළමා වැඩසටහන් ඒකකය මගින් නිෂ්පාදනය කරන වැඩසටහන්

**පාට/පාට - ශනිදා හැන්දෑවේ වර්ණවත් ළමා විය**

ළමා සගරාමය වැඩසටහන / විනාඩි 60 වැඩසටහන් - 40
විකාශය වූ වේලාව - සෙනසුරාදා ප.ව. 5.00 සිට 6.00 දක්වා

**පුංචි අපිත් රසට උයමු**

ළමා ඉවුම් පිහුම් වැඩසටහන / විනාඩි 30 වැඩසටහන් - 34
විකාශය වූ වේලාව ප.ව.5.00 සිට ප.ව. 5.30 දක්වා

**2020 ජාතික ළමා දින වැඩසටහන**

(ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ජන කලා කේන්ද්‍රයේ සිට) පැය 02 සජීවී වැඩසටහන
විකාශය වූ වේලාව - 2020.10.01 පෙ.ව 9.00 සිට පෙ.ව.11.00 දක්වා

**ජාතික ළමා දින විශේෂ පාට පාට වැඩසටහන**

විශේෂ නත්තල් සජීවී ළමා වැඩසටහන - පැය 01
විකාශය වූ වේලාව 2020.12.26 ප.ව.5.00 සිට 6.00 දක්වා

**සවනක් රැස්**

පෝය දින ළමා වැඩසටහන / විනාඩි 30 වැඩසටහන් - 10
විකාශය වූ වේලාව පෝය දින ප.ව.4.00 සිට 4.30 දක්වා

**මුතුහර**

දීප ව්‍යාප්ත මුතුහර ළමා සමාජ ආශ්‍රිත ළමා සගරාමය වැඩසටහන
විනාඩි 30 වැඩසටහන් 40
විකාශය වූ වේලාව - අඟහරුවාදා ප.ව.5.00 සිට 6.00 දක්වා

(මෙම වැඩසටහන සඳහා විදේශගත මුතුහර ළමා සමාජවල ළමුන්ද දුරස්ථ තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වී ඔවුන්ගේ හැකියාවන් ඉදිරිපත් කළහ)

**පාට ගෑ මිතුදම**

**ඒ.බී.යූ. නාට්‍ය හුවමාරුව සඳහා ළමා ටෙලි නාට්‍යය**
විනාඩි 30 වැඩසටහන් 01
විකාශය වූ වේලාව 2020.10.01 දින ප.ව. 7.00 සිට 7.30 දක්වා

**අපේ පැය**

ළමා චිත්‍ර වැඩසටහන / විනාඩි 60 වැඩසටහන් - 40
විකාශය වූ වේලාව සිකුරාදා ප.ව. 5.00 සිට 6.00 දක්වා

**කොවිඩ් 19 ළමා ඇසින්**

විශේෂ සංවාදාත්මක වැඩසටහන
පැය 01 වැඩසටහන් 01
විකාශය වූ වේලාව 2020.05.30 දින ප.ව. 6.00 සිට 7.00 දක්වා

(මේ සඳහා සෞඛ්‍ය සහ අධ්‍යාපනික අංශවල මෙන්ම ජාතික ළමාරක්ෂක අධිකාරිය ඉහළම නිලධාරීන් සහභාගී වූ අතර නිෂ්පාදකවරයාගේ මැදිහත්වීම මත රු 400000 ක වෙළඳ අනුග්‍රාහකත්වයක්ද ලබා ගැණිනි.)

**විනාඩි 99**

කාලීන සමාජ දේශපාලන හා සංස්කෘතික සංවාදාත්මක වැඩසටහන
සජීවී සාකච්ඡාමය වැඩසටහන
පැය 02 වැඩසටහන් 08
විකාශය වූ වේලාව අඟහරුවාදා රාත්‍රී 10.30 සිට 12.00 දක්වා (ජනවාරි හා පෙබරවාරි මාස වල පමණි)

**ළමා පුවත්**

ළමා ප්‍රවෘත්තිමය වැඩසටහන / විනාඩි 15 වැඩසටහන් - 20
විකාශය වූ වේලාව ඉරිදා ප.ව.4.45 සිට 5.00 දක්වා

**දහම් පත්ම**

පෝය දින විශේෂ ළමා සංගීතමය හා දහම් කථිකාමය වැඩසටහන
විනාඩි 30 වැඩසටහන් - 04
විකාශය වූ වේලාව පෝය දින පෙ.ව. 11.00 සිට 12.00 දක්වා

**ශ්‍රී පොප් /ශ්‍රී ලාංකේය ජනප්‍රිය ගීතයේ ගෙවී ගිය සියවස 1917-2017**

විශේෂ සංගීත වැඩසටහන / පැය 03 වැඩසටහන් - 01
විකාශය වූ වේලාව 2020.02.04 දින ප.ව.1.30 සිට 4.30 දක්වා

මෙම විශේෂ වැඩසටහන නිෂ්පාදනය කරන ලද්දේ නිෂ්පාදකවරයාගේ යෝජනාවක් ජයග්‍රහණය කොට කොරියානු රූපවාහිනී විකාශ ආයතනය වෙතින් පිරිනමන ලද අමෙරිකානු ඩොලර් 22000 ක් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට ලබා ගැනිමෙනි.මෙය ජාතික තරුණ සේවා ශ්‍රවණාගාරයේදී සිදු කළ සජීවී පටිගත කිරිමක් ඇසුරින් සැකසිණි.

**කුරුල්ලන්ට ගී**

ළමා සංගීත වැඩසටහන් / විනාඩි 60 වැඩසටහන් - 32
විකාශය වූ වේලාව බදාදා ප.ව. 5.00 සිට 6.00 දක්වා
2020 වසරේ රයිගම් ටෙලි සම්මාන උළෙලේ හොදම ළමා වැඩසටහන සදහාද නිර්දේශ විය.

මීට අමතරව විශේෂයෙන් සදහන් කළ යුතුව ඇත්තේ 2020 මාර්තු මස සිට කොවිඩ් වසංගතය හේතුවෙන් රට වසා දැමීම නිසා ජාතික රූපවාහිනියේ ප්‍රථමයෙන්ම වට්ස්ඇප් තාක්ෂණය මගින් ළමුන් සම්බන්ධ කරගනිමින් කුරුල්ලන්ට ගී අපේ පැය මුතුහර හා පාටපාට යන වැඩසටහන් 04 නොකඩවාම නිෂ්පාදනය කොට නිවෙස්ගතව රැදීසිටි ළමුන්ගේ මානසික ආතතියට පිළියම් සෙවීමට අප ඒකකයේ නිෂ්පාදකවරුන් සමත් විය.වෙනත් කිසිදු නාලිකාවකට පෙර ළමා වැඩසටහන් සදහා දුර සිටින ළමුන්ටව තාක්ෂණය ඔස්සේ සම්බන්ධ කරගනිමින් එම කාර්යය වගකීමෙන් යුතුව ඉටුකරනු ලැබුවේ ජාතික රූපවාහිනී ළමා වැඩසටහන් ඒකකය බවද මෙහිදී සදහන් කළ යුතුව ඇත.

එසේම 2020 ජාතික ළමා දින උළෙලේදී ළමුන්ට ගෙදර සිට දුරකථනය මගින් මෙන්ම විවිධ මෘදුකාංග මගින් ජාතික රූපවාහිනිය සමග සම්බන්ධ වෙමින් 2020.10.03 දින දවස පුරා ළමා දින වැඩසටහන සමග සම්බන්ධ විමට ඉඩ ප්‍රස්ථාව සලසා දුන් අතර මැදිරිවල සිට සජීවීව මෙන්ම පටිගත කරන ලද විශේෂ ළමා වැඩසටහන් විශාල ප්‍රමාණයක් එහිදී විකාශය කෙරිණි.

එහිදී දුරස්ථ සහභාගී වන ළමුන් වෙත ත්‍යාග ලෙස රු.10000 ක් බැගින් වටිනා ඔවුන්ටත් බයිසිකල් 05 ක් නෙස්ලේ සමාගම වෙතින් ලබාදීමට හා රු.10000 ක් බැගින් වටිනා මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ පොත් කට්ටල 05 ක් මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලය වෙතින් ලබාදීමට ළමා වැඩසටහන් ඒකකය කටයුතු කළ අතර විෂන් කෙයාර් ආයතනයෙන් ත්‍යාග කැන්ඩොස් චොක්ලට් ත්‍යාග ඇතුළු වෙනත් ත්‍යාගද වාණිජ අංශයේ සහායෙන් ලබාදීමට අපට හැකියාව ලැබිණි.එසේම මේ සදහා සම්පූර්ණ පිටුවක ප්‍රචාරක දැන්වීමක්ද 2020.10.02 දිනපතා ලංකාදීප පුවත්පතේ පළකෙරිණි.

## වාර්තා හා විචිත්‍රාංග ඒකකය

මෙම ඒකකය ආරම්භයේ සිටම අධ්‍යාපන අංශයේ ස්ථාපිතව පැවති ඒකකයකි.ජාත්‍යන්තරව සලකා බැලුව ද වාර්තා වැඩසටහන් ඒකකයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ.වාර්තා වැඩසටහන්, සගරාමය වැඩසටහන්, සංචාරක වාර්තා වැඩසටහන්, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්, සංස්කෘතිමය වැදගත්කමක් සහිත සජීව වැඩසටහන්, රජයේ ආයතන සඳහා වාර්තා වැඩසටහන්, විවිධ විචිත්‍රාංග මෙම ඒකකය මගින් නිෂ්පාදනය කෙරේ. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට මුල්ම ජාත්‍යන්තර සම්මානය ගෙන දෙනු ලැබුවේද වාර්තා හා විචිත්‍රාංග ඒකකය විසිනි. ඒ 1983 වසරේදී සිසිර සුරවීර නිෂ්පාදනය කළ කළු දියමන්ති වාර්තා වැඩසටහන වෙනුවෙනි. එදා පටන් අද දක්වා දේශීය විදේශීය සම්මාන උළෙල වල් වලදී වාර්තා වැඩසටහන් සඳහා සම්මාන රැසක් වාර්තා ඒකකයේ නිෂ්පාදකවරු දිනාගන්නා ලදී. රූපවාහිනී වැඩසටහන් අතර රටේ ජනප්‍රිය වැඩසටහන් රාශියක් නිර්මාණය කරන ලද්දේ මෙම ඒකකයේ නිෂ්පාදකවරු විසිනි. උරුමය, රසකලස, නවයයි පහ, සැරිසර,අරුම පුදුම රෝද හතර,ධාරා, ආනන්ද රාත්‍රී ඒ අතර ප්‍රමුඛ වැඩසටහන් වේ. මෙයට අමතරව ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණ වල දේශපාලන අපේක්ෂකයන්ගේ කතා පටිගත කර විකාශය කරන්නේද මෙම ඒකකය විසිනි.

සහකාර අධ්‍යක්ෂවරයෙක් නැතහොත් විධායක නිෂ්පාදකයෙක් යටතේ පරිපාලිත ඒකකය ජ්‍යෙෂ්ඨ නිෂ්පාදකවරු දෙදෙනෙක් ද නිෂ්පාදකවරු 06 දෙනෙකුද නිෂ්පාදන සහකාරවරු දෙදෙනෙක්ද ලිපිකාරිනියක් හා කාර්යාල සහයකයෙකුගෙන්ද සමන්විතය.

ඒකකයේ විධායක නිෂ්පාදකවරයාගේ සිට නිෂ්පාදන සහකාරවරු දෙදෙනාද ඇතුළුව සියලු නිෂ්පාදකවරු සතිපතා විකාශය වන ධාරා වාර්තා සමීරය සඳහා වැඩසටහන් නිෂ්පාදනය කළ යුතු වේ. මීට අමතරව ඉරිදා දින වල විකාශය වන පැය භාගයක ආයු බෝ වේවා සෞඛ්‍ය සගරාමය වැඩසටහන නිෂ්පාදනය කරනු ලබයි.මෙම ඒකකය මගින් අරුම පුදුම රෝද හතර සගරාමය වැඩසටහන නිෂ්පාදනය කරනු ලබන අතර එය සෙනසුරාදා රාත්‍රී 7.00 ට විකාශය වන පැය භාගයක වැඩසටහනකි. සුදසුන හා සුපුවත නමින් විකාශය වන කතෝලික හා ක්‍රිස්තියානි වැඩසටහන මසකට වරක් අවසන් ඉරිදා සවස 6.00 ට විකාශය වෙයි. ඉරිදා ආයුබෝවන් වැඩසටහන් දෙකක් නිෂ්පාදනය කරනු ලබන අතර අනුග්‍රාහක ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක්ද නිෂ්පාදනය කරනු ලබයි.සතියේ සිකුරාදා නුග සෙවන වැඩසටහන නිෂ්පාදනය කරනු ලබන්නේද මෙම ඒකකයයි. කොවිඩ් වසංගත තත්ත්වය මත ආරම්භ කරන ලද ගුරු ගෙදර අධ්‍යාපන වැඩසටහන් විකාශය අධීක්ෂණය කරනු ලබන්නේද වාර්තා වැඩසටහන් ඒකකයයි. එය පැය 16 ක් පුරා චැනල් අයි සහ නේත්‍රා නාලිකා ඔස්සේ විකාශය වේ.

ජනාධිපතිතුමා හා අගමැතිතුමා සම්බන්ධ වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කරනු ලබන්නේද වාර්තා වැඩසටහන් ඒකකය මගිනි.

2020 වසර ආරම්භයත් සමග රට තුල පැතිරගිය කොවිඩ් වසංගත තත්වය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ කෙටි ප්‍රචාරක පට රාශියක් නිෂ්පාදනය කරන ලදී. එමෙන්ම අවශ්‍යතාවය අනුව වැඩසටහන් රැසක් නිෂ්පාදනය කරන ලදී.මේ කාලය තුල පැවති ක්‍රියාකාරී ඒකකයක් ලෙස දැක්විය හැකිය.

සංස්ථාවේ මූල්‍ය තත්වය යහපත් කරගැනීමේ අරමුණින් ඒකකයේ නිෂ්පාදකවරු විසින් විවිධ රාජ්‍ය ආයතන වෙත ගොස් වැඩසටහන් නිෂ්පාදනය සඳහා ව්‍යාපෘති ඉදිරිපත් කර සාර්ථක ප්‍රතිඵල අත්කරගන්නා ලදී. පරිසර අමාත්‍යාංශයෙන් හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මෙලෙස මූල්‍ය ධනයක් උපයා දුන් අතර ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ද මූල්‍ය ධනයක් උපයා දුනි. ඉතිහාසයේ ප්‍රථම වතාවට මහමැතිවරණයේ දේශපාලන කථා විකාශය සඳහා මැතිවරණ කොමිසමෙන් මුදල් ලබා ගැනීමට හැකි වූයේ සභාපතිතුමාගේත් මෙම ඒකකයේත් උත්සහය නිසා වෙනි.

## අධ්‍යාපන සේවා ඒකකය

අධ්‍යාපන අංශයේ ඒකක අතුරින් එක් ප්‍රධාන ඒකකයක් වනුයේ අධ්‍යාපන සේවා ඒකකයයි.ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ආරම්භයේ සිට අධ්‍යාපන සේවා ඒකකයට හිමි වූයේ සුවිශේෂී ස්ථානයකි.ශ්‍රී ලාංකික දූ දරුවන්ගේ අධ්‍යාපනයට මාධ්‍ය තුළින් අත්වැලක් සැපයීම පිණිස විධිමත් හා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කිරීම අධ්‍යාපන වැඩසටහන් ඒකකයේ මුඛ්‍ය පරමාර්ථයයි.එම අරමුණ ඉටු කරගැනීම පිණිස රූපවාහිනී සංස්ථාව ආරම්භයේ සිට 2020 වසර දක්වා දශක 4කට ආසන්න කාලයක් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ අධ්‍යාපන වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කරමින් ශ්‍රී ලාංකික දූ දරුවන්ගේ නැණ පහන් දැල්වීමට සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් සිටී.

2000 වර්ෂයේ සිට විධිමත් වැඩසටහන්වලට අමතරව නොවිධිමත් හා සහරාමය සජීවි වැඩසටහන් මෙන්ම ආයතනයේ මූල්‍ය තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහන්වලින් දායකත්වය සැපයීම මෙන්ම දුෂ්කර පළාත්වල දූ දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක් සැපයීම සඳහා අධ්‍යාපන සත්කාරක වැඩසටහන් හා සම්මන්ත්‍රණ මාලා පැවැත්වීමද අධ්‍යාපන ඒකකය මඟින් මේ දක්වා කෙරෙන සුවිශේෂී කාර්යභාරයන්ගෙන් සමහරකි.

අධ්‍යාපන ඒකකය මඟින් නිෂ්පාදනය කළ වැඩසටහන් ජාත්‍යන්තර සම්මානයට පවා පාත්‍ර වී තිබීම විශේෂත්වයකි. මුලින්ම අධ්‍යාපන ඒකකයේ ජපන් ජාත්‍යන්තර සම්මාන ලබාගත් වැඩසටහන් වනුයේ නිරංජලා වීරක්කොඩි නිෂ්පාදනය කළ අක්ෂර පුරාණය, චන්ද්‍රා ජයතිලක නිෂ්පාදනය කළ අන්තර් උදම් කලාපීය විමසුමක්,අ.පො.ස. ( උ.පෙ.) වැඩසටහනයි. උපතිස්ස පී නිශ්ශංක වන වැඳුණු මං (The best television TV programme on protection of indigenous minorities) – 2015 (AIBD) හොඳම සම්මානය හිමි කර ගැනීම.

ඉන් පසුව 2020 වර්ෂය දක්වා දේශීය සම්මාන රැසක් අත්කර ගැනිමට අධ්‍යාපන ඒකකයට හැකිවිය.

මෙම ඒකකය නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයෙකුගෙන් යටතේ පවතින අතර ජ්‍යේ. නිෂ්පාදකවරු 3 කි. නිෂ්පාදකවරු 5 කි. සහය නිෂ්පාදකවරු 1කි. නිෂ්පාදන සහකාරවරු 2 කි. කළමනාකරණ සහකාරවරු 1 අයෙකි.

## ඒකකය විසින් 2020 වර්ෂය තුල සිදු කල සමාජ සත්කාරක වැඩසටහන්

2020 වර්ෂයේ කොරෝනා වසංගතය හේතුවෙන් මුළු දිවයිනටම ඇඳිරි නීතිය ක්‍රියාත්මකව පැවති මාසවල පාසැල් පද්ධතියම අකර්මන්‍ය වූ බැවින් අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව දූ දරුවන් වෙනුවෙන් EDU.COM සජීවී අධ්‍යාපනික වැඩසටහන් මාලාව ක්‍රියාත්මක කිරිම.

විශේෂයෙන් අ.පො.ස. (උ.පෙ.) සාමාන්‍ය පෙල හා ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් සවස 1.00 සිට සවස 3.00 දක්වා පුරා පැය 3 ක් සතියේ දින පහ තුළ නිෂ්පාදනය කර විකාශය කිරීම.

විශේෂයෙන් නැණ මිහිර වැඩසටහන් තුළින් ශිෂ්‍යත්ව විභාගය ඉලක්ක කරගත් ප්‍රශ්නෝත්තර වැඩසටහන තුළින් සාකච්ඡා කර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දූ දරුවන් වෙනුවෙන් දිනපතා සජීවීව ඉදිරිපත් කිරිම.

කොරෝනා වසංගතය අතරතුර බහුතරය ප්‍රේක්ෂක ජනතාව තම නිවසටම වි ගත කරන කාලය තම ගෙවත්තේ වස විසෙන් තොර එළවළු , පළතුරු වගාවනට යොමු කිරීම, සඳහා රූපවාහිනි රිවිදින අරුණැල්ල ගෙවතු වගා වැඩසටහන් නොකඩවා නිෂ්පාදනය කර විකාශය කිරිම. තවත් සුවිශේෂී සමාජ සත්කාරක වැඩසටහන් මාලාවකි. මෙම වැඩසටහන් මාලාව ඉරිදා දින පෙ.ව. 7.30 – 8.00 දක්වා සතිපතා විකාශය කෙරේ.

<u>**අධ්‍යාපන ඒකකය විසින් ඉටු කළ ව්‍යාපෘති**</u>

සංස්ථාව නගාසිටුවීම පිණිස එහි මූල්‍ය තත්ත්වය ඉහළ නැංවීම හා සමාජ සුබ සාධන වැඩසටහන් රැසක් අධ්‍යාපන ඒකකය විසින් 2020 වර්ෂය දක්වාම ක්‍රියාත්මක කර ඇත.

2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර 2020 වර්ෂය වනවිට දූ දරුවන්,ගුරුභවතුන් හා දෙමාපියන් අතර ජනප්‍රිය පුංචි අපේ නැණ මිහිර ප්‍රශ්නෝත්තර සංග්‍රහය ඉන් ප්‍රධාන ස්ථානයක් ගනී. 2020 වසරේදී මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රශ්නෝත්තර සංග්‍රහය අලෙවි කිරිමෙන් රුපියල් මිලියන 12 ක ශුද්ධ මූල්‍ය ආදායමක් ආයතනයට උපයාගන්නා ලදී.

එම ප්‍රශ්නෝත්තර සංග්‍රහය අලෙවි කිරීම මඟින් ශිෂ්‍යත්වයට පෙනී සිටින දූ දරුවන්ගේ විභාගයට අත්වැලක් සැපයීම මෙන්ම රූපවාහිනී සංස්ථාවේ අධ්‍යාපන වැඩසටහන් ජනතාව අතර ප්‍රචලිත කිරීම මඟින් සංස්ථාවේ අභිවෘද්ධියට එය මහඟු පිටිවහලක් වී ඇත.

## ඒකකයේ රාජකාරී පහසු කරගැනීම සඳහා ගනු ලැබූ තීරණ හා මූල්‍ය සහ වෙනත් උපකරණ මිලදී ගැනීම,පරිගණක මෘදුකාංග හා මානව සම්පත්

අධ්‍යාපන ඒකකයේ වැඩසටහන්වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම පිණිස අධ්‍යාපන ඒකකය විසින් සජීවීව නිෂ්පාදනය කළ අධ්‍යාපනික සහරාමය වැඩසටහන් මාලාව සඳහා Smart Tv යන්ත්‍ර දෙකක් මැදිරිවලට ලබාගැනිමට හැකිවිය. එමගින් නිෂ්පාදකවරුන් හට ඉතා ඉහළ ගුණාත්මක අධ්‍යාපන වැඩසටහන් ප්‍රේක්ෂකයා අතරට ගෙන යාමට හැකිවීම විශේෂත්වයකි.

මෙම Smart Tv උපකරණ හා පරිගණක (Lap Top) භාවිතයෙන් විශේෂයෙන් නැණ මිහිර ශිෂ්‍යත්ව වැඩසටහන් මාලාව හා Knowledge 1 st වැඩසටහන් මාලාව මගින්, ඉතා ඉහළ ගුණාත්මක වැඩසටහන් දූ දරුවන් අතරට ගෙන යාමට හැකි විය.

විශේෂයෙන් මැදිරි අංක 01 Knowledge 1 st සජීවි වැඩසටහන් මාලාව සඳහා අවම පිරිවැයක් හා සම්පත් දායකයින් සහභාගී කර ගැනීම මගින් සංස්කරණ කටයුතු සඳහා වැය වන පිරිවැය ඉතිරි කිරීම.

## ඒකකය විසින් නිෂ්පාදනය කරන වැඩසටහන්

| | | |
|---|---|---|
| රිවිදින අරුණැල්ල | - | (ඉරිදා පෙ.ව7.30 සිට 8.00 දක්වා) , |
| Knowledge 1 st | - | (අඟහරුවාදා ප.ව.3.00-5.00 දක්වා) |
| ජාතික පාසල (විද්‍යාව) | - | පෙ.ව.5.00 – 6.00 දක්වා |
| ජාතික පාසල(ඉතිහාසය) | - | පෙ.ව.5.00-6.00 |
| Knowledge 1 st | - | (සඳුදා) ප.ව.3.00-5.00 |
| ජාතික පාසල(ගණිතය) | - | පෙ.ව.5.00-6.00 |
| Knowledge 1 st | - | (බ්‍රහස්පතින්දා) ප.ව.3.00-5.00 |
| සුක්කානම | - | (සෙනසුරාදා ප.ව.4.00-4.30) |
| රස මොහොත | - | (සෙනසුරාදා ප.ව.3.00-4.00) |
| Stop Corona, නුග සෙවණ | - | (සඳුදා) පෙ.ව.8.00-11.00 දක්වා |
| ජාතික පාසල(සිංහල) | - | පෙ.ව.5.00-6.00 දක්වා |
| රූපාවලෝකනය | - | (සෙනසුරාදා 12.00-12.30) |

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිට නිෂ්පාදනය කළ සේද හර සර වැඩසටහන් මාලාව(විනාඩි 15)

| | | |
|---|---|---|
| රූපාවලෝකනය | - | (ඉරිදා ප.ව.3.30-4.00) |
| EDU.COM (අ.පො.ස සා.පෙ/උ.පෙ) | - | ප.ව. 1.00-3.00/ Vision Mission |
| ජාතික පාසල - ඉංග්‍රීසි-අ.පො.ස (සා.පෙ) | - | (බදාදා)-පෙ.ව 5.00-6.00 දක්වා |

## ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශය

සෙසු රූපවාහිනි නාලිකා හා සලකා බලනවිට, වර්තමාන ජන සමාජයේ ජාතික රූපවාහිනි ප්‍රවෘත්ති පිළිබඳව ග්‍රාහකයා තබා ඇති විශ්වසනීයත්වය තවදුරටත් තහවුරු කරගනිමින් සත්‍ය සහ නිවැරදි තොරතුරු අප්‍රමාදව ග්‍රාහකයා වෙත ලබාදීම අපගේ මුඛ්‍ය පරමාර්ථය වේ. විශේෂයෙන්ම, වර්තමාන ජන සමාජය තුළ විවිධ වානිජ අරමුණු පදනම් කරගනිමින්, පෞද්ගලික නාලිකා බිහිවුවද, නිවැරදි, සත්‍ය පුවත් ග්‍රාහක ජනතාව වෙත ලබාදීමේ ජාතික වගකීම, නිරන්තරයෙන්ම ජාතික රූපවාහිනිය ඉටුකරමින් සිටියි.

ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශය ප්‍රධාන වශයෙන් තවත් ඒකක දෙකකින් සමන්විත වේ.

- කාලීන සිදුවීම් ඒකකය
- ප්‍රවෘත්ති කැමරා ඒකකය

ඊට අමතරව ප්‍රවෘත්ති අංශයෙහි රාජකාරි ස්වභාවය අනුව තවත් ඒකක කිහිපයකින් සමන්විත වේ

- දෙමළ ප්‍රවෘත්ති ඒකකය
- ඉංග්‍රීසි ප්‍රවෘත්ති ඒකකය
- ප්‍රවෘත්ති මාධ්‍යරූප ඒකකය
- ප්‍රවෘත්ති වෙබ් ඒකකය

### ප්‍රවෘත්ති අංශයේ ඒකක මගින් කෙරෙන කාර්යයන්

- **<u>කාලීන සිදුවීම් ඒකකය</u>**

  ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ පුරෝගාමී කාර්යභාරයක නිරතවන ඒකකයක් ලෙස කාලීන සිදුවීම් ඒකකය හඳුන්වාදිය හැක. සිංහල, දෙමළ ද්විභාෂා කේන්ද්‍ර කොටගත් වැඩසටහන් සමුදායකට ඉන් පණ පොවයි. දෛනිකව පැමිණෙන පටිගත හා සජීව වැඩසටහන් රාශියක් ඔස්සේ දිගු ගුවන් කාලයක් අර්ථාන්විතව ආවරණය කිරීමට කාලීන සිදුවීම් ඒකකය සමත්කම් දක්වයි. සමාජ සංසිද්ධි හා මානව සංවේදනා මෙන්ම නව සමාජ අභිප්‍රේරණයන් උදෙසා කාලීන සිදුවීම් ඒකකයේ වැඩසටහන් තුළින් සුවහසක් ප්‍රේක්ෂක ජනතාවට ආමන්ත්‍රණය කරයි.

එම ඒකකයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කාලීන සිදුවීම්) යටතේ ජ්‍යෙෂ්ඨ නිෂ්පාදිකාවක් (01), නිෂ්පාදකවරු දෙදෙනෙක් (02), සහාය නිෂ්පාදකවරු හයදෙනෙක් (06), කළමනාකරණ සහකාරවරියක් (01) සහ කාර්යාල කාර්ය සහායකයෙකු (01) සේවය කරයි.

## කාලීන සිදුවීම් ඒකකය මගින් සිදුකරන ලද සුවිශේෂී කාර්යයන්

- ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන පාර්ලිමේන්තුවේ සැසිවාරයන් ආරම්භ කිරීම සජීව විකාශය
- ජනාධිපතිතුමා, අගමැතිතුමා සහභාගි වන නිදහස් සැමරුම් උළෙල සජීව විකාශය
- ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් මැටරඹ හේමරතන නාහිමි අක්තපත්‍ර ප්‍රදානෝත්සවය සජීව විකාශය
- හිසතෙල් ගෑමේ රාජ්‍ය මහෝත්සවය, අලුත් සහල් මංගල්‍ය සජීව විකාශය
- ජනාධිපතිතුමාගේ සහභාගිත්වයෙන් මාතර - හම්බන්තොට අධිවේගී මාර්ගය විවෘත කිරීම සජීව විකාශය
- අග්‍රාමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් පැවති හිටපු අගරදගුරු නිකලස් මාකස් පියතුමන්ගේ රාජ්‍ය ගෞරව සහිත ආදාහනය සජීව විකාශය
- අරලියගහ මන්දිරයේ පැවති රාජ්‍ය වෙසක් උත්සවය සජීව විකාශය
- ජාතික රණවිරු දින සජීව විකාශය බත්තරමුල්ල රණවිරු ස්මාරකය අසල සිට විකාශය කිරීම
- අරුමුගන් තොන්ඩමන් මැතිතුමාගේ අදාහන උත්සවය සජීව විකාශය
- රාජ්‍ය නායකයින් පැමිණීමේ උත්සව, පාර්ලිමේන්තුවේ විශේෂ වැඩසටහන් ඇතුළු සියලුම ජාතික උත්සව අවස්ථා සජීව ආවරණය කිරීම
- සෑම අඟහරුවාදා දිනකම සජීව විකාශය කරන කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුව
- කොවිඩ් වැනි වසංගත හමුවේ රජය ගන්නා සියලුම තීන්දු පිළිබඳ විශේෂ වැඩසටහන් රැසක් කාලීන සිදුවීම් ඒකකය මගින් විකාශය කරයි
- රජයේ සංවර්ධන කටයුතු අළලා සැකසෙන වාර්තා වැඩසටහන් විකාශය කරයි.

## කාලීන සිදුවීම් ඒකකය විසින් නිෂ්පාදනය කරනු ලබන වැඩසටහන් විස්තරය

- ආයුබෝවන් සුබ දවසක් (පෙ.ව. 6.30 – 7.00) පුවත්පත් විශ්ලේෂණය
- ආයුබෝවන් සුබ දවසක් (පෙ.ව. 7.00 – 8.00) දේශපාලන, ආර්ථික හා සමාජීය සාකච්ඡාව (සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව රජයේ කැබිනට් / රාජ්‍ය අමාත්‍යාංශ හා ආයතන හරහා ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව ජනතාව දැනුවත් කෙරේ)
- "කරට කර" වැඩසටහන - දේශපාලන සංවාදය (සෑම බදාදා දිනකම රාත්‍රී 10.30 )
- "මහජන දිනය" - දේශපාලන කථිකාව (සෑම සිකුරාදා දිනකම රාත්‍රී 10.30)
- ශනිදා ආයුබෝවන් - ශනිදා සාර සංග්‍රහය (සෙනසුරාදා උදෑසන 8.30)
- සොබාධාරා - ගවේෂණාත්මක කාලීන පරිසරික වැඩසටහන (සිකුරාදා රාත්‍රී 9.00)
- ආයුබෝවේවා - සෞඛ්‍ය සඟරාමය වැඩසටහන (ඉරිදා සවස 3.00)

- රටා - මිනිස් ජීවිත හා බැඳුනු සඟරාමය වැඩසටහන (සෙනසුරාදා උදෑසන 11.30)

  - 2020 වසරේ රයිගම් ටෙලි සම්මාන උළෙලේ විශිෂ්ටතම වාර්තා වැඩසටහන සඳහා "රටා" වැඩසටහන නිර්දේශ විය.
  - සංස්ථාවේ ප්‍රවර්ධනය සඳහා "රූ මංසල" නමින් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, එහි ප්‍රමුඛ කාර්යභාරයක් කාලීන සිදුවීම් ඒකකය විසින් සිදුකරන ලදී.
  - ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අළලා වැඩසටහන් මාලාවක් විකාශය කරමින් ඒ හරහා ආයතනයට රුපියල් මිලියන 5 ක පමණ ආදායමක් උපයාදෙන ලදී.

## කා.සි. දෙමළ ඒකකය

කාලීන සිදුවීම් ඒකකය යටතේ කා.සි. දෙමළ ඒකකය පවත්වාගෙන යයි. එම අංශය මගින් ද කාලීන වැඩසටහන් සහ දේශපාලනික වැඩසටහන් නිෂ්පාදනය කරයි. මීට අමතරව කාලීන වශයෙන් වැදගත් වන දෙමළ භාෂාවෙන් නිෂ්පාදනය කරනු ලබන විශේෂ වැඩසටහන් හා ගරු ජනාධිපතිතුමාගේ විදේශ සංචාර සහ ජාතික අවස්ථා සම්බන්ධ තොරතුරු දෙමළ භාෂාවෙන් නිෂ්පාදනය කරනු ලබයි.

මෙම ඒකකයෙහි දෙමළ සහාය නිෂ්පාදකවරුන් දෙදෙනෙකු (02) සේවය කරයි.

**කාලීන සිදුවීම් ඒකකයේ දෙමළ වැඩසටහන් මගින් රූපවාහිනි නේත්‍රා නාලිකාව සඳහා වැඩසටහන් කිහිපයක් ද නිෂ්පාදනය සිදුකරයි.**

- NaledugalilIndru(පෙ.ව. 7.30 සිට 8.00 දක්වා දිනපතා පුවත්පත් වැඩසටහන්)
- KandathumKettathum(සිකුරාදා දින පස්වරු 6.00 – 6.30 දක්වා)
- VidyalaiNokkiරජයේ සංවර්ධන තිරසාර දැක්ම
- Ulagavalamදේශපාලන කථිකාව (අඟහරුවාදා දින පස්වරු 6.00-6.30 දක්වා)
- Sandurangamදේශපාලන වැඩසටහන (සෙනසුරාදා දින පස්වරු 6.00 – 7.00 දක්වා)
- VilayattuManjariසෙනසුරාදා දින පෙ.ව. 11.30 – 12.00 දක්වා)

ශ්‍රමික භාවිතාව ඉක්මවා ගිය නිර්මාණ ශක්‍යතාවකට පණ දෙන දැවැන්ත ව්‍යාපෘතිය සංවිධිතයක් උදෙසා කාලීන සිදුවීම් ඒකකය දිගුකාලීන සූදානමක පසුවේ. එහි ප්‍රතිඵලය මේතාක් රූප, ශබ්ද ලෙස ප්‍රේක්ෂකයා වෙත ප්‍රතිපූර්ණය කළ අයුරටම අනාගතයේදී ද එකී මෙහෙවරට සූදානම්ය.

## ප්‍රවෘත්ති කැමරා ඒකකය

ඒකක ප්‍රධානී, උපකරණ මෙහෙයුම් නිලධාරී සමග කැමරා ශිල්පීන් 14 ක් සහ ඊ.එන්. ජී. සහායකයින් 10 දෙනෙකුගෙන් සමන්විත මෙම ඒකකය මගින් දෙස් විදෙස් ප්‍රවෘත්ති ආවරණ, ශ්‍රී ලංකාවේ පවතින දෙස් විදෙස් රාජ්‍ය නායකයින් සහභාගි වන නිල රාජ්‍ය උත්සව අවස්ථා, ශ්‍රී ලංකාවේ පවතින විදෙස් නියෝජිත සමුළු, අතිගරු ජනාධිපතිතුමාගේ සහ අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රවෘත්ති ආවරණ, මැතිවරණ ප්‍රවෘත්ති ආවරණ, ස්වභාවික ආපදා ඇතුළු සියලුම ප්‍රවෘත්ති ආවරණ ඉටුකර ඇත. කොවිඩ් 19 හමුවේ දෛනික රාජකාරිවල නිරත වෙමින් කැපවීමෙන් රාජකාරි කරනු ලැබීය.

## දෙමළ ප්‍රවෘත්ති ඒකකය

ඒකක ප්‍රධානී, ප්‍රවෘත්ති සංස්කාරකවරයෙකු සහ සහය නිෂ්පාදකවරුන් 02 කු සහ නිෂ්පාදන සහකාරවරු දෙදෙනෙකුගෙන් මෙම ඒකකය සමන්විත වේ. මෙම ඒකකය මගින් දෙමළ ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශ 02ක් හා පැයෙන් පැය ප්‍රවෘත්ති ප්‍රකාශ 04 ක් දෛනිකව විකාශය කෙරේ. මෙම ඒකකය වෙත ප්‍රාදේශීය වාර්තාකරුවන් හරහා ලැබෙන ප්‍රවෘත්ති මෙන්ම නිෂ්පාදවරුන් විසින් සිදුකරනු ලබන ප්‍රවෘත්ති අංග ද ඇතුළත් කොට සාර්ථක අන්දමින් දෙමළ ප්‍රවෘත්ති ප්‍රකාශය රැගෙන යනු ලබයි. සිංහල ප්‍රවෘත්ති ප්‍රකාශය සඳහා ද අදාළ ප්‍රවෘත්ති අංග ලබාදෙන අතර, දෙමළ ප්‍රවෘත්ති ප්‍රකාශ සඳහා  දිනකට පැය 1 ½ ක පමණ ගුවන් කාලයක් වෙන් කෙරේ. උද්ගතවූ කොරෝනා අවදානම හමුවේ සහ මැතිවරණ කාලසීමාව තුළ ඉතා අවම සේවක පිරිසක් මගින් අලුයම සිට රාත්‍රී දක්වාම කාලය කැපකරමින් ඉතා සාර්ථක අන්දමින් රාජකාරි කරනු ලැබීය.

## ඉංග්‍රීසි ප්‍රවෘත්ති ඒකකය

මෙම ඒකකය සහකාර අධ්‍යක්ෂවරයෙකු සහ සහය නිෂ්පාදකවරුන් 03 ක් සහ නිෂ්පාදන සහකාර දෙදෙනෙකුගෙන් සමන්විතයි.  නිරන්තරයෙන් සිංහල ප්‍රවෘත්ති ප්‍රකාශ සඳහා විදෙස් පුවත් හා දර්ශන ලබාදීම සිදුකිරීම මෙම ඒකකයේ කාර්යභාරයයි. එමෙන්ම, කොරෝනා වසංගතය උද්ගත වූ දින සිට මේ වනතෙක්ම එහි තතු දෛනිකව ප්‍රවෘත්ති ප්‍රකාශ හරහා ජනතාව දැනුවත් කරනු ලබයි. ඒසියා විෂන් ප්‍රවෘත්ති හුවමාරු ඒකකයට රට තුළ විශේෂිත වූ ප්‍රවෘත්ති මුදාහැරීම මෙම ඒකකයේ තවත් එක් සුවිශේෂී කාර්යභාරයකි. මීට අමතරව, සෑම දිනකම උදෑසන 6.00 සිට 6.25 දක්වා කාලීන හා විදෙස් ප්‍රවෘත්ති වෙනුවෙන් "සිව්දෙස" වැඩසටහනේ නිෂ්පාදන කාර්යයන් ද සිදුකරනු ලබයි. 2020 වර්ෂයේ මහමැතිවරණය පිළිබඳව අන්තර්ජාතික වාර්තාකරණය සම්බන්යෙන් හොඳම සැලසුම්ගත ප්‍රවෘත්ති වාර්තාකරණයට හිමි සම්මානය සඳහා නිර්දේශ විය. ආසියාවේ රටවල් 35 ක් අතරින් රටවල් තුනක් පමණක් මීට නිර්දේශ වීම සුවිශේෂිත්වයකි.

## ප්‍රවෘත්ති මාධ්‍යරූප ඒකකය

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන ත්‍රෛභාෂා ප්‍රවෘත්ති ප්‍රකාශයන්හි, සිව්දෙස විදෙස් විත්ති විචාරක වැඩසටහනෙහි මෙන්ම කාලීන සිදුවීම් ඒකකයේ වැඩසටහන්හි මාධ්‍යරූප සංස්කරණය ද මෙම ඒකකය මගින් සිදුකරනු ලබයි. මොවුන් විවිධ සේවාමුර අනුව අලුයම සිට රාත්‍රී 10 තෙක් ම මෙකී රාජකාරියේ නියැලේ. කාලීන සිදුවීම් ඒකකයේ කරට කර වැනි සජීව වැඩසටහන් විකාශය කිරීමේදී රාත්‍රී 12.30 පමණ වන තෙක්ම සේවයේ යෙදීම විශේෂත්වයකි. ආයතනයෙන් බැහැරව දිවයිනේ සෑම ස්ථානයකම සිට දර්ශන FTP තාක්ෂණය ඔස්සේ ලබාගැනීම සඳහා මාධ්‍යරූප ශිල්පීන් ප්‍රවෘත්ති ආවරණ කටයුතු සඳහා ද යොදවනු ලැබේ. මෙම ඒකකය නිලධාරීන් 07 දෙනෙකුගෙන් සමන්විත වේ.

## ප්‍රවෘත්ති වෙබ් ඒකකය

මෙම ඒකකය නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. ප්‍රවෘත්ති අංශයේ නිල වෙබ් අඩවිය,YouTube, Facebook පිටු යාවත්කාලීන කිරීම සහ SMS කෙටි පණිවුඩ සේවාව පවත්වාගෙන යාම මෙම ඒකකයෙහි කාර්යභාරයයි.

- **ඒකකයේ තනතුරු නාම සහ සේවක සංඛ්‍යාව**
  - ✓ අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම්) වැ.බ.
  - ✓ ප්‍රධාන ප්‍රවෘත්ති සංස්කාරක
  - ✓ නි.අ. (කාලීන සිදුවීම්)
  - ✓ නි.අ. (ප්‍රාදේශීය ප්‍රවෘත්ති)
  - ✓ ස.අ. (විදෙස් ප්‍රවෘත්ති)
  - ✓ ඒකක ප්‍රධානී (ප්‍රවෘත්ති කැමරා)
  - ✓ පරිපාලන නිලධාරි
  - ✓ ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති සංස්කාරක / ප්‍රවෘත්ති සංස්කාරක
  - ✓ නිෂ්පාදක /සහය නිෂ්පාදක / නිෂ්පාදන සහකාර
  - ✓ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර / කළමනාකරණ සහකාර
  - ✓ මාධ්‍යරූප හා සජීවිකරණ ශිල්පී
  - ✓ කාර්යාල කාර්ය සහායක / ඊ.එන්.ජී. සහායක

2020 වර්ෂයේ ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශයේ සමස්ත සේවක සංඛ්‍යාව 103 කි.

- ප්‍රවෘත්ති ඒකකය - 64
- කාලීන සිදුවීම් ඒකකය - 14
- ප්‍රවෘත්ති කැමරා ඒකකය - 25

## අංශය මගින් කෙරෙන සුවිශේෂී කාර්යයන්

2020 වසරේ කොරෝනා වසංගතයේ දැඩි බලපෑමත් සමග රාජකාරි කිරීමට සිදුවූ අතර, එහිදී විද්‍යාත්මකව නිවැරදිම තොරතුරු වාර්තා කෙරිණි. ජනතාව තුළ සෘණාත්මක ආකල්ප ඇති නොවන අන්දමින් රජය විසින් ලබාදෙන ලද තොරතුරු හා උපදෙස් පරිදි මිත්‍යාමතවලින් බැහැරව ප්‍රවෘත්ති වාර්තාකරණය සාර්ථකව සිදුකෙරිණි.

එමෙන්ම, මහ මැතිවරණ විකාශන කටයුතු තුළ විශාල කාර්යභාරයක් ප්‍රවෘත්ති අංශය වෙත පැවරිණි. කොරෝනා උවදුර සමග වුවද ප්‍රවෘත්ති අංශය, සාමාන්‍ය පරිදිම මෙතෙක් රාජකාරි සිදුකළ බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. ප්‍රධාන ප්‍රවෘත්ති විකාශ 05ක් සහ පැයෙන් පැය ප්‍රවෘත්ති විකාශ 14 ක් ද ඇතුළුව ප්‍රවෘත්ති ප්‍රකාශ 18ක් දෛනිකව විකාශය කෙරේ.

| ප්‍රධාන ප්‍රවෘත්ති විකාශ | | |
|---|---|---|
| සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| දහවල් 12.30 | දහවල් 1.30 | රාත්‍රී 9.00 |
| රාත්‍රී 8.00 | රාත්‍රී 7.30 | |

| පැයෙන් පැය පුවත් විකාශ | |
|---|---|
| සිංහල | දෙමළ |
| පෙරවරු 7.55 | පෙරවරු9.25 |
| පෙරවරු 8.55 | පෙරවරු11.25 |
| පෙරවරු 9.55 | පස්වරු3.25 |
| පෙරවරු10.55 | පස්වරු5.25 |
| පස්වරු 1.55 | |
| පස්වරු 2.55 | |
| පස්වරු 3.55 | |
| පස්වරු4.55 | |
| පස්වරු 5.55 | |


ත්‍රෛභාෂා ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශ 05 සහ පැයෙන් පැය ප්‍රවෘත්ති ප්‍රකාශ සඳහා පැය 04කට ආසන්න ගුවන් කාලයක් වෙන්කර තිබේ. සාමාන්‍යයෙන් විශේෂ අවස්ථාවලදී විශේෂ ප්‍රවෘත්ති ප්‍රකාශයක් සඳහා අතිරේක කාලයක් යොදාගැනීමට ද සිදුවේ. මීට අමතරව, උදෑසන 6.00 සිට 6.25 දක්වා කාලීන හා විදෙස් ප්‍රවෘත්ති වෙනුවෙන් "සිව්දෙස" වැඩසටහන දෛනිකව විනාඩි 25 බැගින් ගුවන් කාලයක් වෙන්කර තිබේ. එමෙන්ම කාලීන සිදුවීම් වැඩසටහන් සඳහා සතියකට පැය 16 ක ගුවන් කාලයක් වෙන් කෙරෙන අතර, විශේෂ සජීව වැඩසටහන් ආදිය පැවැත්වීමේදී අමතර ගුවන් කාලයක් ද වෙන් කෙරේ.

ඒ අනුව, 2020 වර්ෂයේදී කොරෝනා වසංගතය හමුවේ සහ මැතිවරණ කටයුතු හමුවේ බොහෝ වශයෙන් විශේෂ ප්‍රවෘත්ති ප්‍රකාශ හරහා ජනතාව ඒ ඒ කාරණා පිළිබඳව ක්ෂණිකව දැනුවත් කෙරිණි.

# නිෂ්පාදන සේවා අංශය

රූපවාහිනි වැඩසටහන් නිෂ්පාදනයේදී අවශ්‍යවන්නාවූ ප්‍රධාන සේවාවන් හා උපකරණ සපයනු ලබන ප්‍රධාන අංශයක් වන්නේ නිෂ්පාදන සේවා අංශයයි. කැමරා ඒකකය, පටිගතකිරීමේ ඒකකය, ආලෝකකරණ ඒකකය, පසුතල ඒකකය, වේශ නිරූපන ඒකකය සහ මාධ්‍යරූප ඒකකය යන ප්‍රධාන ඒකක හයකින් නිෂ්පාදන සේවා අංශය සමන්විත වේ. අනුමත ආයතනික ව්‍යුහයයෙහි ඒම ඒකක හය අතුලත්ව ඇත. මීට අමතරව ඊ.එන්.ජී. ඒකකය තුළින් ක්ෂේත්‍ර පටිගත කිරිම් සහ OB පටිගත කිරීම් සඳහා අවශ්‍ය උපකරණ නිකුත් කරනු ලබයි. විශාල වටිනාකමක් ඇති උපකරණ විශාල ප්‍රමාණයක් ඊ.එන්.ජී. ඒකකය සතුව ඇත. එය සංස්ථා ව්‍යුහය තුල අනුමත ඒකකයක් නොවේ. ක්ෂේත්‍ර වැඩසටහන් සහ බාහිර විකාශ සඳහා කැමරා, ආලෝකකරණ, පටිගතකිරීම් කාර්යයන් සඳහා සහාය දක්වන ඊ.එන්.ජී. සහ ඊ.එෆ්.පී සහායකයින්. ට්‍රැක්ඩොලි ක්‍රියාකරුවන්, ජිබ් ආම් ක්‍රියාකරුවන් ද මෙම අංශය යටතේ සේවය කරයි. ඔවුන් සඳහා වෙනම ඒකකයක් ස්ථාපිතව නැත. නියෝජ්‍ය අධ්‍යක්ෂ(ආලෝකකරණ) (MM 1-1) ද, නියෝජ්‍ය අධ්‍යක්ෂ(පටිගතකිරීම්) (MM 1-1) ද සහ සහකාර අධ්‍යක්ෂ(පසුතල) (MM 1-1) ද සේවය කරයි. නිෂ්පාදන සේවා අංශය HM – 1-1 වැටුප් කාණ්ඩයේ අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක ය.

නිෂ්පාදන සේවා අංශයේ අනුමත සංවිධාන ව්‍යුහය




## පටිගත කිරීම් සහ නිෂ්පාදන සේවා බාහිර විකාශ ඒකකය

පටිගත කිරීම් සහ නිෂ්පාදන සේවා බාහිර විකාශ ඒකකය නියෝජ්‍ය අධ්‍යක්ෂ(පටිගත කිරිම්) යටතේ අධීක්ෂණය වේ. පටිගත කිරීම් ඒකකය, ඒකක ප්‍රධානී (ශ්‍රව්‍ය හා දෘශ්‍ය) මෙහයවීම යටතේ, නිර්මාපකයින් 15 දෙනෙකු ගෙන් සමන්විත වේ. සංස්ථාවේ බඳවා ගැනිමේ පටිපාටියට අනුව පහත සඳහන් පරිදි වේ

| | තනතුර | ප්‍රමාණය | අනුමැතිය |
|---|---|---|---|
| 1 | ස.අ./නි.අ.(ශ්‍රව්‍ය හා දෘශ්‍ය) | 01 | ඇත |
| 2 | ජ්‍යෙෂ්ඨ ශ්‍රව්‍ය දෘශ්‍ය සංකලන නිර්මාපක | 01 | ඇත |
| 3 | ශ්‍රව්‍ය සංකලන නිර්මාපක | 15 | ඇත |
| 4 | දෘශ්‍ය සංකලන නිර්මාපක | 03 | ඇත |

නිෂ්පාදන සේවා බාහිර විකාශ රථය මගින් කරනු ලබන සජීව විකාශ සහ පටිගත කිරීම් වල ශබ්ද පරිපාලනය, දෘශ්‍ය සංකලනය ඇතුළු සියළුම තාක්ෂණික කටයුතු මෙහෙය වීම සහ සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන තනි කැමරා භාවිතයෙන් කරනු ලබන සියලු ක්ෂේත්‍ර වැඩසටහන් සඳහා ශබ්ද සංකලනයෙන් දායක වන්නේ ශ්‍රව්‍ය සංකලන නිර්මාපකයින්ය.

මෙම ඒකකය මගින් ඒකාංගික සහ මාලා ටෙලිනාට්‍යය, වාර්තා වැඩසටහන්, ක්‍රීඩා වැඩ සටහන්, ළමා වැඩසටහන්, සංගීත වැඩසටහන් සහ අධ්‍යාපන වැඩ සටහන්, දමිළ භාෂාවෙන් කරනු ලබන වැඩසටහන් සහ ටෙලි නාට්‍යය, කාලීන

වැඩසටහන්, වෙළඳ වැඩ සටහන්,ඉංග්‍රීසි භාෂාවෙන් කරනු ලබන වැඩසටහන් සහ නිෂ්පාදන සේවා බාහිර විකාශ රථය යොදා ගනිමින් කරනු ලබන සජීව සහ සජීව රූගත කිරීම් වේ.2020 වසර තුළ වැඩසටහන් 721 කට අධික සංඛ්‍යාවකට සහ නිෂ්පාදන සේවා බාහිර විකාශ රථය යොදා ගනිමින් කරනු ලබන සජීව සහ සජීව රූගත කිරීම් 58 කට නිර්මාණමය දායකත්වය ලබා දී ඇත.

| | තනතුර | වැටුප් කේතය | ශ්‍රේණිය | සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පටිගත කිරීම්) | MM 1-1 | I | 01 |
| 2 | ඒකක ප්‍රධානි (ශ්‍රව්‍ය හා දෘශ්‍ය) | JM 1-1 | I | 01 |
| 3 | ජ්‍යෙෂ්ඨ ශ්‍රව්‍ය දෘශ්‍ය සංකලන නිර්මාපක | JM 1-1 | I | 02 |
| 4 | ජ්‍යෙෂ්ඨ ශ්‍රව්‍ය දෘශ්‍ය සංකලන නිර්මාපක | MA - 4 | II | 08 |
| 5 | ශ්‍රව්‍ය සංකලන නිර්මාපක | MA 2-2 | III | 06 |

නිෂ්පාදන සේවා අංශයේ ඉතාමත් අත්‍යාවශ්‍ය උපකරණ දෙකක් (දෘශ්‍ය සංකලන හා පටිගතකිරිමේ[XDCam]) 2019 වසරේ අනුමතිය ලබා අගැයිමට ලක්කොට ඉන්, දෘශ්‍ය සංකලනයක් (Graswally CORONA) 2020 දෙසැම්බර් මස මිලදී ගැනීමට හැකිවිය. ඉදිරියේ දී මෙම උපකරණය ස්ථාපිත කිරීමට හැකි වීමෙන් හොඳ දර්ශන ලබාගත වේ. තවද පටිගතකිරිමේ(XDCam) යන්ත්‍රය මිලදී ගැනීම සභාපතිතුමාගේ අනුමතිය යටතේ පවතී. මෙයද ඉතාමත් අත්‍යාවශ්‍ය උපකරණයක් වේ.

තවද පර්යේෂණ හා පුහුණු කිරීම් ඒකකය සැලසුම් කරන බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන පුහුණු පාඨමාලා සඳහා ශ්‍රව්‍ය සංකලනය සම්බන්ධයෙන් සම්පත් දායකත්වය මෙම ඒකකයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ලබා දී ඇත.

## ආලෝකකරණ ඒකකය

නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වන ආලෝකකරණ ඒකකය සංස්ථාව මගින් ඉටුකරනු ලබන සියළුම ක්ෂෙත්‍ර නිෂ්පාදන වල ආලෝකකරණ නිර්මාණ කටයුතු සඳහා දායක වේ. මෙම ඒකකය විසින් නාට්‍ය, වාර්ථා වැඩසටහන් , අධ්‍යපන, විචිත්‍රාංග , සඟරාමය , ළමා සහ වෙළඳ දැන්වීම් වැනි සියළුම ආකාරයේ ක්ෂෙත්‍ර නිර්මාණ සඳහා ආලෝකකරණයෙන් දායකත්වය සපයනු ලබයි. ඊට අමතරව අති ගරු ජනාධිපතිතුමා සහ අගමැතිතුමා සහභාගිවන සියළුම උත්සව සහ රාජ්‍ය උත්සව සඳහා ආලෝකකරණ කටයුතු සිදුකරනු ලබන්නේද මෙම ඒකකයෙනි. 2020 වසර තුළ වැඩසටහන් 721 කට අධික සංඛ්‍යාවක් සහ නිෂ්පාදන සේවා අංශයේ බාහිර විකාශ රථයෙන් නිෂ්පාදනය කරනු ලබන වැඩසටහන් සහ සජීව වැඩසටහන් 58 කට ශිල්පී දායකත්වය ලබා දී ඇත.

## ආලෝකකරණ ඒකකයේ සංයුතිය

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ආලෝකකරණ)**

**ඒකක ප්‍රධානී ( ආලෝකකරණ)**

**ප්‍රධාන අලෝකකරණ නිර්මාපක - 03**

**අලෝකකරණ නිර්මාපක - 03**

**2020 සේවක සංඛ්‍යා ඇස්තමේන්තුවේ ආලෝක නිර්මාපකයින් 15 දෙනෙකු සඳහා අනුමැතිය ලැබී ඇත. පුරප්පාඩු සංඛ්‍යාව 08කි.**

## ප්‍රධාන අලෝකකරණ නිර්මාපක

බහු කැමරා වැඩසටහන් නිෂ්පාදනයේදී සහ විශේෂිත වැඩසටහන් වලදී ආලෝකකරණ සටහන් නිර්මාණය සහ ආලෝකකරණ අධ්‍යක්ෂණය

## අලෝකකරණ නිර්මාපක

ආලෝකකරණ අධ්‍යක්ෂණයේදී ප්‍රධාන ශිල්පියාට ඒ සඳහා සහයෝගය දීම සහ අනෙකුත් වැඩසටහන්වල ආලෝකකරණය.

**ඊ.එන්.ජී / ඊ.එෆ්.පී. සහයකයින්**

රූපවාහිනි වැඩසටහන් නිෂ්පාදනයේදි කැමරා . ආලෝකකරණ සහ පටිගත කිරීමේ කාර්යයන් සඳහා සහය දැක්වීම ඊ.එන්.ජී / ඊ.එෆ්.පී. සහයකයින්ගේ රාජකාරියයි. ඊ.එන්.ජී / ඊ.එෆ්.පී. සහයකයින් 16 දෙනෙක් සේවය කරයි.

නිෂ්පාදන සේවා අංශයේ සේවය කරන ඊ.එන්.ජී / ඊ.එෆ්.පී. සහයකයින්ගේ සේවා පැවරීම් සහ රාජකාරි අධීක්ෂණය ද නි.අ. (ආලෝකකරණ) විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව සේවා මුර චක්‍රයක් යටතේ නිෂ්පාදන සේවා අංශයේ බාහිර විකාශ රථය සඳහා සේවකයින් 03 දෙනෙකුද , මැදිරි ජිබ් ආම් එක සඳහා 02නෙකුද . බාහිර ජිබ් ආම් එක සඳහා 03 නෙකුද . ටියුබ් ට්‍රැක් එක සඳහා 02 නෙකුද. බාහිර ට්‍රැක් ඇන්ඩ් ඩ්‍රෙලි එක සඳහා 02 නෙකුද. බාහිර පටිගකිරීම් සඳහා එක් අයෙකු බැගින් යොදවනු ලැබේ.

2020 වසරේ මැදිරි ජිබ් ආම්. ටියුබ් ට්‍රැක් . බාහිර ට්‍රැක් ඇන්ඩ් ඩ්‍රාලි, වැඩසටහන් 252 ක් සඳහා සහයකයින් යොදවා ඇත.

**නිෂ්පාදන සේවා අංශය සතු නඩත්තු ඒකකය**

නිෂ්පාදන සේවා අංශය සතු නඩත්තු ඒකකයද නි.අ. (ආලෝකකරණ) යටතේ ක්‍රියාත්මක වේ. විශ්‍රාම ලත් ජේ. කැමරා ශිල්පී උපාලි දේවරාජා මහතා දෛනික ගෙවීම් පදනම යටතේ එහි සේවා කටයුතු කර ගෙන යයි.

විශාල වටිනාකමකින් යුත් මැදිරි ත්‍රීපාද අළුත් වැඩියාව , මැදිරියේ ඇති ක්‍රියාවිරහිතව තිබූ ජිබ් ආම් උපකරණය අළුත් වැඩියා කර යථා තත්ත්වයට පත් කිරීම වැනි විශේෂ නඩත්තු කටයුතුද මෙම ඒකකයෙන් සිදු කෙරේ.

## කැමරා ඒකකය

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් නිෂ්පාදනය කරණු ලබන ප්‍රවෘත්ති ආවරණයන් හැර සියලු වැඩසටහන් වල කැමරාකරණය, නිෂ්පාදන සේවා අංශයේ කැමරා ඒකකයෙහි කැමරා ශිල්පීන් මගින් ඉටු කරනු ලබයි. ඒ අනුව ප්‍රවෘත්ති මැදිරිය ඇතුලු සියලු මැදිරි වැඩසටහන්, බාහිර විකාශ රථ යොදා සිදුකරණ සජීව සහ පටිගත කිරීම්,ටෙලි නාට්‍ය සහ වාර්තා වැඩසටහන් ආදී ක්ෂේත්‍ර නිෂ්පාදන යන සියල්ලෙහි කැමරාකරණය, කැමරා ඒකකයෙහි කැමරා ශිල්පීන් විසින් ඉටු කරනු ලබයි.

කළමණාකාර සේවයේ අන්තර් ග්‍රහණයෙන් පසු නිර්දේශිත මූලික සේවක සංඛ්‍යා ඇස්තමේන්තුව (CADRE) අනුව කැමරා ඒකකය, කැමරා ශිල්පීන් 47 දෙදෙනෙකුගෙන් සමන්විත අතර ඉන් 5 ක් ප්‍රධාන කැමරා ශිල්පී තනතුරු වේ.

කැමරා ඒකකයේ සංයුතිය පහත පරිදි වේ.

| තනතුර | සේවක සණය | තනතුරු ස්වභාවය | තනතුරු සංඛාව | පවතින සංඛාව | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කැමරාශිල්පී | JM 1-1 | විධායක නොවන | 05 | 01 | 04 |
| කැමරාශිල්පී | MA 2-2 | විධායක නොවන | 42 | 35 | 07 |

කැමරා ඒකකයේ සහකාර අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පවතී. එම කටයුතු ආවරණය කිරීමට ඒකක ප්‍රධානියෙක් පත් කර ඇත.
ප්‍රධාන කැමරාශිල්පී තනතුරු 04ක් දිගු කාලයක සිට පුරප්පාඩු ව පවති.

### ඒකකය මගින් වැඩසටහන් නිෂ්පාදනය සඳහා ලබා දුන් උපකරණ සහ ප්‍රමාණ

| උපකරණය | ඒකකය සතු ප්‍රමාණය | වර්ෂය තුල සේවා 2020 සැපයූ වැඩසටහන් ගණන | ආසන්න වටිනාකම |
|---|---|---|---|
| FULL HD EFP CAMERA | 10 | 721 | meh8lgre'10000x721=210 7000.00 |
| JIMMY JIB ARM | 01 | 135 | meh4lg re'6500x135= 877500.00 |
| TUBE TRACK | 01 | 117 | meh4lg re'1250x117=146500.00 |
| COPTERCAM | 02 | 101 | meh 8 lg re'8000x101= 808 000.00 |
| **TOTAL** | | | re' 042 9000.00 |

## ඒකකය මගින් ලබාදුන් කැමරා ශිල්පීන්ගේ සේවාවන් (ආසන්න අගයන්)

| පටිගතකිරීම සිදුකල ආකාරය | ප්‍රමාණය | ශිල්පීන් |
|---|---|---|
| බාහිර බහු කැමරා ආවරණ)PSOB+OB1/2+COM OB) | දින 136 | 436 |
| මැදිරි අංක 1 | සෑම දිනකම 5.45 -20.30පැය දක්වා | 4x365=1460 |
| මැදිරි අංක 2 | සෑම දිනකම 7.00- 20.30පැය දක්වා | 3x365=1095 |
| මැදිරි අංක 3 | සෑම දිනකම වැඩසටහන අනුව | 3x365=1095 |
| ප්‍රවෘත්ති මැදිරිය | සෑම දිනකම 7.00- 22.00පැය දක්වා | 2x365=730 |
| රජත මැදිරිය | වැඩසටහන් 13 | 32 |
| ක්ෂේත්‍ර නිෂ්පාදන | වැඩසටහන් 721 | 825 |
| එකතුව | | 5673 |

### පුහුණු වැඩමුලු පැවැත්වීම

ඩ්‍රෝන කැමරා භාවිතය පිළිබඳව කැමරා ශිල්පීන් 15 දෙනෙකු සඳහා 2020 ජනවාරි මස 30 දින සිට පුහුණු සැසි 12 ක් පවත්වා ඇත. ජ්‍යෙෂ්ඨ කැමරා ශිල්පී දීපාල් ජයසිංහ, ටෙනත් රොෂාන්, සුරංග ප්‍රේමදාස සහ අතුල රවීන්ද්‍ර යන මහත්වරුන් විසින් පුහුණුවීම් අධීක්ෂණය කරණ ලදි.

2020 අගෝස්තු28,30 සහ සැප්තැම්බර් 13යන දිනයන්හි දී JIB ARM ක්‍රියාකරවීම පිළිබඳවැඩමුලු තුනක් කැමරා ශිල්පීන් 11 දෙනෙකු සඳහා පවත්වන ලදි. ජ්‍යෙෂ්ඨ කැමරා ශිල්පී රංජන් ගුරුසිංහ මහතා විසින් එම වැඩමුලුව මෙහෙයවන ලදි.

## <u>වේශ නිරූපන ඒකකය</u>

නිෂ්පාදන සේවා අංශය යටතේ ක්‍රියාත්මක වන රූපවාහිනී සංස්ථාවේ නිෂ්පාදන ක්‍රියාවලියට සෘජුවම දායකත්වය ලබාදෙන ප්‍රධානතම ස්ථානයකි වේශනිරූපන ඒකකය.
ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, මැති, ඇමැතිවරු,තානාපතිවරු, විවිධ ආගමික නායකතුමන්ලා, දෙස්විදෙස් ප්‍රභූවරු අතුළු විවිධ සේවා දායකයින් සමග පළමුව සෘජුවම සුහදශීලිව කටයුතු කරනුයේ වේශ නිරූපණ ඒකකයයි. සේවා දායකකයා සුහදව පිළිගෙන ඔවුන්ගේ රූව සැකසීම, කොණ්ඩය සැකසීම ඇඳුම සැකසීම නිසි අයුරින් සිදුකිරීමත් එමගින් සේවා දායකයාගේ මනස ප්‍රබෝධමත්කර නියමිත වැඩසටහන් සඳහා යොමුකරන ප්‍රබලතම ස්ථානයයි.

<u>වේශ නිරූපණ ඒකකයේ කාර්යමණ්ඩලය</u>

1) ඒකක ප්‍රධානි (NVQ – 4) - 01
2) ජ්‍යෙෂ්ඨ වේශ නිරූපණ නිර්මාපක - 04
3) වේශ නිරූපණ නිර්මාපක - 05
4) දෛනික වැටුප් මත - 01
5) පුහුණුවණ - 01

ඒකකයේ ඇස්තමේන්තු නිර්මාපකයින් ගණන 15කි.

## ඒකක ප්‍රධානි කාර්යය භාරය

ඒකකයේ සියලුම රාජකාරී අධීක්ෂණය කිරීම. වැඩසටහන් සඳහා නිර්මාපකයින් අනුයුක්ත කිරීම. වේශ නිරූපණ කටයුතු සඳහා අවශ්‍යය අමු ද්‍රව්‍ය හා උපකරණ සපයා දීම. වෘත්තීය දැනුම යාවත්කාලීන කිරීම. ඒකකයේ ගැටලු නිරාවර්ණය කිරීම. සෞඛ්‍ය ආරක්ෂිතව, යහපත් මානසික තත්වයකින් යුතුව කටයුතු කිරීමට පසුබිම සැලැස්වීම. නිර්මාණාත්මක වැඩසටහන් සඳහා අවශ්‍යය වේශ නිරූපණයට අවශ්‍ය දළ සටහන් හා උපදෙස් ලබාදීම. ආධුනික ශිල්පීන් පුහුණු කිරීම.

## 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වේශ නිරූපණ ඒකකයෙන් සේවය ලබාගත් වැඩසටහන් විස්තරය.

සංගීත, නාට්‍ය, ක්‍රීඩා, අධ්‍යාපන, ළමා, ආගමික, හඩකැවීම්, ප්‍රවෘත්ති. දමිල, මුස්ලිම්, ආදි එක් එක් ඒකකයන් මගින් නිෂ්පාදිත සියළුම වැඩසටහන් සඳහා වේශ නිරූපණ ශිල්පීන්ගේ දායකත්වය නොඅඩුව ලබාදී ඇත.
පෙ.ව. 05.30 සිය මධ්‍යමරාත්‍රි 24.00 දක්වා නොකඩවා දිනපතා මැදිරි පටිගත කිරීම් සඳහා වූ වැඩසටහන් 3200 කට සේවය සපයා ඇත. බාහිර පටිගතකිරීම් හා සජීවී වැඩසටහන් 200 කට සේවය සපයා ඇත.

## පසුතල නිර්මාණ ඒකකය

එහි වැදගත්ම ඒකකය වන පසුතල නිර්මාණ ඒකකය තුළ සංස්ථාවේ අනුදැනුම යටතේ නිෂ්පාදනය කරනු ලබන වැඩසටහන් ඉසව් පරීක්ෂණය කොට,අදාල චරිත සහ වැඩසටහන් වලට සරිලන පරිදි පරිබාහිර සැලසුම් අනුව අඩු පිරිවැයකින් ගුණාත්මකව මැදිරි තුළ හා බාහිර පටිගතකිරීම් සඳහා පසුතල නිර්මාණය කිරීම, ඇඳුම් සහ රංග භාණ්ඩ නිර්මාණය කිරීම, පසුතල ඉදිකිරීම්, පසුතල යෙදීම්.

මේ මගින් අරමුණු වන්නේ,

1. පසුතල නිර්මාණ තුළින් වැඩසටහනෙහි අනන්‍යතාවය රැකගැනීම.
2. ගුණාත්මක බව ඉහළ නැංවීම.
3. ඉහළ වෙළඳ වටිනාකමක් ලබාදීම.
4. ආයතනයේ කීර්ති නාමය ඔසවා තැබීමට රුකුලක් වීම.

අප ඒකකයේ කාර්ය මණ්ඩලය මෙසේය.

1. සහකාර අධ්‍යක්ෂ (පසුතල) ඒකක ප්‍රධානි - තනතුරු -02
2. පසුතල නිර්මාණ ශිල්පී - තනතුරු - 07
3. ජ්‍යෙෂ්ඨ ඇඳුම් නිර්මාණ සහකාර - තනතුරු - 01
4. ජ්‍යෙෂ්ඨ පසුතල සහායක - තනතුරු - 02
5. පසුතල සහායක - තනතුරු - 07
6. පසුතල ඉදිකිරීම් ශිල්පි - තනතුරු - 03

## 1. සහකාර අධ්‍යක්ෂ (පසුතල)

පසුතල ඒකකයේ සියළුම රාජකාරී ආවරණය කිරීම. පසුතල නිර්මාණ ශිල්පීන්ට රාජකාරී පැවරීම.

## 2. ඒකක ප්‍රධානි (පසුතල)

පසුතල ඒකකයේ පසුතල සහායකයන් හට පසුතල යෙදීම සඳහා රාජකාරී පැවරීම. පසුතල යෙදීම් අධික්ෂණය කිරීම.

## 3. පසුතල නිර්මාණ ශිල්පින්

පසුතල ඒකකයේ සියළුම ක්‍රියාකාරිත්ව සිදු කෙරෙනුයේ පසුතල නිර්මාණ ශිල්පීන් මගිනි.

- සියලුම වැඩසටහන් සඳහා පසුතල නිර්මාණය කිරීම සහ ටෙලි නාට්‍ය සහ බාහිර පටිගතකිරීම් වලදී කලා අධ්‍යක්ෂණය කිරීම.
- නියමිත වැඩසටහන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම.
- මැදිරි වලට අදාල පසුබිම් සැලැස්ම සකස් කිරීම.
- පසුතලයට අදාළ අමුද්‍රව්‍ය ලබාගැනීමට අදාල ඒකක වෙත යොමු කිරීම.
- පසුතල ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීම.
- අදාළ පසුතලය පටිගත කිරීම් කාලය තුළ පසුතල යෙදීම් අධීක්ෂණය කිරීම.
- ටෙලි නාට්‍ය සඳහා කලා අධික්ෂණය කිරීම. ඉසව් සමීක්ෂණය, පසුතල රංග භාණ්ඩ ඇඳුම් නිර්මාණය, ඇස්තමේන්තු සකස් කිරීම.එම නාට්‍ය නිමවන තුරු එහි අදාළ අධීක්ෂණ කටයුතු කිරීම.

## 4.ජ්‍යෝෂ්ඨ ඇඳුම් නිර්මාණ සහකාර

- පසුතල නිර්මාණ ශිල්පීන්ගේ සහ නිෂ්පාදකවරුන්ගේ වැඩසටහන් සඳහා අවශ්‍ය පසුතල රංග භාණ්ඩ, ඇඳුම් පැළඳුම් ලබාදීම.
- ඒවා ආරක්ෂා කිරීම.
- ලේඛනගත කිරීම.
- පිරිසිදු කිරීම.

පසුතල නිර්මාණ ශිල්පීන්ට අවශ්‍ය ඇඳුම් සහ පසුතල නිර්මාණ සඳහා අවශ්‍ය දේ, තිර රෙදි, කුෂන් ආදිය සකස් කිරීම, ඇස්තමේන්තු කිරීම, අමුද්‍රව්‍ය සපයාගෙන පසුතල නිර්මාණශිල්පීන්ගේ උපදෙස් මත ඒවා සකස් කිරීම.

## 5. පසුතල සහායක

පසුතල ඒකකයේ කරනු ලබන සියලුම වැඩසටහන් සඳහා පසුතල යෙදීම සහබාහිර පටිගත කිරීම් වලදී සියලුම කලා අධ්‍යක්ෂණ කටයුතු වලදී පසුතල යෙදීම් කටයුතු කිරීම.

**6. පසුතල ඉදිකිරීම් ශිල්පී**

මැදිරි සහ බාහිර පටිගත කිරීම් සඳහා නිර්මාණය කරනු ලබන පසුතල සහ ඒවා අලුත්වැඩියා කිරීම මේ ශිල්පීන්ට පැවරේ.

**2020 වර්ෂය තුළදී ජනවාරි මාසයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා කරන ලද කාර්යභාරය.**

- මැදිරි තුළ පසුතල යෙදීම් - වැඩසටහන් 2620
- රජත මැදිරිය තුළ - වැඩසටහන් 15
- කෙටි නාට්‍යය - 08 යි
- බාහිර පටිග කිරීම් - 10 යි

**අලුතින් නිර්මාණය කරන ලද විශේෂිත වැඩසටහන් පසුතල**

- 2020 මහා මැතිවරණය
- වාර්ෂික පිරිත් දේශනය
- සුපර් බෝල් සංගීත වැඩසටහන

**ප්‍රදර්ශන කුටි නිර්මාණ**

- රූ එන්ටටේන්ට්මන්ට්, පොත් ප්‍රදර්ශණය 2020

පසුතල ඒකකය තුළ රාජකාරි පහසු කිරීම, ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා Virtual Key Set භාවිත කිරීම.

දැනට මැදිරි තුළ කෙරෙන සාකච්ඡාමය වැඩසටහන් සඳහා ඉදිකෙරෙන පසුතල වියදම් සහ අවකාශය ඉතිරි කිරීම මේ මගින් සිදුකෙරෙන අතර, ඒකකය තුළ ගබඩා පහසුකම් මෙන්ම මිනිස් ශ්‍රමයද ඉතිරි කර ගත හැකිය.

## මාධ්‍යරූප හා සජීවකරණ ඒකකය

ඒකකය පිළිබඳ හැඳින්වීම

1. 1982 වර්ෂයේ ආරම්භ කරන ලද ඒකකයකි. ඒකකයෙන් වැඩසටහන් සඳහා සහාය වන කාර්යභාරයක් සිදුකෙරෙන බැවින් නිෂ්පාදන සේවා අංශය යටතේ පවතින ඒකකයක් ලෙස එය පවත්වාගෙන යයි. ඒකකයෙන් සිදුවන මුඛ්‍ය කාර්ය භාරය වන්නේ වැඩසටහන් නිෂ්පාදනයේදී අවශ්‍ය වන පූර්ව ප්‍රචාරක පට ,තේමා, අක්ෂර, නාමාවලි නිර්මාණය සහ අධ්‍යාපන මාධ්‍යරූප හා වෙළෙඳ දැන්වීම් නිර්මාණය කිරීමත්ය. මෙයට අමතරව ආරාධනා පත්‍ර, බැනර්, සංවත්සර ලාංඡන, කැලැන්ඩර් ආදිය නිර්මාණය කිරීම ඇතුළු සංස්ථාවේ සහ නාලිකාවේ ප්‍රචාරක අවශ්‍යතා ඉටුකිරීමත් සිදුවේ.

2. සේවක ප්‍රමාණය සහ ඉඩ පහසුකම් අඩුකම නිසා ඒකකය, ඒකක 1 සහ ඒකක 2 වශයෙන් ස්ථාන දෙකක පවත්වාගෙන යයි.
3. ඒකක දෙකෙහිම කාර්යයභාරය පොදුවේ එක සමාන වුවත් ඒකක 1 අධ්‍යාපන සේවා වැඩසටහන් සඳහා මාධ්‍යරූප නිර්මාණය කරෙහි වැඩි නැඹුරුතාවක් දක්වයි. ඒසේම ඒකක 2 වෙළෙඳ වැඩසටහන් කෙරෙහි වැඩි නැඹුරුතාවක් දක්වයි.

**තනතුරු නාම මෙසේය.**

1. ප්‍රධාන මාධ්‍යරූප නිර්මාපක - තනතුරු 1යි.
2. අක්ෂර,සජීවකරණ හා මාධ්‍යරූප ශිල්පී - තනතුරු 5යි.
3. මාධ්‍යරූප හා සජීවිකාරක - තනතුරු 13යි.
4. සේවා පැවරුම් පදනම මත - තනතුරු 2යි.

# චැනල් අයි නාලිකාව

EYE නාලිකාව 1999 අප්‍රේල් මාසයේ දී රූපවාහිනී 2 වන නාලිකාව ලෙස විකාශනය කිරීම ආරම්භ කරන ලදී. 2000 අගෝස්තු මාසයේදී එය චැනල් අයි බවට පත් වූ අතර, අධ්‍යාපනය, යෞවනය සහ විනෝදාස්වාදය යන නාලිකාවේ කුළුණු තුනෙන් ඇස ලාංඡනය පැමිණියේය. නාලිකාව පුළුල් පරාසයක සිට වැඩසටහන් නිෂ්පාදනය සහ ක්‍රීඩා ඉසව් විකාශනය කරයි. චැනල් අයි හි පළමු වසර වලදී එය ඩිස්කවරි චැනලයේ වාර්තා චිත්‍රපට විකාශය කළේය.

චැනල් අයි යනු ශ්‍රී ලංකා රූපවාහිනි හි සංස්ථාවේ ඉංග්‍රීසි නාලිකාව වන අතර එය ඉංග්‍රීසි නරඹන්නන් සඳහා ඉංග්‍රීසි වැඩසටහන් නිෂ්පාදනය ආරම්භ කර ක්‍රියාත්මක කරයි. සාමාන්‍ය ප්‍රේක්ෂකයින්, තරුණයින්, ළමුන් සඳහා වැඩසටහන් නිෂ්පාදනය කරයි. සජීවීව පටිගත කිරීම සහ සාමාන්‍ය ජනතාවගේ අත්‍යවශ්‍ය දේට සරිලන පරිදි නිශ්චිත කාල පරාස මත පටිගත කරන ලද වැඩසටහන් විකාශය කරයි. විවිධාකාර නරඹන්නන් සඳහා සාකච්ඡා, සඟරා, විනෝදාස්වාදය, ක්‍රීඩා යන ක්ෂේත්‍ර පදනම් කරගත් ඉංග්‍රීසි වැඩසටහන් නිෂ්පාදනය කරයි. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සාමාන්‍ය ජනතාවගේ අවශ්‍යතා සඳහා උදේ කාලයේදී වැඩසටහන් නිෂ්පාදනය කරනු ලබයි. ප්‍රවණතා පවතින ව්‍යාපාරික ප්‍රවෘත්ති සහ ඉස්මතු කිරීම්, නීතිය හා සාමය, විනෝදාස්වාදය සහ බෞද්ධ ධර්මය පිළිබඳ සාකච්ඡා කිරීම ඇතුළු වැඩසටහන් සන්ධ්‍යා කාලසීමාව සඳහා නිෂ්පාදනය කර විකාශය කරනු ලබයි. පුළුල් ආවරණයක් ඇති එකම ඉංග්‍රීසි නාලිකාව වන අතර මැදිරි වැඩසටහන් නිෂ්පාදන වලදී එහි සුවිශේෂත්වයක් ඇත.

චැනල් අයි නාලිකාව නිෂ්පාදනය කරනු ලබන වැඩසටහන්

| වැඩසටහනෙහි නම | සජීව/පටිගත | දිනය සහ වේලාව | වැඩසටහන් වර්ගය | වැඩසටහන ආරම්භ කළ දිනය | මසකට විකාශය වන වැඩසටහන් ගණන |
|---|---|---|---|---|---|
| Law and Order | පටිගත | සිකුරාදා 1) සහ 3 සතිය-22.00 ( 22.30 | නීතිමය සාකච්ඡාව | 2015.03.27 | 4 |
| Business Today | සජීව | බදාදා-22.00) (22.30 | ව්‍යාපාරික සඟරාමය | 2015.04.08 | 4 |
| Eye on World | පටිගත | සෙනසුරාදා-22.00) (22.30 | සඟරාමය | 2015.04.02 | 4 |
| Eye Med | පටිගත | බ්‍රහස්පතින්දා (22.30-22.00) | සෞඛ්‍යමය සාකච්ඡාව | 2019.02.04 | 4 |
| Eye Shuffle | සජීව | අඟහරුවාදා | සංගීත | 2010.12.21 | 4 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | (22.30-22.00) | | | |
| Cafe Classic | සජීව | සඳුදා-22.00) (22.30 | සංගීත | 2012.05.16 | 4 |
| Cine Mag | පටිගත | සිකුරාදා 2 සහ 4 සතිය(22.00 22.30 | සහරාමය | 2019.02.02 | 4 |
| Local Hunt | පටිගත | ඉරිදා-22.00) (22.30 | සංගීත | 2019.02.03 | 4 |
| Path to Freedom | පටිගත | සෑම පෝය දිනකම | බෞද්ධාගමික සාකච්ඡාමය | 2020.01.10 | 1 |
| Rise and Shine | සජීව | සතියේ දින හතම | Morning Show | 2010.12.01 | 30 |

ඉංග්‍රීසි කථාකරන ප්‍රේක්ෂකයින්ගේ විනෝදාස්වාදය සඳහා ඉංග්‍රීසි වැඩසටහන් නිෂ්පාදනය කිරීම සහ මැදිරි ආශ්‍රිත වැඩසටහන් නිෂ්පාදනය කිරීමෙන් චැනල් අයි නාලිකාව සංවර්ධනය කිරීම අරමුණකි.

## <u>මුස්ලිම් වැඩසටහන් ඒකකය</u>

නේත්‍රා අංශය යටතේ මුස්ලිම් වැඩසටහන් ඒකකය ක්‍රියාත්මක වේ.මෙම ඒකකය නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු,නිෂ්පාදකවරු තුන්දෙනෙකු, සහ එක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාරවරයකුගෙන් සමන්විත වේ.මුස්ලිම් වැඩසටහන් නේත්‍රා නාලිකාව ඔස්සේ විකාශය වේ. මුස්ලිම් වැඩසටහන් මඟින් මුස්ලිම් ප්‍රේක්ෂකයින්ට දේශීය විදේශීය ආගමික සංස්කෘතික වැඩසටහන් රස විඳීමට අවස්ථාව උදා වේ.

### නිෂ්පාදනය කරනු ලබන වැඩසටහන්

- සාකච්ඡාමය හා සහරාමය වැඩසටහන් (සතිපතා -සජීව) 3 x 30 mts
- රාමලාන් ඉෆ්තාර් වැඩසටහන්(ආගමික) 30 x 30 mts
- උත්සවයන්ට අදාල වැඩසටහන් 3 x 20 hrs
- සතිපතා වාර්තාමය,තරුණ සහරාමය සහ සංගීතමය වැඩසටහන් නිෂ්පාදනය කිරීම 3 x30mts
- උත්සවයන්ට අදාල වැඩසටහන් නිෂ්පාදනය කිරීම 3 x 60 mts
- කොවිඩ් 19 වසංගතය කාලය තුළ යම් ශිෂ්‍යත්වලාභීන් සහ අදාල ක්ෂේත්‍රයේ වෘත්තීයවේදීන් සඳහා දැනුවත්කිරීමේ වැඩසටහන් නිෂ්පාදනය කිරීම.

## දෙමළ වැඩසටහන් ඒකකය

| අංකය | වැඩසටහන | වැඩසටහන් ගණන | වැඩසටහන් විස්තරය |
|---|---|---|---|
| 01 | උදය දරිශනම් | 65 | කාන්තා - සජීව |
| 02 | ලන්ච් ටයිම් මියුසික් | 49 | තරුණ විනෝදාස්වාදී - සජීව |
| 03 | අන්තිමෂායි | 47 | ගීත ඉල්ලීම් වැඩසටහන - සජීව |
| 04 | පෞර්ණමි | 10 | පෝය දින විශේෂ වැඩසටහන |
| 05 | සයිවනෙත්ති | 9 | හින්දු ආගමික වැඩසටහන - පටිගත |
| 06 | කලයියමුතම් | 9 | සාම්ප්‍රදායික - පටිගත |
| 07 | ළමා වැඩසටහන | 5 | ළමා දක්ෂතා සහ විනෝදාස්වාදී - සජීව සහ පටිගත වැඩසටහන |
| 08 | පරවහම් | 9 | ප්‍රවීණ කලාකරුවන් සහභාගී වන සම්මුඛ සාකච්ඡාමය වැඩසටහන - සජීව |
| 09 | එම් 9.30 | 9 | තාරුණ්‍යය ඉලක්ක කළ සති අන්ත වැඩසටහන - සජීව |
| 10 | කොඩයිමෂායි | 7 | සිනමාව පිළිබඳ සහරාමය වැඩසටහන - පටිගත |
| 11 | අලගොවියම් | 7 | සහරාමය - පටිගත |
| 12 | අන්තර් සංස්කෘතික සංගීත වැඩසටහන - Harmony | 3 | සංහිදියාව පිළිබඳ සංගීත වැඩසටහන - සංගීතය පිළිබඳ දක්ෂතාවය සහිත සියළු භාෂාවන්හි ශිල්පීන් සහභාගී වීම |
| 13 | ඉපාඩික්කුසත්තම් | 9 | නීතිය පිළිබඳ වැඩසටහන - පටිගත |
| 14 | ඉසායිපුයල් | 6 | සංහිදියාව පිළිබඳ සංගීත වැඩසටහන - පටිගත |
| 15 | තාඩම් | 5 | සංහිදියාව පිළිබඳ සහරාමය වැඩසටහන |
| 16 | විදියල් | 5 | සංහිදියාව පිළිබඳ වාර්තා වැඩසටහන - ප්‍රධාන වශයෙන් උතුරු පළාතේ ක්‍රියාකාරකම් පටිගත කළ |
| 17 | අරුල්ඔට්රු | 9 | ක්‍රිස්තියානි ආගමික වැඩසටහන |
| 18 | සුගවාෂු | 7 | සෞඛ්‍යමය වැඩසටහන - සතිපතා පටිගත කළ |
| 19 | VPS Tag | 5 | තාරුණ්‍යය ඉලක්ක කරගත් සහරාමය සහ විනෝදාස්වාදී වැඩසටහන |

## විශේෂිත දින වැඩසටහන්

| අංකය | වැඩසටහන | වැඩසටහන් ගණන | වැඩසටහන් විස්තරය | අනිකුත් කරුණු |
|---|---|---|---|---|
| 01 | අළුත් අවුරුද්ද සහ නේත්‍රා සංවත්සරය | 1 | අළුත් අවුරුද්ද සහ නේත්‍රා සංවත්සරය විශේෂ සැමරුම - සජීව | ජනවාරි මස |
| 02 | තෛයි පොන්ගල් (උත්සවය) | 1 | හින්දු ආගමික වැඩසටහන - සාම්ප්‍රදායික සහ සංස්කෘතික පොංගල් සැමරුම - සජීව | |
| 03 | මතලේ තේරු උත්සවය (ආගමික) | 1 | වාර්ෂික තේරු උත්සවය මාතලේ සිට සජීව විකාශය | පෙබරවාරි මස |
| 04 | මහාශිව රාත්‍රි(ආගමික) | 1 | දිවයින පුරා ශිව කෝවිල් වල ආගමික වතාවත් විකාශය කිරීම - සාම්ප්‍රදායික හා සංස්කෘතික කටයුතු - සජීව | මාර්තු මස |
| 05 | කාන්තා දිනය | 1 | කාන්තා දින විශේෂ වැඩසටහන | |
| 06 | සිංහල හා හින්දු අළුත් අවුරුද්ද (උත්සව සැමරුම්) | 1 | විශේෂ සැමරුම සහ කෝවිල් පූජාවේ සජීව විකාශය | අප්‍රේල් මස (වසංගත කාලය අතරතුර නිෂ්පාදනය කර විකාශය කිරීම) |
| 07 | ළමා දිනය (සංස්කෘතික වැඩසටහන) | 1 | ළමා සංස්කෘතික වැඩසටහන් - දිවයින පුරා ළමුන් සහභාගී වීම - සජීව | ඔක්තෝම්බර් මස(වසංගත කාලය අතරතුර නිෂ්පාදනය කර විකාශය කිරීම) |
| 08 | නත්තල් සැමරුම | 1 | නත්තල් දින මධ්‍යම රාත්‍රී දේව මෙහෙය - සජීව විකාශය ජින්තුපිටිය දේවස්ථානයේ සිට (ක්‍රිස්තියානි සමාජයේ ඉල්ලීම මත) | දෙසැම්බර් මස (වසංගත කාලය අතරතුර නිෂ්පාදනය කර විකාශය කිරීම) |
| 09 | නත්තල් (ආගමික සාකච්ඡාව) | 1 | නත්තල් (ආගමික සාකච්ඡාව) | |

**අධ්‍යාපනික වැඩසටහන් ( කොවිඩ් 19 වසංගත කාලය තුළ)**

| අංකය | වැඩසටහන | වැඩසටහන් ගණන | වැඩසටහන් විස්තරය | අනිකුත් කරුණු |
|---|---|---|---|---|
| 01 | EDU.COM | 17 | අධ්‍යාපනික වැඩසටහන - ශිෂ්‍යය ශිෂ්‍යාවන් ඉලක්ක කරගත් - සජීව හා පටිගත | මාර්තු සහ අප්‍රේල් මාසයන්හි විකාශය (වසංගත කාලය තුළ) |
| 02 | ගුරුකුලම් | 198 | අධ්‍යාපනික වැඩසටහන - සජීව සහ පටිගත | මාර්තු සහ අප්‍රේල් මාසයන්හි විකාශය (වසංගත කාලය තුළ) |
| 03 | කොරෝනා පිළිබඳ සාකච්ඡාව | 34 | මැදිරිය තුළ සාකච්ඡාව - සජීව සහ පටිගත කළ | |

## ඉංජිනේරු අංශය

සංස්ථාවේ වැඩසටහන් නිෂ්පාදන හා විකාශන කටයුතු නියමිත තාක්ෂණික ප්‍රමිතීන් අනුව ගුණාත්මකව සිදුකිරීම සඳහා ඉංජිනේරු අංශයෙන් ලැබෙනුයේ සෘජු දායකත්වයකි. මෙම අංශය ප්‍රධාන පාලක මැදිරිය, මැදිරි හා බාහිර විකාශන, සම්ප්‍රේෂණ, උපකරණ නඩත්තු, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, විදුලි හා වායුසමීකරණ සහ සිවිල් ඉංජිනේරු යන ඒකකවලින් සමන්විත වේ.

මීට අමතරව, නිෂ්පාදන සේවා අංශය ඇතුළු අනෙකුත් සියලු අංශවල තාක්ෂණික අවශ්‍යතා සඳහා දායකත්වයක් ලබාදෙනුයේ ද ඉංජිනේරු අංශය විසිනි. සංස්ථාවේ සමස්ත තාක්ෂණික උපකරණ ප්‍රසම්පාදනයේ දී ඉංජිනේරු අංශය විසින් මනා දායකත්වයක් ලබා දේ.

රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය සඳහා අංග සම්පූර්ණ මැදිරි 03 ක් ද, ප්‍රවෘත්ති මැදිරිය ද ඇතුළුව තවත් මැදිරි 03 ක් ද, ජංගම විකාශන රථ 02 ක් ද උපයෝගී කරගනිමින් රූපවාහිනී, නේත්‍රා සහ අයි නාලිකා වෙන් වෙන් වශයෙන් සම්ප්‍රේෂණ ජාල 3 ක් මගින් විකාශනය කරනු ලබයි. පිදුරුතලාගල, දෙනියාය, ගොන්ගල, සූරියකන්ද, හන්තාන, ප්‍රිම්රෝස්, නමුණුකුල, පලාලි, කොකාවිල්, හුන්නස්ගිරිය, රාජගිරිය සහ මඩොල්සිම යන ස්ථානවල පිහිටුවා ඇති සම්ප්‍රේෂණාගාර 12 ක් ඔස්සේ එම විකාශයන් විසුරුවා හරිනු ලබන අතර, මෙම භෞමික සම්ප්‍රේෂණ ජාල මගින් සමස්ත ජනගහනයෙන් 95% ක පමණ ප්‍රදේශයක් ආවරණය කරනු ලබන අතර, භූමි ප්‍රමාණයෙන් 80% - 90% දක්වා ප්‍රමාණයක් ආවරණය කරනු ලබයි.
මීට අමතරව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා වැඩසටහන් www.rupavahini.lk, www.nethratv.lk, සහ www.channeleye.lk වෙබ් අඩවි මගින් අන්තර්ජාලය ඔස්සේ ලෝකයේ ඕනෑම තැනක සිට ද ශ්‍රී ලංකාව තුළ ඩයලොග් චන්ද්‍රිකා විකාශය ඔස්සේ (Dialog TV) සහ ශ්‍රී ලංකා ටෙලිකොම් පියෝ ටීවී (PEO TV) රැහැන් සේවාව ඔස්සේ ද නැරඹිය හැක.

පසුගිය වසරේ සිට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ස්ථාපිත කොට ඇති පැරණි ඇනලොග් තාක්ෂණයෙන් යුත් උපකරණ නව ඩිජිටල් තාක්ෂණය සහිත උපකරණ මගින් ක්‍රම ක්‍රමයෙන් ප්‍රතිෂ්ඨාපනය කරමින් පැවති අතර, 2020 වසරේ අග භාගයේ දී ප්‍රධාන පාලක මැදිරිය තුළ සිදුකරන සියලුම තාක්ෂණික කාර්යයන් (Processing, Routing & Playout) ඩිජිටල් තාක්ෂණයෙන් සිදුකිරීමට හැකිවීම මගින් දර්ශනවල පැහැදිලිතාවය තීව්‍ර කිරීමට හැකිවීම සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සැලකිය හැක.

ඉංජිනේරු අංශය භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ 2020 වසරේදී උපකරණ මිලදීගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණ ද ලෝකය පුරා ව්‍යාප්ත වූ කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් එම කටයුතුවලට අදාළ ගිවිසුම් අත්සන් කිරීම් වැනි කටයුතුවල පමාවීමක් සිදුවිණි. නමුත් අදාල කටයුතු වසර

අවසාන වනවිට අවසන් කර තිබූ බැවින්, උපකරණ ලැබීම් 2021 වසර මුල් කාර්තුවේ සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම වසරේ දී කොවිඩ් - 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් ප්‍රධාන කාර්යාලයේ මෙන්ම බාහිර විකාශානාගාරවල උපකරණවල අත්‍යාවශ්‍යම නඩත්තු කටයුතු පමණක් ඉටු කරන ලදී.

එමෙන්ම, මෙම වසර තුළ තාක්ෂණික නිලධාරීන් තිදෙනෙකුගේ හැරයාමත් සමග සේවක පුරප්පාඩු ඉහළ ගිය අතර, අප සංස්ථාවේ පවතින වැටුප් තල රාජ්‍ය අංශයේ ව්‍යවස්ථාපිත මණ්ඩලවල වැටුප් තලවලට වඩා සංසන්දනාත්මකව අඩු මට්ටමක පිහිටීම නිසා ඉංජිනේරුවරුන් සහ තාක්ෂණික නිලධාරීන් බඳවාගැනීමේ ප්‍රායෝගික ගැටළුව මෙන්ම අඩු වැටුප් මට්ටම් නිසා නවක මෙන්ම දක්ෂ පළපුරුදු තාක්ෂණික නිලධාරීන් වාර්ෂිකව සේවය හැරයාමත් මෙම වසරේදී ද ඉංජිනේරු අංශය මුහුණ දුන් ප්‍රධාන ගැටළුවක් විය.

තවද, බොහෝ රජයේ ආයතන සඳහා වීඩියෝ උපකරණ මිලදී ගැනීමේ දී තාක්ෂණික අවශ්‍යතා පදනම් කරගනිමින් විවිධ ව්‍යාපෘති හා උපදේශන සේවා සැපයීම ද පෙර වසරවල මෙන් 2020 වසරේදී ද ඉංජිනේරු අංශය විසින් සිදුකරන ලදී. ජාතික සේවාවක් ලෙස කාර්මික විද්‍යාලවල තාක්ෂණ ඩිප්ලෝමා සිසුන්ට හා විශ්ව විද්‍යාලවල ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්ට ත්‍රෛමාසික හා සය මාසික කාලයකට නොමිලේ සේවාස්ථ පුහුණුව සැපයුව ද කොවිඩ් - 19 රෝග ව්‍යාප්තිය හමුවේ මෙම වසරේ එය සීමා කිරීමට සිදුවිය. ඒ අනුව මෙම වසරේ දී එවන් සිසුන් 10 දෙනෙකුට පමණක් පුහුණු අවස්ථා ලබාදීමට හැකිවිය.

මෙම අංශය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) යටතේ පාලනය වන ඒකක හතකින් (07) සමන්විත මෙම අංශය මගින් වසර පුරා ඉටුකරන ලද කාර්යයන් සංක්ෂිප්තයක් ලෙස පහත දැක්වේ.

## ප්‍රධාන පාලක මැදිරිය (Master Control Room)

ප්‍රධාන ඉංජිනේරු (මෙහෙයුම්) යටතේ ඉංජිනේරුවරුන් දෙදෙනෙකුගේ අධීක්ෂණයෙන් යුත් කාර්ය මණ්ඩලයකින් ප්‍රධාන පාලක මැදිරිය සමන්විත වේ. පැය 24 පුරාම රාජකාරියේ යෙදෙන මෙම ඒකකය මගින් මූලික වශයෙන් ජාතික නාලිකාව, අයි නාලිකාව සහ නේත්‍රා නාලිකාව යන නාලිකා තුනෙහිම විකාශන කටයුතු විකාශන තත්ත්වයන්ට අනුකූලව සහ උසස් තාක්ෂණික ප්‍රමිතීන් අනුව අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි.

එමෙන්ම, ප්‍රධාන පාලක මැදිරිය විසින් නියමිත සංස්කරණ කටයුතුවලට අමතරව අනුග්‍රාහක සහ ආයතනික වැඩසටහන්හි පූර්ව ප්‍රචාර සහ තේමා නිෂ්පාදනය සඳහා පසු නිපැයුම් සංස්කරණ ඒකකයන්හි පහසුකම් පූර්ණ වශයෙන් භාවිතා කරනු ලබයි. මෙහි පසු නිෂ්පාදන සහ සංස්කරණය සඳහා රේඛීය නොවන සංස්කරණ පද්ධති 13 ක් භාවිත කර ඇත.

නාලිකා තුනෙහිම දෛනික සාමාන්‍ය විකාශ කාලය පැය 20 ක් පමණ වන අතර, අදාළ සාමාන්‍ය දෛනික සංස්කරණ කාලය දිනකට සාමාන්‍ය ලෙස පැය 57 ක් පමණ වේ. ඒ අනුව, 2020 වර්ෂයේ රූපවාහිනී, අයි සහ නේත්‍රා නාලිකා විකාශන කාලයන් එක් වැනලයකට පැය 7300 ක් පමණ වන අතර, සංස්කරණ පද්ධති 13 කින් පැය 21,000 ක පමණ රේඛීය නොවන සංස්කරණ කාලයන් නිෂ්පාදකවරුන්ට ලබාදී ඇත.

<u>සිදුකළ විශේෂ කාර්යයන්</u>

- මෙම වසරේ අවසාන භාගයේ දී ප්‍රධාන පාලක මැදිරියෙහි වීඩියෝ සංඥා සැකසීම සහ බෙදාහැරීම (Processing & Routing Playout) පූර්ණ ලෙස ඩිජිටල් තාක්ෂණයෙන් සිදුකිරීමට හැකිවීම විශාල ජයග්‍රහණයකි.

- ප්‍රධාන පාලක මැදිරියෙහි ඇති අධික වටිනාකමකින් යුත් උපකරණවලට අවශ්‍ය ප්‍රශස්ත සිසිලන මට්ටම පවත්වා ගැනීම මගින් රූපවාහිනී විකාශන උපකරණවල විශ්වාසනීයත්වය සහ කල් පැවැත්ම වැඩිවීම සඳහා උපකරණ රාක්ක (Equipment Racks) ස්ථාපිත කර ඇති ප්‍රදේශ වෙන් කිරීමට (Partition) හැකිවිය.

<u>ව්‍යාපෘති</u>

කොරියන් - ශ්‍රී ලංකා සහයෝගීතා පදනම යටතේ කොරියන් රජයෙන් පිරිනමන ලද MAM (Media Assets Management) පද්ධතියෙහි පහසුකම් තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් දියත් කරන ලද II වන අදියරේ දී පහත සඳහන් උපකරණ ත්‍යාගයක් ලෙස මෙම වසරේ දී ප්‍රධාන පාලක මැදිරියට පිරිනැමුණි.

- NAS Storage (Main & Backup)
- Apple Transcoders – 02
- Software Licence - 20

## මැදිරි හා බාහිර විකාශ ඒකකය (Studio & Outside Broadcast Unit)

ප්‍රධාන ඉංජිනේරු (මෙහෙයුම්) යටතේ ඉංජිනේරු (මැදිරි හා බාහිර විකාශන) ගේ අධීක්ෂණයෙන් යුත් කාර්ය මණ්ඩලයකින් මැදිරි හා බාහිර විකාශ ඒකකය සමන්විත වේ.

ඉංජිනේරු අංශයේ මැදිරි හා බාහිර විකාශ ඒකකය මගින් මැදිරි තුළ සහ ඉන් බාහිරව වැඩසටහන් සජීවීව පටිගත කිරීම සහ විකාශය කිරීම සිදුකරනු ලබයි.

2020 වසරේ මාර්තු මාසයේ රටෙහි පැතිර ගිය කොවිඩ් - 19 වසංගත රෝගය හේතුවෙන් බාහිර වැඩසටහන් විකාශයන් සීමා වූ අතර, 2020 වසරේදී මැදිරි I, II හා III තුළ සිදු කරන ලද වැඩසටහන් පැය ගණන් හා ප්‍රවෘත්ති මැදිරිය තුළ සිදුකරන ලද ප්‍රවෘත්ති විකාශයන් ආසන්න වශයෙන් පහත දක්වා ඇති පරිදි වේ.

- **මැදිරි I, II හා III**

| | සජීවී පැය ගණන | පටිගත කළ පැය ගණන |
|---|---|---|
| මැදිරි I | 1300 | 775 |
| මැදිරි II | 320 | 695 |
| මැදිරි III | 520 | 311 |
| මුළු පැය ගණන | 2140 | 1781 |

- **ප්‍රවෘත්ති මැදිරිය**

| | |
|---|---|
| සජීවී ප්‍රධාන පුවත් විකාශයන් | සිංහල/ඉංග්‍රීසි/දෙමළ ,460 |
| පැයෙන් පැය පුවත් විකාශයන් | 3285 |
| විශේෂ ප්‍රවෘත්ති විකාශයන් | 40 |

ඉංජිනේරු අංශය මගින් මෙහෙයුම් සිදුකරන රූපවාහිනී බාහිර විකාශ බස් රථ දෙක උපයෝගී කරගනිමින් හා සංයුක්ත ඒකකය යොදාගනිමින් සජීවී හා පටිගත කිරීම්, ජාතික උත්සව, ක්‍රීඩා වැඩසටහන්, සංගීත වැඩසටහන් හා ආගමික වැඩසටහන් ඇතුළු වැඩසටහන් 61 ක් මෙම වසරේ දී සාර්ථකව සිදුකර ඇත.

## සම්ප්‍රේෂණ ඒකකය (Transmission Unit)

දිවයින පුරා ඵලදායි ආවරණයක් සිදුවන පරිදි විකාශනාගාර 12 කින් සමන්විත දීප ව්‍යාප්ත භෞමික විකාශන ජාල මෙහෙයුම් හා නඩත්තු කටයුතු ඉතා උසස් මට්ටමෙන් පවත්වාගෙන යාමත්, බාහිර විකාශ සඳහා සජීව සබැඳි පහසුකම් ලබාදීමත් ඉංජිනේරු අංශයේ සම්ප්‍රේෂණ ඒකකය මගින් සිදුකෙරෙන ප්‍රධාන කාර්යභාරයන් වේ.

ප්‍රධාන ඉංජිනේරු (සම්ප්‍රේෂණ) යටතේ ඉංජිනේරුවරුන් තිදෙනෙකුගේ අධීක්ෂණයෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සම්ප්‍රේෂණ ඒකකය සමන්විත වේ.

ගත වූ වසරේ සම්ප්‍රේෂණ ඒකකයෙන් පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කරන ලදී.

1. දිවයිනේ විවිධ ස්ථානවල සිට හා විදේශයන්හි සිට සජීව සබඳතාව ලබාදීම සඳහා භාවිතා කරනු ලැබූ ක්ෂුද්‍ර තරංග උපකරණ (Microwave Links), චන්ද්‍රිකා තාක්‍ෂණ උපකරණය (DSNG), කොළඹ හා පිදුරුතලාගල අතර මැදිරි සම්ප්‍රේෂණ සබඳතාව (STL) හා චන්ද්‍රිකා දර්ශන ලබාගැනීමේ (TVRO) පද්ධතියෙහි මෙහෙයුම් හා නඩත්තු කටයුතු ඉතා උසස් මට්ටමෙන් පවත්වාගෙන යාම.

2. විකාශ පිරිවැය අවම කිරීමේ අරමුණෙන් අදාළ බාහිර විකාශ ස්ථානය, විකාශ කාලය ආදී කරුණු සලකා ක්ෂුද්‍ර තරංග උපකරණ (Microwave Links), චන්ද්‍රිකා තාක්‍ෂණ උපකරණ (DSNG) හෝ දුරකතන සේවා සපයන සමාගම්වලට අයත් ප්‍රකාශ තන්තු ජාල (Fiber Optic Network) වැනි තාක්‍ෂණයන් අතරින් වඩාත් සුදුසු තාක්‍ෂණ ක්‍රමවේදය තීරණය කිරීමෙන් අනතුරුව පවතින උපකරණ කාර්යක්‍ෂමව හා ඵලදායීව යොදාගනිමින් සජීවී සම්ප්‍රේෂණ පහසුකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකිරීම

   ඒ අනුව, දිවයිනේ විවිධ ස්ථානවල සිට සම්ප්‍රේෂණ ඒකකය සතු උපකරණ මගින් පහත සඳහන් පරිදි බාහිර විකාශ 71 ක් සඳහා සජීව සබැඳි පහසුකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී.

| | | |
|---|---|---|
| ක්ෂුද්‍ර තරංග උපකරණ (Microwave Links) මගින් - | බාහිර විකාශ | 63 |
| චන්ද්‍රිකා තාක්‍ෂණ පහසුකම් (DSNG) මගින් - | බාහිර විකාශ | 08 |
| එකතුව - | බාහිර විකාශ | 71 |

දේශීය මාධ්‍ය ආයතන සඳහා චන්ද්‍රිකා තාක්‍ෂණ පහසුකම් (DSNG) මගින් සේවා ලබාදීම වෙනුවෙන් රු. 175,000/- ක අමතර ආදායමක් ද උත්පාදනය කරනලදී.

## නඩත්තු ඒකකය (Maintenance Unit)

ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු/තොරතුරු තාක්‍ෂණ/ව්‍යාපෘති) යටතේ ඉංජිනේරුවරුන් දෙදෙනෙකුගේ අධීක්‍ෂණයෙන් යුත් කාර්ය මණ්ඩලයකින් නඩත්තු ඒකකය සමන්විත වේ.

නඩත්තු කටයුතු පහසු කරලීම සඳහා නඩත්තු ඒකකය I සහ නඩත්තු ඒකකය II ලෙස පවත්වාගෙන යනු ලබන අතර, පද්ධති හා උපකරණ පරීක්‍ෂා කිරීම්, සවි කිරීම්, නඩත්තු කටයුතු හා අලුත්වැඩියා කටයුතු නඩත්තු ඒකකය I මගින් ද ක්ෂේත්‍ර උපකරණ හා නිෂ්පාදන සේවා අංශයට අදාළ බාහිර විකාශ බස් රථයේ නඩත්තු කටයුතු නඩත්තු ඒකකය II මගින් ද පහත අයුරින් සිදුකරනු ලැබේ.

<u>නඩත්තු ඒකකය I</u>

සංස්ථාවේ සියලුම රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන විද්‍යුත් උපකරණ මනා ලෙස පවත්වාගෙන යාම නඩත්තු ඒකකය I මගින් සිදු කරනු ලබයි. මේ සඳහා ප්‍රධාන පාලක මැදිරිය, මැදිරි අංක I, II, III, රජත මැදිරිය, ප්‍රධාන පාලක මැදිරියේ ඇති නිෂ්පාදන මැදිරිය (MCR Dub Studio), සංස්කරණ මැදිරිවල රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනයට අදාළ සියලු විද්‍යුත් උපකරණ, පසු නිෂ්පාදන ඒකක, බාහිර විකාශන බස් රථ - I හා II සමඟ Slow motion බස් රථය, 2D/3D සජීවීකරණ ඒකකය, චිත්‍රපටි හා හඬ කැවීම් ඒකකය, මාධ්‍ය රූප හා සජීවකරණ ඒකක, ප්‍රවෘත්ති අංශය, දුරකතන හුවමාරුව ආදී සියලු ඒකකවල සියලු ඉලෙක්ට්‍රොනික විද්‍යුත් උපකරණ ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම, දෝෂ නිවැරදි කිරීම, නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු ඉටුකිරීම මෙම ඒකකය මඟින් ඉටු කරනු ලැබේ.

ඉහත රාජකාරී කටයුතු වලට අමතරව OB – I, OB – II ලෙස හඳුන්වනු ලබන බාහිර විකාශ රථ දෙක හා Slow motion බස් රථ මඟින් ඉටු කරනු ලබන සියලු බාහිර විකාශන රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සේවා ඉටු කරනු ලබන අතර, 2020 වසර තුළ කොවිඩ් - 19 රෝග තත්ත්වය හමුවේ වුව ද OB බස්රථ මගින් සහ Component සහිතව භාවිතා කිරීමෙන් පහත සඳහන් බාහිර විකාශයන් ඉටු කරනලදී.

- 72 වන ජාතික නිදහස් උත්සවය, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා වාර්ෂික පිරිත් පිංකම, රූපවාහිනී පරිශ්‍රයේ අවුරුදු උත්සවය, පොසොන් උත්සවය, රාමඤ්ඤ මහා නිකායේමහානායක අතිපූජ්‍ය නාපාන ප්‍රේමසිරි මාහිමිපාණන්ගේ ආදාහනෝත්සවය, පාර්ලිමේන්තුවේ නව සැසිවාරය විවෘත කිරීම, නත්තල් දේවමෙහෙය, කැලණිය ජල පිරිපහදුව විවෘත කිරීම, මන්නාරම සුළං විදුලි බලාගාරය විවෘත කිරීම, සුපර් බෝල් සංගීත වැඩසටහන් මාලාව සහ දෙසැම්බර් 31 විශේෂ සංගීත වැඩසටහන ඇතුළුව පැවති සියලුම රාජ්‍ය උත්සව ආවරණය කිරීම්

- සියලු ජාතික සහ අන්තර්ජාතික උත්සව විකාශයන් ලබාදීම / පටිගත කිරීම සඳහා OB බස්රථයේ කැමරා සුසර කිරීමෙන් හා අනෙකුත් කාර්යයන්ගෙන් දායකවීම

මෙම ප්‍රධාන රාජකාරීන් වලට අමතරව නව උපකරණ මිළදීගැනීමේ දී ඊට අදාල තත්ත්ව වාර්තා සැකසීමට සහය වීම, නව උපකරණ පරීක්ෂා කිරීම් හා අදාළ උපකරණ නියම තාක්ෂණ තත්ත්වයේ පවතී ද යන්න සොයා බැලීම ආදී කටයුතු නඩත්තු ඒකකය I මඟින් සිදු කරනු ලබයි

<u>සිදුකළ අනෙකුත් කාර්යයන්</u>

- ප්‍රධාන පාලක මැදිරියේ සංස්කරණ මැදිරි සැකසීම
- අතිගරු ජනාධිපතිතුමා හා අග්‍රාමාත්‍යතුමා වෙනුවෙන් අවශ්‍ය ටෙලිප්‍රොම්ටර් රාජකාරී නඩත්තු ඒකකයේ නිලධාරීන් මඟින් ඉටු කරවාලීම,

<u>නඩත්තු ඒකකය II</u>

මෙම ඒකකය මඟින් සියලුම ENG, EFP, PS OB ඒකකයන්ට අදාල කැමරා පටිගත කිරීම් යන්ත්‍ර (Camcorders), දර්ශන පටිගත කිරීම් යන්ත්‍ර (VCR), දෘශ්‍ය සංකලන යන්ත්‍ර (Video Switchers), ශ්‍රව්‍ය සංකලන යන්ත්‍ර (Audio Mixers), දෘශ්‍ය වාහිනී යන්ත්‍ර (Video Monitors), ශ්‍රව්‍ය වාහිනී යන්ත්‍ර (Audio Monitors), මයික්‍රොෆොන් ශබ්ද වර්ධක යන්ත්‍ර (Amplifiers), බැටරි ආරෝපන යන්ත්‍ර (Battery Chargers), විදුලි සැපයුම් යන්ත්‍ර (Power Adaptors), ආලෝක පරිපාලන යන්ත්‍ර (Lighting Equipment), Drone Camera Systems අලුත්වැඩියා කිරීම හා මාසිකව සිදු කරන තත්ත්ව පරීක්ෂාව හා නඩත්තු කටයුතු සිදු කිරීම කරනු ලැබේ. ඊට අමතරව ආරක්ෂිත කැමරා (CCTV), Network Switchers, Digital / Analog Telephone පද්ධති සවිකිරීම් / පරික්ෂා කිරීම් / අලුත්වැඩියා කිරීම් සහ දුරකථන හුවමාරු පද්ධතියන්හි (PABX System) සියලුම යාවත්කාලීන කිරීම් හා නඩත්තු කටයුතු කිරීම් ද සිදු කෙරේ.

මෙම ප්‍රධාන රාජකාරීන් වලට අමතරව නව උපකරණ මිළදීගැනීමේදී ඊට අදාල තත්ත්ව වාර්තා සැකසීමට සහය වීම සහ පිරිවිතර සකස් කිරීම. නව උපකරණවල තාක්ෂණික ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම් සහ ඒවා ස්ථාපනය කිරීම ද මෙම ඒකකය මඟින් සිදුකරන අතර, රූපවාහිනී තිරය මඟින් ලබාදෙන දර්ශන උසස්

තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තාක්‍ෂණික තත්ත්වයන් නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම සිදුකරනු ලබයි.

නඩත්තු ඒකකය විසින් 2020 වර්ෂයේ සිදුකරන ලද නව උපකරණ පරීක්‍ෂා කිරීම් / නව ස්ථාපිත කිරීම් / සාමාන්‍ය හා විශේෂ නඩත්තු කිරීම් / දෝෂ යථා තත්ත්වයට පත් කිරීම්

1) **නව උපකරණ පරීක්‍ෂා කිරීම් - 60**
2) **නව ස්ථාපිත කිරීම්**

    දුරකතන රැහැන් - 01
    ආරක්‍ෂක කැමරා පද්ධති - 02

2) **සාමාන්‍ය හා විශේෂ නඩත්තු කිරීම්**

    කැමරා පටිගත කිරීම් යන්ත්‍ර

3) **දෝෂ යථා තත්වයට පත් කිරීම්**

    කැමරා පටිගත කිරීම් යන්ත්‍ර, දෘශ්‍ය වාහිනී යන්ත්‍ර, ශබ්ද වාහිනී යන්ත්‍ර, කැමරා විදුලි සැපයීම් / විදුලි ආරෝපණ යන්ත්‍ර, විදුලි ආලෝකකරණ භාණ්ඩ, දුරකතන හා දුරකතන රැහැන්, ආරක්‍ෂක කැමරා පද්ධති

සංස්ථාවේ දුරකතන ආශ්‍රිත සේවා හා අලුත්වැඩියා කටයුතු 115 ක් පමණ නිවැරදි කර දුරකතන සබඳතා මනා ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු ඉටු කරන ලදී

## විදුලි හා වායුසමීකරණ ඒකකය (Power & Air-conditioning Unit)

ප්‍රධාන ඉංජිනේරු (සම්ප්‍රේෂණ) ගේ අධීක්‍ෂණය යටතට පත් කොට ඇති විදුලි හා වායුසමීකරණ ඒකකය ඉංජිනේරු (විදුලි) ගේ අධීක්‍ෂණයෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

විදුලි හා වායුසමීකරණ ඒකකය විසින් කොළඹ මැදිරි සංකීර්ණයේ ස්ථාපිත කර ඇති පහත සඳහන් ප්‍රධාන විදුලි ජනක යන්ත්‍ර, අඛණ්ඩ බල සැපයුම් (UPS), වායුසමීකරණ පද්ධති හා බාහිර විකාශ බස්රථවල වායුසමීකරණ පද්ධතිවලට අමතරව බාහිර විකාශනාගාරවල ස්ථාපිත කර ඇති විදුලි ජනක යන්ත්‍ර, අඛණ්ඩ බල සැපයුම් (UPS) හා වායුසමීකරණ යන්ත්‍රවල නඩත්තු කටයුතු හා දෝෂ නිවැරදි කිරීම් හා නව ස්ථාපන කටයුතු සිදුකිරීම මෙම ඒකකයේ කාර්යභාරයයි.

ඒ අනුව, 2020 වර්ෂය තුළ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ අත්‍යාවශ්‍යම නඩත්තු කටයුතු පමණක් සිදුකරන ලදී.

## තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ ඒකකය (Information & Communication Technology Unit)

මෙම ඒකකය ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු/තොරතුරු තාක්‍ෂණ/ව්‍යාපෘති) යටතේ වැඩ බලන ඉංජිනේරුවරයෙකුගේ අධීක්‍ෂණයෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ ඒකකය (ICT) මගින් මූලිකව ආයතනයේ ප්‍රාදේශීය ජාලකරණය ද ඇතුළත් සකර්මක සහ අකර්මක උපාංග නඩත්තුව, පරිපාලනය සහ කළමනාකරණය කරනු ලබන අතර ජාතික රූපවාහිනියේ අන්තර්ජාල වෙබ් අඩවිය සහ අන්තර්ජාල වෙබ් අඩවිය නිර්මාණ නඩත්තුව සහ කාලානුරූපීව යාවත්කාලීන කිරීම සිදුකරනු ලැබේ.

ඊට පරිගණක 315, මුද්‍රණ යන්ත්‍ර 35 ක්, වෙබ් විද්‍යුත් තැපැල යෙදුම්, පැමිණීම සටහන් කිරීමට අදාළ සේවාදායක පරිගණක 15 ක් ඇතුළත් වේ.

ආයතනික වශයෙන් අවශ්‍ය පරිගණක මෘදුකාංග නිර්මාණය සහ සැකසීම ද ඊට අදාළ දත්ත ගබඩා සැකසීම, නඩත්තුව, කළමනාකරණය කිරීම ද තොරතුරු තාක්‍ෂණ ඒකකය මගින් සිදුකරනු ලැබේ.

පසුගිය වසර තුළ තොරතුරු තාක්‍ෂණ ඒකකය මගින් පහත සඳහන් කාර්යභාරයන් සිදුකරන ලදී.

1. දෘශ්‍ය චලන රූප, You tube මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය මගින් නව ආදායම් මාර්ග හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය හා නව You tube නාලිකා 2 ක් පමණ ආරම්භ කිරීම
2. යාවත්කාලීන කරනලද රූපවාහිනී වෙබ් අඩවිය නැවත දියත් කිරීම සහ ජාතික පාසල වැඩසටහන හා නැණ මිහිර ඔස්සේ විකාශිත අධ්‍යාපනික වැඩසටහන් මාලාව අදාළ දෘශ්‍ය චලන රූප වෙබ් අඩවිය මගින් බාගත කිරීමට පහසුකම් සැලසීම
3. වැඩසටහන් නිෂ්පාදකවරුන් ඔවුන්ගේ වැඩසටහන්වල වෙබ් අඩවි සහ සමාජ ජාල මාධ්‍ය ක්‍රමවේදයන් භාවිතය සහ ප්‍රචාරණය කිරීම සහ දැනුවත් කිරීම
4. විවිධ සජීව ක්‍රීඩා විකාශයන්ට (පාපැදි, මෝටර් ධාවන, ක්‍රිකට්, රගර්, අත්පන්දු, පිහිනුම්), ප්‍රශ්න විචාරාත්මක තරග, Reality වැඩසටහන්වල මැතිවරණ ප්‍රතිඵල විකාශයන්වලට අවශ්‍ය පරිගණක මාධ්‍යරූප මෘදුකාංග නිපදවීම සහ ක්‍රියාත්මක කිරීම
5. සමාජ සත්කාරක වැඩසටහනක් ලෙස කොවිඩ් - 19 රෝගයට අදාළව යහපත් සෞඛ්‍ය පුරුදු භාවිතය පිළිබඳ සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ නිරන්තරයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා කෙටි පූරක හා පණිවුඩ මුදාහැරීම

## සිවිල් ඉංජිනේරු ඒකකය (Civil Engineering Unit)

ප්‍රධාන කාර්යාලයේ සහ බාහිර විකාශනාගාරවල සිවිල් ඉංජිනේරු නඩත්තු කටයුතු පවත්වාගෙනයාම සිවිල් ඉංජිනේරු ඒකකයේ කාර්යභාරය වේ.
මෙම ඒකකය වැඩබලන ඉංජිනේරුවරයෙකුගේ අධීක්ෂණයෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.
පසුගිය වසර තුළ සිවිල් ඉංජිනේරු ඒකකය මගින් පහත සඳහන් කාර්යභාරයන් සිදුකරන ලදී.

1. නඩත්තු I ඒකකයේ සිවිලිම අලුත්වැඩියා කිරීම
2. ප්‍රධාන පාලක මැදිරියෙහි වෙන් කිරීම් සිදුකිරීම

## උපකරණ හා මිලදී ගැනීම්

❖ **භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ඉංජිනේරු අංශය සඳහා නව උපකරණ මිලදී ගැනීම**

2019 සහ 2020 වසරවල දී ආරම්භ කරනලද පහත සඳහන් ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියන් අවසාන අදියරේ පවතින අතර, අදාළ ඇණවුම් කිරීම් ද මේ වනවිට අවසන් කර ඇත.

| මිලදීගැනීම | රු. |
|---|---|
| බාහිර විකාශ සඳහා HD කැමරා 06ක් ,Tripod හා අදාල උපාංග සමග මිලදීගැනීම | රු .මිලියන 109 |
| මැදිරි අංක 03සඳහා HD කැමරා 04ක් ,Tripod සහ අදාළ උපාංග සමග මිලදීගැනීම | රු .මිලියන 42 |
| මැදිරි අංක 03 සඳහා ඩිජිටල් දෘශ්‍ය සංකලන පද්ධතියක් )Vision Mixer ( මිලදිගැනීම් | රු .මිලියන 22 |
| ප්‍රවෘත්ති මැදිරියේ තාක්ෂණික පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පරිගණක පද්ධතියක් )News Room Computer System (මිලදී ගැනීම | රු .මිලියන 48 |

## අලෙවි අංශය

අලෙවි අංශයේ අංශ ප්‍රධානී අධ්‍යක්ෂ (අලෙවි) වේ. කළමණාකරණයෙහි පහසුව සඳහා මෙම අංශය පහත ඒකක වලින් සමන්විත වේ.

1. අලෙවි ඒකකය
2. උපලේඛන ඒකකය
3. අලෙවි ප්‍රවර්ධන ඒකකය
4. ප්‍රචාරක හ මාධ්‍ය ඒකකය
5. අලෙවි නිෂ්පාදන ඒකකය
6. පරිපාලන ඒකකය

2020 වසරේ අලෙවි අංශය රූපවාහිනී, නේත්‍රා සහ චැනල් අයි නාලිකාවල ගුවන් කාලය විකිණීමෙන් ලබා ඇති සමස්ථ ආදායම රු. 1,186,132,388.12 ක් වන අතර, සේවා දායකයින්ගෙන් අය කර ගන්නා ලද සමස්ථ මුදල් ප්‍රමාණය රු. 1,229,719,242.80 කි.

2020 වසරේ ආදායම වර්ධනය කර ගැනීමෙහිලා පහත වැඩසටහන් විශේෂයෙන් දායක වී ඇත.

* සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද
* වෙසක් උත්සවය
* පොසොන් උත්සව
* ක්‍රිකට් තරඟ
* ළමා දිනය
* රූපවාහිනී සුපර් බෝල් සංගීත ප්‍රසංග මාලාව
* මැතිවරණ ප්‍රථිපල විශේෂ විකාශය

ඉහත වැඩසටහන් අතරින් බටහිර ඉන්දීය කොදෙව් ක්‍රිකට් කණ්ඩායමේ ශ්‍රී ලංකා ක්‍රිකට් සංචාරය සඳහා රු.46,299,500/- ක්ද, ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ඉන්දියානු ක්‍රිකට් සංචාරය සඳහා රු.18,515,000/- ක්ද, රූපවාහිනී සුපර් බෝල් සංගීත ප්‍රසංග මාලාව සඳහා රු. 17,600,000/- ක්ද, පාර්ලිමේන්තු මැතිවරණයේ විශේෂ ප්‍රථිපල විකාශන වැඩසටහන සඳහා රු. 14,963,777.71 ක්ද, ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ දකුණු අප්‍රිකානු ක්‍රිකට් සංචාරය සඳහා රු.8,500,000/- ක්ද, වශයෙන් ඉහළ ආදායම් ලබා ගැනීමට හැකි විය. එමෙන්ම පැවති කොරෝනා වසංගත තත්වය හමුවේ වුවද, සිංහල හා දෙමළ අලුත් අවුරුදු වැඩසටහන වෙනුවෙන්

රු.4,943,750/- ක්ද, වෙසක් උත්සවය වෙනුවෙන් රු.3,407,407/- ක්ද, පොසොන් උත්සවය වෙනුවෙන් රු. 2,743,518/- ක ආදායම් මුදලක් ද ලබා ගැනීමට හැකි විය.

- සේවාදායකයින්ගේ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කර ප්‍රචාරය කිරීමෙන් හා අනුග්‍රාහකයින් ලබා ගැනීමෙන් අමතර ආදායම් ලබා ඇත.

- සේවාදායක ආයතන සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම තුළින් සේවා දායකයන්ගෙන් ලබා ගන්නා ලද වෙළඳ දැන්වීම් නිවැරදිව උපලේඛන ගත කර විකාශය කිරීමට කටයුතු සලස්වා ඇත. ආදායම් ඉලක්ක සපුරා ගැනීමට සහායවීම උපලේඛන ඒකකයේ කාර්ය භාරය වේ. 2020 වසරේදී උපලේඛන ඒකකය විසින් දැන්වීම් 136,650 ක් උපලේඛන ගත කර ඇත.

- තවද සංස්ථාවේ වැඩසටහන් අඩංගු ඩී වී ඩී පිටපත් අලෙවි කිරීම තුළින් රුපියල් 1,660,152.00 ක පමණ වාර්ෂික ආදායමක් උපයා ගෙන තිබේ. එමෙන්ම නැණ මිහිර ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍ර කට්ටල අලෙවි කිරීමෙන් රුපියල් 19,501,935.00 ක ආදායමක් ලබා ගෙන ඇත.

- රූපවාහිනියේ විකාශය වූ වැඩසටහන් වල පිටපත් සහ පුස්තකාල දර්ශන 2020 වර්ෂය තුළදී අලෙවියෙන් ලැබූ ආදායම රුපියල් 394,879.99 කි.

- පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රූපවාහිනී සංස්ථාව විසින් සේවාදායක අනුග්‍රාහකත්වයන් මත වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය පමණක් ක්‍රියාත්මක කිරීමට හැකි වූ අතර, සුන්දර නුවරඑළිය, සැළලිහිණි වසන්තය, සද්ධර්ම වර්ෂා පොසොන් උත්සවය, ක්‍රිකට් ප්‍රවර්ධන වැඩසටහන් මෙන්ම කටුකුරුන්ද Comando Challenge, Fox Hill මෝටර් රථ තරඟාවලිය මත ප්‍රවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

- 2020 වසර තුළ ද නාලිකා ප්‍රවර්ධනය සහ රූපවාහිනී වැඩසටහන් ප්‍රචාරය සඳහා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රචාරක කටයුතු ප්‍රචාරක හා මාධ්‍ය ඒකකය මඟින් දියත් කෙරිණි.

- වර්ෂය පුරා විධිමත් සැලසුමක් යටතේ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා ප්‍රේක්ෂක වර්ධනය සඳහා ප්‍රචාරක දැන්වීම් සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන මාධ්‍ය වලින් පළ කෙරිණ.

ලොතරැයි වැඩසටහන්, සේවාදායක ප්‍රවර්ධන වැඩසටහන් හා සෙසු අලෙවි වැඩසටහන් නිෂ්පාදනය හා ඒ ඒ වැඩසටහන්වලට අදාළ පූර්ව ප්‍රචාරක පට සැකසීම අලෙවි වැඩසටහන් නිෂ්පාදන ඒකකය මගින් සිදු කෙරේ. තවද දිනපතා ලොතරැයි දිනුම් ඇදීමේ නිෂ්පාදන සිදු වන අතර පසුගිය වසරේ දිනුම් ඇදීම් හා අනෙකුත් අලෙවි නිෂ්පාදන කටයුතු තුලින් රු. 134,471,851.85 ආදායමක් ලබා ගැනීමට අලෙවි නිෂ්පාදන අංශය දායක වී ඇත.

# පරිපාලන අංශය


සංස්ථාවේ සියළුම පරිපාලන කටයුතු සභාපති, අධ්‍යක්ෂ ජනරාල්තුමන්ගේ අනුදැනුම යටතේ පරිපාලන අංශය වෙතින් සිදු කරනු ලබයි.

පරිපාලන අංශය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) යටතේ පාලනය වේ.

**පරිපාලන අංශය යටතේ ඇති ඒකක**

01. පරිපාලන ඒකකය
02. පිළිගැනීමේ ඒකකය
03. ලේඛණාගාරය
04. ප්‍රවාහන ඒකකය
05. ආරක්ෂක ඒකකය
06. පර්යේෂණ හා පුහුණු ඒකකය
07. නීති පරිපාලන ඒකකය
08. අභ්‍යන්තර විගණන ඒකකය - සභාපතිතුමාගේ සෘජු අධික්ෂණය යටතේ
09. පුස්තකාලය
10. ජාත්‍යන්තර සබඳතා ඒකකය

## පරිපාලන ඒකකයේ සංවිධාන ව්‍යුහය



## පරිපාලන ඒකකය මගින් සිදු කරනු ලබන කාර්යයන්

01. සංස්ථාවේ සියළුම නිලධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වා ගෙන යාම

02. සංස්ථා කාර්ය මණ්ඩලය සඳහා නව නිලධාරින් බඳවා ගැනීම.

03. සංස්ථා නිලධාරින්ගේ උසස්වීම්/වාර්ෂික වැටුප් වැඩිවීම සහ ස්ථාන මාරුවීම් ලබා දීම.

04. ජනමාධ්‍ය අමාත්‍යාංශය ඇතුළු බාහිර ආයතන විසින් ඉල්ලුම් කරනු ලබන තොරතුරු හා වාර්තා ලබාදීම.

05. සංස්ථාවේ සියළුම උත්සව සංවිධාන කටයුතු සිදු කිරීම.

06. සංස්ථා නිලධාරින්ගේ විනය පාලනය කිරිම සම්බන්ධ රාජකාරි කටයුතු සිදු කිරිම.

07. විදේශීය පුහුණු පාඨමාලා,විදේශීය සම්මන්ත්‍රණ, සමුළු,රැස්වීම් , අධ්‍යාපන චාරිකා,වැඩමුළු,ආවරණ කටයුතු සඳහා නිලධාරින් යොමු කිරිම හා ඒ හා සම්බන්ධ රාජකාරි කටයුතු.

08. බාහිර ආයතනවල (අධ්‍යාපන හා වෘත්තීය) ශිෂ්‍යයින්ට පුහුණුව සඳහා අවස්ථා සලසා දීම හා ඔවුන් අදාළ අංශ වෙත යොමු කිරිම.

09. සංස්ථාවේ සියලුම නිලධාරින්ගේ නිවාඩු ,හදිසි අනතුරු නිවාඩු, ප්‍රසූත නිවාඩු, විශේෂ හා රාජකාරි නිවාඩු, රටින් බැහැර පෞද්ගලික හා රාජකාරි නිවාඩු සම්බන්ධ රාජකාරි සිදු කිරිම.

10. සංස්ථා නිලධාරින්ගේ සුභ සාධනය සඳහා වෛද්‍ය රක්ෂණ පහසුකම් හා ණය පහසුකම් ලබා දීම අතුලු අනෙකුත් සුභ සාධන කටයුතු සිදු කිරිම.

11. සංස්ථා නිලධාරින්ගේ සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සම්බන්ධ රාජකාරි කටයුතු සිදු කිරීම.

12. නිල හැඳුණුම්පත් ,නිල ඇඳුම් ලබා දීම සම්බන්ධ රාජකාරි කටයුතු

13. සංස්ථාවේ විවිධ අංශවලට අවශ්‍ය පානිය ජලය සහ පුවත්පත් ගෙන්වීම හා බෙදා හැරිම

14. සංස්ථා දුරකථන හා තැපැල් සම්බන්ධ රාජකාරි කටයුතු

## කොවිඩ් - 19 වෛරස් රෝග ව්‍යාප්තිය හමුවේ පරිපාලන අංශය විසින් සිදු කල විශේෂ කාර්යයන්

කොවිඩ් - 19 වෛරස් රෝග ව්‍යාප්තියත් සමග 2020 මාර්තු 20 දින සිට රජය විසින් දිවයින පුරා ඇඳිරි නීතිය පනවනු ලැබූ අතර එම ඇඳිරි නීතිය බස්නාහිර පළාත තුල මාස 02කට අධික කාලයක් අඛන්ඩව ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකාව තුල කොරෝනා රෝගය වසංගත තත්ත්වයක් දක්වා වර්ධනය වීම වලක්වාගනු පිණිස රජය විසින් ක්‍රියාමාර්ග ගෙන තිබූ අවස්ථාවක රජයේ ප්‍රමුඛ විද්‍යුත් මාධ්‍ය ආයතනය වශයෙන් රූපවාහිනි සංස්ථාව වෙතද විශාල කාර්ය භාරයක් පැවරී තිබුනි. එනම් රෝග පාලනය සම්බන්ධයෙන් රජය විසින් වරින් වර ගනු ලබන තීරණ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සහ කොවිඩ් - 19 රෝග ව්‍යාප්තිය වැලැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමයි.

කොවිඩ් - 19 වෛරස් රෝග තත්ත්වය පාලනය කිරීමෙන් පසු 2020.09.01 දින නැවත සංස්ථාවේ දෛනික රාජකාරි කටයුතු යථා තත්ත්වයට පත් වුවද රෝග තත්ත්වය නැවතත් උත්සන්නවීමත් සමග 2020.10.20 දින සිට යලිත් සංස්ථාවේ රාජකාරි කටයුතු විශේෂ සේවා මුර ක්‍රමයත් මත සිදු කිරීමට ක්‍රියා කරන ලදී. ඉහත සඳහන් අවස්ථා දෙකෙහිදීම සංස්ථාවේ දෛනික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සභාපතිතුමා හා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් මත පරිපාලන අංශය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- සංස්ථාවේ අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සංස්ථාවේ විවිධ අංශවල විශේෂ සේවා මුර ක්‍රමයක් මත නිලධාරීන් සේවයට කැඳවීම සඳහා සේවා මුර සකස් කිරීම සඳහා අදාල සම්බන්ධිකරණ කටයුතු සිදු කිරීම.
- පොදු ප්‍රවාහන සේවා නිසි පරිදි ක්‍රියාත්මක නොවූ තත්ත්වයක් යටතේ සේවයට වාර්තා කළ නිලධාරීන් සඳහා සංස්ථා ප්‍රවාහන ඒකකය හරහා විශේෂ ප්‍රවාහන පහසුකම් සැපයීමට අදාලව ක්‍රියා කිරීම.
- සේවයට වාර්තා කල සංස්ථා නිලධාරීන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. (නිලධාරින් දැනුවත් කිරීම, මුහුණු ආවරණ ලබාදීම, විෂබීජ නාශක දියර ලබාදීම යනාදිය.)

## 2020 වර්ෂය අවසානයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

### 2020.12.31 දිනට සේවක සංඛ්‍යාව

| සේවා පදනම | සේවක සංඛ්‍යාව |
|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලය | 867 |
| කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය | 18 |
| සේවා පැවරුම් කාර්ය මණ්ඩලය | 09 |
| **මුළු සේවක සංඛ්‍යාව** | **894** |

### අනුමත කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| **අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව** | **1041** |
| **අනුමත** කොන්ත්‍රාත් සේවක **සංඛ්‍යාව** | **8** |
| **අනුමත මුළු සේවක සංඛ්‍යාව** | **1049** |

### 2020 වර්ෂයේ නව බඳවා ගැනීම්

| | | |
|---|---|---|
| ස්ථිර පදනම මත | 03 | (ද්විතීයන පදනමින් සහ නැවත සේවයහි පිහිටුවීමෙන්) |
| කොන්ත්‍රාත් පදනම මත | 02 | |
| සේවා පැවරුම් | 01 | |
| **මුළු බඳවා ගැනීම්** | **06** | |

### 2020 වර්ෂයේ විශ්‍රාම යාම සම්බන්ධ තොරතුරු

2019 වර්ෂයේ විශ්‍රාම ලැබූ නිලධාරින් සංඛ්‍යාව 19

## රක්ෂණ ප්‍රතිලාභ

2020 වසරේ ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක වුයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ගිවිස ගත් වෛද්‍ය රක්ෂණාවරණය, ගිණි රක්ෂණ හා සියළු අවදානම් රක්ෂණ ක්‍රමයන්ය.

එමගින්,

- ❖ රෝහල් හා සැත්කම් රක්ෂණ ආවරණය (නේවාසික රෝහල් බිලපත්, බාහිර රෝහල් බිල්පත්, ඇස්කණ්නාඩි බිල්පත්)
- ❖ අසාධ්‍ය රෝග රක්ෂණය
- ❖ හදිසි අනතුරු රක්ෂණය
- ❖ ගිණි රක්ෂණ හා සියලු අවදානම් රක්ෂණ යන ක්ෂේත්‍ර ආවරණය වේ

## 2020 වර්ෂයේදී මෙම සංස්ථාවේ නිලධාරින් සහභාගී වු විදේශ නිල සංචාර

කොවිඩ් - 19 වසංගත රෝග තත්ත්වය ලොව පුරා ව්‍යාප්තව පැවතීම හේතුවෙන් 2020 පෙබරවාරි මාසයට පසු සංස්ථා නිලධාරීන් විදේශ සංචාරයේ නිරත වී නොමැත.2020 වර්ෂයේ දී ජනවාරි මස තුළ විදෙස් අධ්‍යාපනික චාරිකා,සමුළු,රැස්වීම්, අධ්‍යන චාරිකා පිණිස විදෙස් සංචාරයන්හි නිරත වූ නිලධාරීන් වෙනුවෙන් සංස්ථාව විසින් රු.68 092 ක මුදලක් වැය කොට ඇත.

පුහුණු වැඩමුළු සඳහා විදෙස් සංචාරයන්හි නිරත වූ නිලධාරීන් වෙනුවෙන් රු.185 833 ක මුදලක් සංස්ථාව විසින් වැය කර තිබේ.

## 2020 වර්ෂයේ පැවති උත්සව සංවත්සරික කටයුතු

- ✓ 2019 වර්ෂයේ යෙදුණු රූපවාහිනී 38 වන සංවත්සරය වෙනුවෙන් පැවැත්වුණු පිරිත් පිංකම සහ දානමය පිංකම පෙබරවාරි මස 14 සහ15 වැනි දිනවල සිදුකිරීම.

## <u>ප්‍රවාහන ඒකකය</u>

ප්‍රවාහන ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ දෛනිකව ලැබෙන ප්‍රවාහන අයදුම්පත් සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීම වේ. (ජනාධිපතිතුමාගේ ආවරණ, අග්‍රාමාත්‍යතුමාගේ ආවරණ සහ බාහිර විකාශන රාජකාරි ඇතුලත්ව)

ඊට අමතරව සංස්ථා වාහන අළුත්වැඩියා කිරීම, ඉන්ධන ලබා ගැනීම, රක්ෂණය කිරීම, ලියාපදිංචි කිරීම, වාහන අනතුරු අළුත්වැඩියාව හා වන්දි හිමිකම් ලබා ගැනීම සම්බන්ධ රාජකාරි සහ කුලී පදනම මත ලබාගත් වාහන වල රාජකාරි අප ඒකකය මඟින් ඉටු කරනු ලබයි. මෙම ඒකකය ප්‍රවාහන නිලධාරී යටතේ පාලනය වන අතර කළමනාකාර සහකාර වරයෙකු ද , මෝටර් කාර්මිකයන් දෙදෙනෙකු ද, එක් පැස්සුම්කරුවෙකු ද සේවයේ යෙදී සිටී. එමෙන්ම ජ්‍යෙ.රියදුරුවරුන් 13 ක්ද , රියදුරුවරුන් 21 ක්ද, කොන්ත්‍රාත් පදනම යටතේ රියදුරුවරු 3 ක්ද සේවය කරයි.

### 2020 වර්ෂයේ සිදුකල විශේෂ රාජකාරි.

සංස්ථාවේ රාජකාරි ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා පැවති අයහපත් තත්වය මත 2020 වර්ෂයේ සංස්ථා නිලධාරින් රාජකාරි සඳහා රැගෙන ඒම සහ රැගෙන යාම සිදුකරන ලදී.

## <u>ආරක්‍ෂක ඒකකය</u>

සංස්ථා භූමිය සහ දේපල ආරක්‍ෂා කිරිමත්, සේවක නිලධාරින්ගේ ආරක්‍ෂාව සැපයීමත්, ආරක්‍ෂක ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වන අතර ඒ හා සම්බන්ධ සියළු කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

### කාර්යභාරය

- පුද්ගලයින් සහ දේපල ආරක්‍ෂාවට අවශ්‍ය පියවර ගැනීම.
- එමෙන්ම සංස්ථාවෙන් පිටට ගෙනයන සංස්ථා ජංගම දේපල (ඕබී බස්රථය සහ වාහන) වැඩසටහන් බාහිර පටිගත කරන ස්ථානයන් රැකබලා ගැනීම.

**තනතුරු නාම.**

01. ප්‍රධාන ආරක්ෂක නිලධාරී - 01 (මේ වනවිට නියෝජ්‍ය අධ්‍යක්ෂ මහජන සම්බන්ධතා /පරිපාලන) විසින් කටයුතු අධීක්ෂණය කරනු ලැබේ)

02. රූපවාහිනී ආරක්ෂක නිලධාරීන් - 04

03. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර. - 01

04. කාර්යාල කාර්ය සහායක - 01

**<u>මහජන සම්බන්ධතා සහ සුබසාධන ඒකකය</u>**

සංස්ථාවෙන් සේවාවන් ලබාගැනීමට මෙන්ම ඉහල කළමනාකරණය හමුවීමට පැමිණෙන අමුත්තන් සහ මහජනතාවට එම කටයුතු පහසු කරගැනීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම. සංස්ථාව සහ බාහිර පාර්ශවයන්, ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම.

**තනතුරු නාම.**

01.නියෝජ්‍ය අධ්‍යක්ෂ (මහජන සම්බන්ධතා)

02.පිළිගැනීමේ නිළධාරිනියන්

**නියෝජ්‍ය අධ්‍යක්ෂ මහජන සම්බන්ධතා සහ සුබසාධන.**

සංස්ථාව සහ බාහිර පාර්ශවයන් සමග සම්බන්ධීකරණ කටයුතු. සංස්ථා සේවකයින්ගේ සුබසාධන කටයුතු.

**පිළිගැනීමේ නිළධාරිනියන්**

සංස්ථාවට පැමිණෙන අමුත්තන්, වැඩසටහන් වලට සහභාගි වන්නන් මෙන්ම ප්‍රභූවරුන් පිළිගෙන ඔවුන්ගේ රාජකාරි පහසු කිරීම.

## නීති පරිපාලන ඒකකය

සංස්ථා ආයතනික සැලැස්ම ප්‍රකාර නීති පරිපාලන ඒකකය සංස්ථාවේ පරිපාලන අංශය යටතේ ක්‍රියාත්මක වන ඒකකයක් වේ. මෙම ඒකකයේ අනෙකුත් කාරණා අතරින් ප්‍රධාන වශයෙන් සංස්ථාව විසින් බාහිර සේවා දායකයින් මෙන්ම අභ්‍යන්තර සේවකයන් සමග සිදුකරනු ලබන ගණුදෙනු වලදී අදාල ගිවිසුම් සකස් කොට ඒ හා සම්බන්ධ කටයුතු සිදුකිරිමක් කරනු ලැබේ. එසේම විවිධ අධිකරණයන්හිදී සංස්ථාවට එරෙහිව හා සංස්ථාව විසින් පවරනු ලබන නීති කෘත්‍යයන් වලට සංස්ථාව වෙනුවෙන් සියලු අධිකරණයන්, විනිශ්චය සභා, කොමිෂන් සභා ඉදිරියේ පෙනී සිටීම සහ සංස්ථාවේ ඉහළ කළමණාකාරිත්වයට අවශ්‍ය නීති උපදෙස් ලබාදීම සිදු කරනු ලැබේ.

ඒ අනුව 2020 වර්ෂය අවසන් වනවිට සේවාදායක ණයගැතියන් 24 දෙනෙක් සඳහා රු 43,060,158.21 ක මුදලක් අයකර ගැනිම සඳහා නඩු පවරා ඇත. එයින් 2020 වර්ෂය අවසන් වනවිට රු 2,335,435.13 ක මුදලක් අයකර ගෙන ඇත. තවද මෙයින් නඩුකර දෙක(02)ක් 2020 වර්ෂයේදීම සමථයට පත් වූ අතර එකී සමථයන්ට අදාලව එම පාර්ශ්වයන් විසින් මුදල් ගෙවා ගෙනයාම සිදු කරනු ලැබේ.

එසේම මෙම සංස්ථාව විසින් සේවකයන්ට හෝ බාහිර පාර්ශ්වයන්ට එරෙහිව රුපියල් 11,191,484.17 මුදලක් අයකර ගැනිම සඳහා නඩු දෙක(02) ක් පවරා ඇති අතර එකී නඩුකර දෙකම තවම විභාගය වෙමින් පවති.

තවද මෙම සංස්ථාවට එරෙහිව සේවකයින් හෝ බාහිර පාර්ශ්වයන් 17 ක් විසින් කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ සේවකයන් දෙදෙනෙකු පවරා තිබූ නඩු දෙකක් සමථයකට පත් වූ අතර අනෙක් විවිධ කාරණා මත නඩු පවරා ඇති නඩුකර සියල්ල තවමත් විභාග වෙමින් පවති.

## පුස්තකාලය

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ පුස්තකාලය ප්‍රධාන පුස්තකාලයාධිපති යටතේ ක්‍රියාත්මක වේ. එය දර්ශන, පටි හා පොත් වශයෙන් කොටස් 03කින් සමන්විත වේ. මෙහි අනුමත සේවක සංඛ්‍යාව ඇස්තමේන්තුවට අනුව පුස්තකාලයේ කාර්යය මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

- ප්‍රධාන පුස්තකාලයාධිපති (MM 1/1) තනතුරු (01)
- පුස්තකාලයාධිපති (JM 1/1) තනතුරු (03)
- සහකාර පුස්තකාලයාධිපති ( JM 1/1) තනතුරු (02)
- ජ්‍යෙෂ්ඨ පුස්තකාල සහකාර හා පුස්තකාල සහකාර (කළමණාකරන සහකාර)

  (MA 1/2) තනතුරු (09)
- කාර්යාල කාර්ය සහායක (PL/3) තනතුරු (04)

නමුත් දැනට ප්‍රධාන පුස්තකාලයාධිපති හා ජේ. පුස්තකාල සහකාරවරුන් 04 දෙනෙක්ද, පුස්තකාල සහකාරුන් 02 ක්ද, ජේ.කලමණාකර සහකාර වරියක්ද, කලමණාකර සහකාරවරුන් 02 ක්ද, ජේ.කාර්යාල කාර්ය සහායකවරුන් 02ක් සහ එක් කාර්යාල කාර්ය සහායකවරයෙක්ද, වශයෙන් මෙහි කාර්ය මණ්ඩලය 13 ක් වේ.

පුස්තකාලය පරිපාලන අංශය යටතේ ඇති ඒකකයක් වශයෙන් රාජකාරි පවත්වාගෙන යනු ලබයි. සංස්ථාවේ නිෂ්පාදන ක්‍රියාවලියට සේවාවන් සැපයීම සඳහා පුස්තකාලය විශාල මෙහෙවරක් ඉටු කරනු ලබයි. ඒ අනුව විවිධ අවශ්‍යතා යටතේ වැඩසටහන් නිෂ්පාදනයේ සිට විකාශය කර සංරක්ෂණය කිරීම දක්වා වූ සියලුම ක්‍රියාවලීන් මෙයට ඇතුළත් වේ.

රූපවාහිනී පුස්තකාලය සාමාන්‍ය පුස්තකාලවලින් සුවිශේෂී වේ. එම සුවිශේෂී බවට හේතුව වන්නේ එහි පවත්වාගෙන යනු ලබන තොරතුරු මුද්‍රිත සහ ශ්‍රව්‍ය දෘශ්‍ය යන මාධ්‍ය දෙකෙන්ම නිෂ්පාදන ක්‍රියාවලියට දායකත්වයක් ලබාදීමත් විශේෂයෙන් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයේ තොරතුරු ලබාදෙන පුස්තකාලයක් වීමත්ය.

## 2020 වසරේ ව්‍යාපෘතීන්

- සංස්කරණය නොකල දර්ශන සහ සංරක්ෂිත ප්‍රවෘත්ති අයිතමයන් Digital තාක්ෂණයට පිටපත් කර විශේෂයෙන් ප්‍රවෘත්ති නිෂ්පාදනය සඳහා online තාක්ෂණය යටතේ ප්‍රවෘත්ති අංශයට ලබාදීම.(uploading news items & visuals to the news room link)
- කොරියානු රජයෙන් ලබාදෙන ලද RAPA (RAPA – Radio Promotion Association of Korea) යටතේ දෛනිකව විකාශය වන සියලුම වැඩසටහන් විකාශය වන අවස්ථාවේදීම සංරක්ෂණය සඳහා පිටපත් කිරීමේ ක්‍රමවේදයක් ඇතුළත්වන පරිදි දැනටමත් ඉතා සාර්ථක අයුරින් සිදු කරමින් අදාළ කටයුතු කරනු ලැබේ.
- බීටා මාධ්‍යයෙන් පැවති සංරක්ෂණය කල යුතු වැඩසටහන් රාශියක් මේ වන විට XD Cam තාක්ෂණය යටතේ පිටපත් කොට සංරක්ෂණය සඳහා යොමු කර ඇත.
- පොත් පුස්තකාලයේ පොත් සම්බන්ධ තොරතුරු පරිගණක දත්ත සංචිතයකට ඇතුලත් කිරීම සිදුකර ඇත.

## අභ්‍යන්තර විගණන ඒකකය

සංස්ථා සභාපතිගේ සෘජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මක වේ. ගිණුම් හා අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය කිරීමත්, ඒවායේ ක්‍රියාකාරීත්වය, මෙහෙයවීම පිළිබඳ දෝෂ සහගත තත්ත්වයන් පිළිබඳව අදාල අංශ ප්‍රධානීන් වෙත අභ්‍යන්තර විගණන විමසුම් යොමු කිරීමත්, තවදුරටත් අවශ්‍ය අවස්ථා වලදී වැඩිදියුණු කිරීම් හා පවතින තත්ත්වයන් පිළිබඳව ඉහල කළමනාකාරීත්වය වෙත වාර්තා කිරීමත් අභ්‍යන්තර විගණන ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වේ.

### ඒකකයේ තනතුරු නාම සහ සේවක සංඛ්‍යාව

| | |
|---|---|
| විගණන සහකාර | 01 |
| කළමනාකාර සහකාර | 03 |

2020 වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණන වැඩසටහන, පවත්නා මානව හා භෞතික සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පවත්නා කාල වේලාවන් අනුව පූර්ණ වශයෙන් හා නියැදි වශයෙන් පරීක්ෂා කර පාලනාධිකාරය වෙත වාර්තා කර ඇත.

### පර්යේෂණ හා පුහුණු ඒකකය

රූපවාහිනී සංස්ථා දැක්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අදාලව නිෂ්පාදන, ඉංජිනේරු, මානව සම්පත් කළමනාකරණය ඇතුළු විවිධ, ක්ෂේත්‍ර සම්බන්ධ ඉලක්ක සපුරා ගැනිමට අවශ්‍ය පර්යේෂ හා පුහුණු සිදු කිරීම මෙම ඒකකයේ මූලික කර්තව්‍යය ලෙස හඳුනාගෙන ඇත.

මෙම ඒකකය නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ඒකක ප්‍රධානියෙකු හා පර්යේෂණ නිලධාරීන් 4 දෙනෙකුගෙන් සමන්විත අතර එක් කාර්යාල කාර්ය සහයකයෙකු සේවයේ යෙදී සිටී.

### 2020 වර්ෂය තුළ සිදු කළ පුහුණු වැඩසටහන්

2020 වර්ෂය තුළ විශ්ව විද්‍යාල,කාර්මික විද්‍යාල සහ වෙනත් බාහිර අධ්‍යාපන ආයතන මඟින් පැමිණි සිසුන් 35 දෙනෙකු සඳහා පර්යේෂණ හා පුහුණු ඒකකයේ අධීක්ෂණය යටතේ සංස්ථාවේ විවිධ අංශයන්ට යොමු කර පුහුණුව ලබා දෙන ලදී.

## 2020 වර්ෂය තුළ සිදු කරන ලද සමීක්ෂණ හා පර්යේෂණ

- සිහිනයකි රෑ වැඩසටහන සඳහා පවතින ප්‍රේක්ෂක ප්‍රතිචාර පිළිබඳව විමසා බැලීමේ සමීක්ෂණයක් සිදු කරන ලදී.(2020 ජනවාරි මස)
- රාත්‍රී 9-9.30 කාල පරාසය තුළ එක් එක් නාලිකාවන් සඳහා පවතින ප්‍රේක්ෂක ප්‍රතිචාරය පිළිබඳව විමසා බැලීමේ සමීක්ෂණයක් සිදු කරන ලදී.(2020 ජනවාරි මස)
- අහඹු ලෙස තෝරාගත් ප්‍රේක්ෂකයින් 100 දෙනෙකුට ලබා දුන් දුරකථන ඇමතුම් හරහා එක් එක් නාලිකාව කෙරෙහි පවතින ප්‍රේක්ෂක ප්‍රතිචාරය පිළිබඳව විමසා බැලීමේ සමීක්ෂණයක් සිදු කරන ලදී.
- ජාතික රූපවාහිනියේ දෘශ්‍යතාවය සම්බන්ධයෙන් ජාතික රූපවාහිනී ප්‍රාදේශීය වාර්තාකරුවන් මාර්ගයෙන් ලබාගත් තොරතුරු මඟින් සමීක්ෂණයක් සිදු කරන ලදී.
- රූපවාහිනී නාලිකා සඳහා පවතින ප්‍රේක්ෂක ප්‍රතිචාරය විමසා බැලීමේ සමීක්ෂණයක් අන්තර්ජාලය මඟින් සිදු කිරීම.
- එමෙන්ම පර්යේෂණ හා පුහුණු ඒකකයේ සමීක්ෂණ වාර්තා දත්ත හා LMRB දත්ත වාර්තා අතර සන්සන්දනාත්මක විශ්ලේෂණයක් සිදු කරන ලදී.
- මීට අමතරව සභාපතිතුමාගේ නියමය පරිදි කොවිඩ් 19 වෛරසය පිළිබඳ වාර්තාවක් තෝරාගත් රටවල් තිහිපයක් ඇසුරින් සකස් කර සභාපතිතුමාට භාර දෙන ලදී.

## <u>ගුවන් කාල විශ්ලේෂණය (2020)</u>

## ගුවන් කාල විශ්ලේෂණය - 2020

### ජාතික රූපවාහිනිය

| වර්ෂය | වැඩසටහන් සඳහා (පැය) | % | වෙළඳ දැන්වීම් සඳහා (පැය) | % | මුළු පැය ගණන |
|---|---|---|---|---|---|
| 2020 | 5915.4 | 93.4 | 420.5 | 6.6 | 6335.9 |

### වෙළඳ ගුවන් කාලය

| වර්ෂය | වෙළඳ දැන්වීම් | % | මිල ගෙවූ වෙළඳ දැන්වීම් | % | නොමිලේ විකාශිත දැන්වීම් | % | මුළු පැය ගණන |
|---|---|---|---|---|---|---|---|
| 2020 | 325.6 | 77.4 | 64.4 | 15.3 | 30.5 | 7.3 | 420.5 |

## භාෂාව අනුව වෙළඳ ගුවන් කාලය

| වර්ෂය | සිංහල (පැය) | % | ඉංග්‍රීසි (පැය) | % | දෙමළ (පැය) | % | වෙනත් (පැය) | % | මුළු පැය ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 | 5550.7 | 93.8 | 271.2 | 4.6 | 2.4 | 0.0 | 91.1 | 1.5 | 5915.4 |

## අනුග්‍රාහක දායකත්වය

ජාතික නාලිකාවේ වැඩසටහන් ගුවන් කාලයෙන් 35.7% ක් (පැය 2109.1) සඳහා අනුග්‍රාහක දායකත්වය තිබේ.

| වැඩසටහන් වර්ගීකරණය | පැය ගණන | % |
|---|---|---|
| අනුග්‍රාහක දායකත්වය සහිත | 2109.1 | 35.7 |
| අනුග්‍රාහක දායකත්වය රහිත | 3806.3 | 64.3 |

## වැඩසටහන් ගුවන්කාල විශ්ලේෂණය

| වැඩසටහන් වර්ගීකරණය | පැය ගණන | % |
|---|---|---|
| **තොරතුරුමය වැඩසටහන්** | | |
| ප්‍රවෘත්ති | 750.1 | 12.7 |
| දේශපාලන | 234.5 | 4 |
| ආර්ථික | 7.6 | 0.1 |
| සමාජීය | 285.8 | 4.8 |
| ආයුබෝවන් | 146.5 | 2.5 |
| | **1424.5** | **24.1** |
| **අධ්‍යාපනික වැඩසටහන්** | | |
| අධ්‍යාපනික | 401.5 | 6.8 |
| වාර්තා | 252.8 | 4.3 |
| කෘෂිකාර්මික | 88.9 | 1.5 |
| ප්‍රශ්න විචාරාත්මක | - | - |
| සඟරාමය | 275.2 | 4.7 |
| | **1018.4** | **17.3** |
| **ළමා වැඩසටහන්** | | |
| ළමා | 267.2 | 4.5 |
| කාටූන් | 125.9 | 2.1 |
| | **393.1** | **6.6** |
| **කාන්තා වැඩසටහන්** | | |
| නුගසෙවන | 496 | 8.4 |
| | **496** | **8.4** |
| **සංස්කෘතික හා ආගමික වැඩසටහන්** | | |
| සංස්කෘතික | 43.8 | 0.7 |
| ආගමික | 372.6 | 6.3 |
| | **416.4** | **7.0** |
| **විනෝදාත්මක වැඩසටහන්** | | |

| | | |
|---|---|---|
| නාට්‍යය<br>මාලා චිත්‍රපට<br>චිත්‍රපට<br>සංගීත<br>විවිධ<br>විනෝද)Comedy) | 512<br>341.8<br>238.5<br>637.3<br>67.6<br>12.2<br>**1809.4** | 8.7<br>5.8<br>4<br>10.8<br>1.1<br>0.2<br>**30.6** |
| **ක්‍රීඩා වැඩසටහන්**<br>ක්‍රීඩා | <br>31.1<br>**31.1** | <br>0.5<br>**0.5** |
| **ප්‍රචාරාත්මක වැඩසටහන්**<br>ප්‍රචාරාත්මක<br>ලොතරැයි | <br>37.4<br>259.8<br>**297.2** | <br>0.6<br>4.4<br>**5.0** |
| **අනිකුත් වැඩසටහන්** | **29.3** | **0.5** |
| **එකතුව** | **5915.4** | **100** |

මෙම වැඩසටහන් වර්ග විසි තතර නැවතත් ප්‍රධාන වැඩසටහන් වර්ග 4 කට වර්ග කළ හැකිය.

| **වැඩසටහන් වර්ගීකරණය** | **පැය ගණන** | **%** |
|---|---|---|
| තොරතුරුමය වැඩසටහන් | 1424.5 | 24.1 |
| අධ්‍යාපනික වැඩසටහන් | 1018.4 | 17.3 |
| විනෝදාස්වාදී වැඩසටහන් | 3443.2 | 58.2 |
| අනිකුත් වැඩසටහන් | 29.3 | 0.5 |
| **එකතුව** | **5915.4** | **100** |

## ගුවන් කාල විශ්ලේෂණය - චැනල් අයි

| වර්ෂය | වැඩසටහන් (පැය) | % | වෙළඳ දැන්වීම් (පැය) | % | මුළු පැය ගණන |
|---|---|---|---|---|---|
| 2020 | 2010.6 | %98.6 | 29.2 | 1.4 | 2039.8 |

## වෙළඳ ගුවන් කාලය

| වර්ෂය | වෙළඳ දැන්වීම්(පැය) | % | මිල ගෙවූ වෙළඳ දැන්වීම්(පැය) | % | මුළු පැය ගණන |
|---|---|---|---|---|---|
| 2020 | 13.2 | 45.2 | 16.0 | 54.8 | 29.2 |

## භාෂාව අනුව ගුවන් කාලය

| වර්ෂය | සිංහල (පැය) | % | දෙමළ (පැය) | % | ඉංග්‍රීසි (පැය) | % | වෙනත් (පැය) | % | මුළු පැය ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 | 92.2 | 4.6 | 16.1 | 0.8 | 1748.1 | 86.9 | 154.2 | 7.7 | 2010.6 |

## අනුග්‍රාහක දායකත්වය

| වැඩසටහන් වර්ගීකරණය | පැය ගණන | % |
|---|---|---|
| අනුග්‍රාහකත්වය සහිත වැඩසටහන් | 655.2 | 32.6 |
| අනුග්‍රාහකත්වය රහිත වැඩසටහන් | 1355.4 | 67.4 |

## වැඩසටහන් ගුවන් කාල විශ්ලේෂණය

| වැඩසටහන් වර්ගීකරණය | පැය ගණන | % |
|---|---|---|
| **තොරතුරුමය වැඩසටහන්** | | |
| ප්‍රවෘත්ති | 146.3 | 7.3 |
| තොරතුරුමය | 26.8 | 1.3 |
| | **173.1** | **8.6** |
| **අධ්‍යාපනික වැඩසටහන්** | | |
| අධ්‍යාපනික | 837.2 | 41.6 |
| වාර්තා | 144.7 | 7.2 |
| සඟරාමය | 126.3 | 6.3 |
| | **1108.2** | **55.1** |
| **ළමා වැඩසටහන්** | | |
| කාටූන් | **92.5** | **4.6** |
| **සංස්කෘතික හා ආගමික වැඩසටහන්** | | |
| ආගමික | **17.8** | **0.9** |
| **විනෝදාස්වාදී වැඩසටහන්** | | |
| චිත්‍රපට | 9.3 | 0.5 |
| සංගීත | 8.6 | 0.4 |
| | **17.9** | **0.9** |
| **ක්‍රීඩා වැඩසටහන්** | | |
| ක්‍රීඩා | **498.1** | **24.8** |
| **ප්‍රචාරාත්මක වැඩසටහන්** | | |
| ප්‍රචාරාත්මක | **97.1** | **4.8** |
| අනිකුත් වැඩසටහන් | **5.9** | **0.3** |
| එකතුව | **2010.6** | **100** |

## වැඩසටහන් ප්‍රධාන වර්ගීකරණය

| වැඩසටහන් වර්ගීකරණය | පැය ගණන | % |
|---|---|---|
| තොරතුරුමය වැඩසටහන් | 173.1 | 8.6 |
| අධ්‍යාපනික වැඩසටහන් | 1108.2 | 55.1 |
| විනෝදාස්වාදී වැඩසටහන් | 723.4 | 36.1 |
| අනිකුත් වැඩසටහන් | 5.9 | 0.3 |
| **එකතුව** | **2010.6** | **100** |

## ගුවන් කාල විශ්ලේෂණය - චැනල් අයි නාලිකාව සහ නේත්‍රා නාලිකාව (2020)

### උදය වරුව (4.00 – 18.00)

| වැඩසටහන් වර්ගය | ජනවාරි | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝ. | සැප් | ඔක්. | නොවැ | දෙසැ | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නේත්‍රා - පනඅධ්‍යා** | 390 | 39 | 131 | 351 | 390 | 377 | 357 | 322 | 377 | 390 | 317 | 390 | **3831** |
| **අයි - සඟරාමය** | 15.5 | 2 | 5 | 14 | 15.5 | 15 | 13.5 | 11.5 | 15 | 15.5 | 15 | 15.5 | **153** |
| **අයි - වාර්තාමය** | | 36 | 40 | | | | | 23 | | | | | **99** |
| **නේත්‍රා - අනුග්‍රාහක වැඩසටහන්** | 15.5 | 2 | 2 | 15 | 15.5 | 15 | 15.5 | 15.5 | 15 | 15.5 | 15 | 15.5 | **157** |
| **ක්‍රීඩා වැඩසටහන්** | | 300 | 243 | 27 | | | 35 | 49 | | | 60 | | **714** |
| **නේත්‍රා - දමිළ චිත්‍රපට** | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | **36** |
| **නේත්‍රා - ආගමික වැඩසටහන්** | 10 | 10 | 10 | 10 | 10 | 10 | 10 | 10 | 10 | 10 | 10 | 10 | **120** |

### සවස් වරුව (18.00 – 22.30)

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අධ්‍යාපන | 31 | 28 | 31 | 30 | 31 | 30 | 31 | 31 | 30 | 31 | 30 | 12 | 346 |
| අයි - සඟරාමය | 6 | 4 | 6 | 5 | 6 | 5 | 6 | 6 | 5 | 6 | 4 | 6 | 65 |
| අයි - විනෝදාස් වාදී | 6 | 4 | 6 | 5 | 7 | 5 | 6 | 6 | 5 | 6 | 4 | 4 | 64 |
| වාර්තාමය | 18 | 21.5 | 16 | 18 | 19 | 17 | 10.5 | 16.5 | 10 | 15 | 3 | 2 | 166.5 |
| නේත්‍රා - දමිළපුවත් | 15.5 | 14.5 | 15.5 | 15 | 15.5 | 15 | 15.5 | 15.5 | 15.5 | 15.5 | 15 | 15.5 | 183.5 |
| නේත්‍රා - දෙමළ නාට්‍ය | 31.5 | 27 | 31.5 | 30 | 31.5 | 30 | 23 | 27 | 30 | 31.5 | 20 | 22.5 | 335.5 |
| ක්‍රීඩා සජීව - | | | | | | | 18 | | 15 | | 35 | 48 | 116 |
| අයි - ඉංග්‍රීසි පුවත් | 15.5 | 14.5 | 15.5 | 15 | 15.5 | 15 | 15.5 | 15.5 | 15.5 | 15.5 | 15 | 15.5 | 183.5 |
| අයි (අනුග්‍රාහක වැඩසටහන් ලොතරැයි | 15.5 | 14 | 15.5 | 15 | 15.5 | 15 | 15.5 | 15.5 | 15 | 15.5 | 15 | 15.5 | 182.5 |
| එකතුව | 573 | 519.5 | 571 | 553 | 575 | 552 | 575 | 567 | 561 | 570 | 561 | 575 | 6752.5 |

## ජාත්‍යන්තර සබඳතා ඒකකය

ජාත්‍යන්තර සබඳතා ඒකකය (International Relation Unit)පරිපාලන අංශය යටතේ පවතින අතර එහි ඒකක ප්‍රධානියකු ( Unit Head) සහ පර්යේෂණ නිලධාරීන් ( Research Officers) දෙදෙනෙකු සහ තාවකාලිකව වසරක කාලයක් සඳහා අනුයුක්ත කළ සහය වැඩසටහන් නිෂ්පාදකවරයකු ( Assistant Producer) සිටී.

ජාත්‍යන්තර සබඳතා ඒකකයේ මූලික කාර්ය වන්නේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව දේශීය සහ විදේශීය වශයෙන් පිහිටා ඇති අන්තර්ජාතික ආයතන සමග සම්බන්ධ කිරීමය. එම ආයතන සහ රූපවාහිනී සංස්ථාව අතර සම්බන්ධීකරණ කටයුතු සහ සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාමය. එමගින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට විවිධ ප්‍රතිලාභ ලබාගැනීමය. නිදසුන් ලෙස ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සියලුම වෘත්තිකයින් හට අන්තර්ජාතික රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ආයතන වලින් ලැබෙන විදේශ ශිෂ්‍යත්ව, වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය සඳහා සුදුසු පිරිස් තෝරා යැවීමේ ක්‍රියාවලිය සංවිධාන කිරීම සහ සම්බන්ධීකරණ කටයුතු ජාත්‍යන්තර සබඳතා ඒකකය මගින් සිදු කරයි. එමෙන්ම ජාත්‍යන්තරව පවතින රූපවාහිනී වැඩසටහන් උළෙලවල් සඳහා සුදුසු රූපවාහිනී වැඩසටහන් තෝරා යැවීමේ ක්‍රියාවලිය ද ජාත්‍යන්තර සබඳතා ඒකකය මගින් සිදු කරනු ලබයි. මීට අමරතරව දේශීය වශයෙන් පවතින ජාත්‍යන්තර රාජ්‍ය සංවිධාන ( තානාපති කාර්යාල) සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධ වී රූපවාහිනී ක්‍රේෂ්ත්‍රයට අදාල කටයුතු කිරීමද ජාත්‍යන්තර සබඳතා ඒකකයේ කාර්ය භාරයකි.

### ඒකකයේ තනතුරු

ඒකක ප්‍රධානී -වැඩසටහන් නිෂ්පාදක
පර්යේෂණ නිලධාරී - 02
සහය නිෂ්පාදක

| | ව්‍යාපෘතිය | රට | විස්තර |
|---|---|---|---|
| 1. | Diploma in Development Journalism ITEC | ඉන්දියා | ඉන්දියානු රජයේ ශිෂ්‍යත්වකි . රූපවාහිනියේ එක් නිළධාරියෙක් සහභාගි විය. |
| 2. | News and current affairs using state of arts tools | ඉන්දියා | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 3. | Workshop on Studio & Newsroom Automation in TV | ඉන්දියා | නිළධාරියෙකු තෝරා ගත්තත් කොවිඩ් තත්වය නිසා එය මග හැරිණි |
| 4. | Muthuhara LS Milan anniversary | ඉතාලිය | කොවිඩ් තත්වය නිසා නොපැවිත්විණි |
| 5. | Media Law and Ethics | මැලේසියා | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 6. | Cinematography for documentary film making | මැලේසියා | එක් නිළධාරියකු නම් කළ ද කොවිඩ් නිසා නොපැවිත්විණි |
| 7. | Regional Workshop on Leading Newsroom Change | තායිලන්තය | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 8. | RNTCSCHOLARSHIP 2020 | නෙදර්ලන්තය | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |

| | | | |
|---|---|---|---|
| 9. | Combating Disinformation/Fake news | බංගලිදේශය | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 10. | INPUT Television Conference 2020 | ජර්මනිය | සංස්ථාවේ වැඩසටහන් 06 කින් රංග බණ්ඩාරනායක මහතා ඉදිරිපත් කළ වැඩසටහනක් මෙහි ප්‍රදර්ශනයට තේරිණි. |
| 11. | AIBD TV AWARDS 2020 | මැලේසියා | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 12. | Japan Prize 2020 | ජපානය | සංස්ථාවේ නිළධාරින්ගේ නිර්මාණ ඉදිරිපත් කෙරිණ |
| 13. | Tokyo Docs | ජපානය | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 14. | ABU PRIZES 2020 | මැලේසියා | සංස්ථාවේ නිළධාරින්ගේ නිර්මාණ ඉදිරිපත් කෙරිණ |
| 15. | Seoul Drama Competition | දකොරියාව. | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 16. | AIBD Media Dialogue on Children Living in Pandemic | WEBINAR | නිෂ්පාදක මොහාන්ජී රංගනාථ , ,සිංහසුරනිමල ජිනේන්ද්‍ර ශිරාන් ,උදාන්ත ගුණතිලක විනෝශා ,ශිරාන්රත්නායක |
| 17. | Webinar on Latest Trends in Visual Archiving &Digitisation | WEBINAR | ඉංජිනේරු අංශයේ තාක්ෂණික නිළධාරී චමිල ජයසුන්දර මහතා සහභාගි විය |
| 18. | DOK Short n’ Sweet 2020-Email sent | | සංස්ථාවේ නිළධාරින්ගේ නිර්මාණ ඉදිරිපත් කෙරිණ |
| 19. | AIBD Webinar on Public Broadcaster and TV Audience Measurement | WEBINAR | පර්යේෂණ හා පුහුණු කිරීම් ඒකකය නිලධාරීන් සහභාගී විය |
| 20. | ABU Children 17th Series | WEBINAR | ළමා අංශයේ නිෂ්පාදක සුරනිමල ජිනේන්ද්‍රසිංහ සහභාගිවිය |
| 21. | Chevening Scholarship | එක්සත් රාජධානිය | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 22. | AIBD Regional Webinar ‘Discussion on Women: Leading in the New Future’ | WEBINAR | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 23. | 9th DELHI SHORTS INTERNATIONAL FILM FESTIVAL-20, INDIA | ඉන්දියා | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 24. | Time to watch a doc film #02 | සංස්ථා සභා ශාලාව | Documentary film screening |
| 25. | HBF Funding | නෙදර්ලන්තය | නිළධාරින් දැනුවත් කරන ලදි |
| 26. | AIBD Empowering Women in Cybersecurity | මැලේසියාව | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 27. | Cyber Crisis Management Planning: How to Reduce Cyber Risk and Increase National Cyber Resilience | WEBINAR | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |

| | | | |
|---|---|---|---|
| 28. | DOK FEST MUNICH, GERMANY 2021 | ජර්මනිය | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 29. | Tokyo Anime Award Festival 2021 Competition | ජපානය | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 30. | FILM SCREENING- WEEKLY | සංස්ථා සභා ශාලාව | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 31. | DW documentaries | ජර්මනිය | මේ යටතේ ජර්මනියේ DW ආයතනයෙන් රූපවාහිනී වැඩසටහන් ලබා ගැනීම |
| 32. | Asiavision Annual Awards 2020 | | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 33. | Mentoring session for Health Journalists | On line workshop | සංස්ථාවේ නිළධාරින් දැනුවත් කරන ලදි |
| 34. | JICA Knowledge Co creation programme | ශ්‍රී ලංකාව | පුහුණු වැඩසටහන |

## ඒකකයේ විසින් සිදු කරණු ලැබූ ව්‍යාපෘති

ජාත්‍යන්තර සබඳතා ඒකකය තානාපති කාර්යාල සමග සිදු කරණු ලබන වැඩසටහන් කිහිපයක් සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදුකරයි. අප විසින් ඉහත දක්වන ලද ක්‍ෂේත්‍ර වලට අදාලව 2020 වසර සඳහා පහත සඳහන් පරිදි ව්‍යාපෘති 34 කට වැඩි ප්‍රමාණයක් ක සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදි. කොවිඩ් වසංගතය නිසා ජාත්‍යන්තර සබඳතා ඒකකයට පෙර වසරට වඩා ව්‍යාපෘති අඩු සංඛ්‍යාවක් සිදු කිරීමට සිදුවිය. විශේෂයෙන්ම සංස්ථාවේ නිළධාරින්ට සහභාගි වීමට තිබූ අවස්ථාවන් ගණනාවක් කොවිඩ් වසංගතය නිසා අවලංගු කෙරිණි. ඇතැම් ඒවා ඔන්ලයින් ක්‍රමයට පවත්වන ලදි.

## ලේඛනාගාරය

01 සංස්ථාවේ සියලු අංශ හා ඒකක වලට අයත් ලිපිගොනු භාර ගැනීම,

02 එම ලේඛන ලේඛනගත කර සංස්ථා ලේඛනාගාරය තුළ ගබඩා කර සංරක්ෂණය කිරීම,

03 ලේඛන අපහරණය සම්බන්ධයෙන් රටේ පවතින නීති රීති වලට යටත්ව අපහරණ ලැයිස්තු සැකසීම,

04 නෛතිකමය හෝ පරිපාලනමය අවශ්‍යතා සඳහා අවශ්‍ය ලිපිගොනු නැවත නිකුත් කිරීම.

ඉහත පරිදි කටයුතු කරමින් සංස්ථා ලේඛනාගාරය 2020 වසර තුළද සංස්ථාවේ පරිපාලන කටයුතු කරගෙන යාමට අවශ්‍ය සහයෝගය අඛණ්ඩව ලබා දී ඇත.

# මුදල් අංශය

ආදායම්, ගෙවීම්, වැටුප්, පොත් තැබීම්, අයකිරීම් සහ පිරිවැය යන ඒකකවලින් මුදල් අංශය සමන්විතයි. මුදල් අංශය යටතේ සැපයුම් අංශය ද කටයුතු කරයි. මුදල් අංශයෙන් සිදු කිරීමට අපේක්ෂිත මූලික කාර්යය වනුයේ සංස්ථාවේ මූල්‍ය කළමනාකරණය සහ මූල්‍යමය වාර්තාකරණයයි.

2020 වර්ෂය තුළ මුදල් අංශයෙහි සෑම ඒකකයක් ම කාර්යක්ෂමව, ඵලදායීව සහ ආර්ථිකමය වශයෙන් උපරිම ප්‍රතිලාභයක් සංස්ථාවට ලැබෙන අයුරින් වගකීමෙන් යුතුව ක්‍රියා කර ඇත. මෙම අංශය සිදු කරන සියලු මූල්‍ය ගනුදෙනු ඉතා අවංකව, විනිවිදභාවයකින් හා ඉලක්කගතව සිදු කර ඇත. සියලු වැඩසටහන් ලිපිගොනු සඳහා නීතිරීතිවලට අනුකූලව, නිෂ්පාදන සහ ප්‍රචාරණ ක්‍රියාවලියට බාධාවක් නොවන පරිදි ගෙවීම් කටයුතු සිදු කර ඇත. වැඩසටහන් අවසන් වූ පසුව ද එම ලිපිගොනු සම්බන්ධයෙන් සොයා බලා බාහිර පාර්ශව වෙත නියමිත වේලාවට අදාළ ගෙවීම් සිදු කර ඇත.

සේවක වැටුප් සහ සියලු අනෙකුත් සේවක ප්‍රතිලාභ කිසිදු ප්‍රමාදයකින් තොරව ගෙවා ඇති අතර වැටුපෙන් අඩු කර වෙනත් ආයතන සඳහා ගෙවිය යුතු වූ ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට හෝ ඊට පෙර ගෙවා ඇත.

ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන ගුවන් කාල විකුණුම් සහ අනෙකුත් ආදායම් යෝග්‍ය ගිණුම්කරණ මූලධර්මයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව වාර්තා කර ඇත.

සංස්ථාවේ වැඩසටහන් නිෂ්පාදනය, මෙහෙයවීම හා විකාශනය (ප්‍රධාන නාලිකාව වන රූපවාහිනිය, අයි නාලිකාව / නේත්‍රා) සඳහා සහාය වන සියලු මිල දී ගැනීම් (ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ හා සේවා) සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට මුදල් අංශය යටතේ ඇති සැපයුම් අංශය වගකීමෙන් යුක්තව 2020 වර්ෂයේදී ද කටයුතු කර ඇත.

ගිණුම්කරණ මූලධර්මයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලද නිරවද්‍ය සහ කාලීන මූල්‍ය හා කළමනාකරණ වාර්තා අනෙකුත් අංශ සහ සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විචක්ෂණ හා ප්‍රතිචාරාත්මක තීරණ ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. මෙම වාර්තා නිතිපතා ඉදිරිපත් කරනු ලබන වාර්තාවලින් සහ විශේෂිත කටයුතු (ad-hoc) සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන වාර්තාවලින් සමන්විත වේ. සියලු ප්‍රධාන මූල්‍ය තීරණයන් ඇගයීම් කිහිපයකට භාජනය කිරීමෙන් පසු එහි අවසන් ප්‍රතිඵල මත නීත්‍යානුකූලව තීරණ ගෙන ඇත. සංස්ථාව අනෙකුත් රාජ්‍ය ආයතන හා සසඳා බලන විට දිගුකාලීන ණය ලබාගෙන නොමැති අතර කෙටිකාලීන ණය ද ලබාගැනීම ඉතාමත් අවම මට්ටමක පවතී. පවතින ව්‍යාපාරික හා ආර්ථික තත්ත්වයන් හමුවේ මූල්‍ය කළමනාකරණය අභියෝගාත්මක කාර්යයක් වේ. කෙසේ වුවත් සංස්ථාවෙහි මූල්‍ය ස්ථාවරත්වය සහ මූල්‍ය කළමනාකරණය සාර්ථක අයුරින් මෙහෙයවා ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය

1971 අංක 38 දරන මුදල් පනත සහ 1982 අංක 06 දරන රූපවාහිනී සංස්ථා පනතෙහි නියමයන්ට අනුකූලව, සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ (මින් පසු "සංස්ථාව"වශයෙන් දක්වා ඇත.) ක්‍රියාකාරකම් පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී උචිත ගිණුම් ප්‍රතිපත්ති හා ප්‍රමිති තෝරා ගෙන, ඒවා ඒකාකාරී ලෙස වර්ෂයක් පුරා උපයෝගී කර ගෙන ඇති අතර සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් හා ඇස්තමේන්තු ද ඒ සඳහා භාවිත කර ඇති බව අධ්‍යක්ෂවරු තහවුරු කරති. ප්‍රමාණාත්මක බලපෑමක් මූල්‍ය ප්‍රකාශන මත ඇති කරවන යම් ගිණුම් ප්‍රතිපත්තියක හෝ ප්‍රමිතියක බැහැර යාමක් සිදුවී තිබිණි නම් ඒ බව හෙළිදරව් කොට, ඒ පිළිබඳ කරුණු පැහැදිළි කර ඇත.

සංස්ථා මෙහෙයුම් ක්‍රියාකාරිත්ව අඛණ්ඩව කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සංස්ථාව සතුව පවතී ද යන්න බැලීමට සංස්ථාවේ අනාගත මූල්‍ය පුරෝකථන, මූල්‍යම ප්‍රවාහ හා වර්තමාන කාර්ය සාධන යන කරුණු අධ්‍යක්ෂවරුන් සමාලෝචනය කර ඇත. අඛණ්ඩ පැවැත්ම යන සංකල්පය මත පිහිටා අධ්‍යක්ෂවරුන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත හා 1971 අංක 38 දරන මුදල් පනතට අනුකූලව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ බවක් පිළිබිඹු කිරීම සඳහා අවශ්‍ය වන පරිදි සංස්ථාව ගිණුම්කරණ වාර්තාව පවත්වා ගෙන ගොස් ඇති බව අධ්‍යක්ෂවරු සහතික වීමෙන් වගකීම භාරගෙන ඇත.

අධ්‍යක්ෂවරු සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට සහ වංචා හා අක්‍රමිකතා හෙළිදරව් වන හා වැළැක්වීමට උචිත වන ආකාරයට අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපනය කිරීමට සාධාරණ ආකාරයකින් කටයුතු කර ඇත.

සිය උපරිම දැනීමේ පරිද්දෙන්, සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු සියලුම බදු හා ගාස්තු ද, සේවකයන් වෙනුවෙන් හා ඔවුන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම දායක මුදල්, ගාස්තු බදු සහ ශේෂ පත්‍රයේ දිනය වන විට ගෙවිය යුතුව තිබෙන විශ්‍රාම පාරිතෝෂික ද ඇතුළුව වෙනත් දන්නා සියලු ව්‍යවස්ථාපිත බැරකම් නිසි ලෙස ගෙවා අවසන් කොට හෝ මූල්‍ය ප්‍රකාශ තුළ උචිත ලෙස වෙන් කිරීම් සපයා ඇති බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරති.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

**වෛද්‍ය නිහාල් ජයතිලක**  
සභාපති  
ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව  
07/04/2021

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ**
2020/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන් | 2020 රු.. | 2019 රු.. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 8 | 466,272,860 | 461,003,970 |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 134,632,066 | 177,226,737 |
| අවශ්‍ය වූ විට අලෙවි කළ හැකි මූල්‍ය වත්කම් ( ආයෝජන ) | | 1,104,000 | 1,104,000 |
| විලම්බිත ආදායම් බදු වත්කම් | | 52,309,095 | 49,834,191 |
| සමාජ සුභසාධන අරමුදල | | 487,717 | 476,775 |
| කල්පිරෙන තෙක් තබාගන්නා මූල්‍ය වත්කම් | 10 | 401,903,990 | 366,019,376 |
| | | **1,056,709,729** | **1,055,665,050** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 11 | 201,080,934 | 204,516,673 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 12 | 394,754,279 | 417,254,118 |
| ණය සහ ලැබිය යුතු දෑ | 13 | 158,298,867 | 177,809,600 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | 14 | 192,092,628 | 253,460,622 |
| ඉදිරියට කළ ගෙවීම් | | 2,244,954 | 1,466,258 |
| මුදල් හා මුදල් සමාන දෑ | 15 | 155,413,812 | 1,147,793 |
| | | 1,103,885,475 | 1,055,655,063 |
| **මුළු වත්කම්** | | **2,160,595,204** | **2,111,320,113** |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| | | | |

| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
|---|---|---|---|
| රජයේ ප්‍රාග්ධන දායකත්වය | | 537,742,424 | 537,742,424 |
| සමුච්චිත ලාභ | | (347,178,946)<br>190,563,478 | (120,593,494)<br>417,148,930 |
| ජංගම නොවන වගකීම් | | | |
| ප්‍රාග්ධන භාණ්ඩ සඳහා රජයේ ප්‍රදානය | 16 | 483,255,000 | 333,372,613 |
| විදේශ ප්‍රදාන | | 85,953,772 | 103,257,470 |
| ගෙවිය යුතු සමාජ සුභසාධක අරමුදල | | 487,717 | 476,775 |
| නිශ්චිත පාරිතෝෂික සැලැස්ම | 17 | 226,221,975 | 224,679,135 |
| ජංගම නොවන ගෙවිය යුතු බැංකු ණය ප්‍රමාණය | 22.2 | 139,534,884<br>935,453,347 | -<br>661,785,994 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳගෙවිය යුතු දෑ | 18 | 110,926,268 | 116,426,023 |
| වෙනත් මූල්‍ය වගකීම් | 19 | 536,340,622 | 333,899,038 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 20 | 18,019,491 | 10,736,884 |
| ජංගම වශයෙන් ගෙවිය යුතු බැංකු ණය ප්‍රමාණය | 22.1 | 55,813,953 | 15,604,561 |
| කෙටි කාලීන බැංකු ණය - ෂකක උදරකා කමච | 22.3 | 54,750,000 | 73,000,000 |
| බැංකු අයිරාව | 21 | 258,728,044<br>1,034,578,379 | 482,718,683<br>1,032,385,189 |
| මුළු වගකීම් | | 1,970,031,726 | 1,694,171,183 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **2,160,595,204** | **2,111,320,113** |

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කර තිබෙන්නේ ශ්‍රී ලංකා ගණකාධිකාරී ආයතනය මගින් අනුමත කළ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ටත්, 1971 අංක 38 දරන මුදල් පනතට හා 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතටත් අනුකූලව බව ප්‍රධාන ගණකාධිකාරී විසින් සහතික වෙන ලදී.

| | |
|---|---|
| අජිත් ගුණරත්න නාරගල<br>අධ්‍යක්ෂ ජනරාල් | 07/04/2021<br>දිනය |
| ඒ. එච්. ඊ. ආර්. පී. එදිරිසිංහ<br>ප්‍රධාන ගණකාධිකාරී | 07/04/2021<br>දිනය |

අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව වගකීම් භාරගෙන ඇත. මෙම මූල්‍ය වාර්තා 2021අප්‍රේල් 07 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලදී.

වෛද්‍ය නිහාල් ජයතිලක

සභාපති

07/04/2021

දිනය

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව**

2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

| | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| (ආදායම්) විකුණුම් ආදායම | 1 | 1,049,126,350 | 1,742,947,899 |
| විකුණුම් පිරිවැය | 3 | (1,268,429,096) | (1,718,223,986) |
| දළ ලාභය | | **(219,302,746)** | **24,723,913** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 2 | 379,096,728 | 364,110,758 |
| රජයේ දායකත්වය | 2.1 | 310,000,000 | - |
| බෙදාහැරීමේ පිරිවැය | 4 | (140,805,822) | (248,018,540) |
| පරිපාලන වියදම් | 5 | (511,015,755) | (554,496,262) |
| මෙහෙයුම් ලාභය | | **(182,027,596)** | **(413,680,131)** |
| මූල්‍ය පිරිවැය | 6 | (54,747,402) | (53,859,699) |
| බදු පෙර ලාභය | | (236,774,998) | (467,539,830) |
| ආදායම් බද්ද | 7 | 2,474,904 | 6,500,431 |
| ලාභය (ආදායම් බදු අඩු කිරීමෙන් පසු) | | **(234,300,093)** | **(461,039,399)** |
| වෙනත් විස්තීරණ ආදයම් | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මට අනුව ඇති වූ ලාභය/අලාභය | | - | (40,125,273) |
| කාල පරිච්ඡේදයට අදාල මුළු විස්තීරණ ආදායම | | **(234,300,093)** | **(501,164,672)** |

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව**
**2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය**

**රු. වලින්**

| | රඳවාගත් ලාභය | රජයේ දායකත්වය | මුළු එකතුව |
|---|---|---|---|
| 2019/01/01 දිනට ශේෂය | 366,687,141 | 537,742,424 | 904,429,565 |
| කාල පරිච්ඡේදයට අදාළ මුළු විස්තීර්ණ ආදායම | (501,164,672) | - | (501,164,672) |
| පෙර වර්ෂයට අදාල - සොබාධාරා වාර්ථා වැඩසටහන වෙනුවෙන් ලැබූ වටිනාකම | 5,000,000 | - | 5,000,000 |
| පෙර වර්ෂයට අදාල - රාජ්‍ය නත්තල් උත්සවය ාවනුවෙන් ලැබීම් | 967,770 | - | 967,770 |
| පෙර වර්ෂයට අදාල - බදු වටිනාකම සඳහා ගැලපීම | 7,022,776 | - | 7,022,776 |
| පෙර වර්ෂයට අදාල - ක්ෂය ගැලපීම | 1,566 | - | 1,566 |
| පෙර වර්ෂයට අදාල - විගණන ගාස්තු ගෙවීම වෙනුවෙන් ගැලපීම | (423,000) | - | (423,000) |
| පෙර වර්ෂයට අදාල ආයෝජන ආදායම් ගැලපීම | (335,038) | - | (335,038) |
| පෙර වර්ෂයට අදාල ගැලපීම් රක්ෂණ වන්දි මුදල් ලැබීම් සෝනි කැමරාවක් වෙනුවෙන් | 1,919,018 | - | 1,919,018 |
| පෙර වර්ෂයට අදාල ලැබිය යුතු ආදායම් ගැලපීම් චීන ජාත්‍යන්තර රූපවාහිනී ආයතනය මඟින් | (269,054) | - | (269,054) |
| 2019/12/31 දිනට ශේෂය | **(120,593,494)** | **537,742,424** | **417,148,930** |
| 2020/01/01 දිනට ශේෂය | 120,593,494 | 537,742,424 | 417,148,930 |
| බදු වටිනාකම සඳහා ගැලපීම | 7,753,181 | - | 7,753,181 |
| පෙර වර්ෂයට අදාල ලැබිය යුතු ආදායම් ගැලපීම් චීන ජාත්‍යන්තර රූපවාහිනී ආයතනය මඟින් | (38,540) | - | (38,540) |
| කාල පරිච්ඡේදයට අදාළ මුළු විස්තීර්ණ ආදායම | (234,300,093) | - | (234,300,093) |
| 2020/12/31 දිනට ශේෂය | **(347,178,946)** | **537,742,424** | **190,563,478** |

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව**
**2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**රු. වලින්**

| | **2020** | **2019** |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වන මුදල් ප්‍රවාහයන්** | | |
| මෙහෙයුම් කටයුතු වලින් ජනනය වන මුදල් ප්‍රවාහයන් | 182,596,327 | (299,607,033) |
| පොලී ගෙවීම | (29,257,239) | (36,540,437) |
| පාරිතෝෂික ගෙවීම් | (28,457,161) | (44,884,444) |
| අස්පෘශ්‍ය වත්කම් මිළදී ගැනීම - ටෙලිනාට්‍ය | (33,700,000) | (26,320,000) |
| අස්පෘශ වත්කම් මාරු කිරීම ( සංස්ථාව විසින් නිෂ්පාදිත ටෙලිනාට්‍ය ) | | - |
| අස්පෘශ වත්කම් මිළදී ගැනීම - විදේශීය වැඩසටහන් | - | (1,852,500) |
| ආර්ථික සේවා ගාස්තු ගෙවීම | - | (8,552,420) |
| රඳවා ගැනීම් බදු ගෙවීම | - | (2,002,621 ) |
| මෙහෙයුම් කටයුතු වලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහයන් | **91,181,927** | **(419,759,454)** |
| **ආයෝජන කටයුතු වලින් ජනනය වන මුදල් ප්‍රවාහයන්** | | |
| දේපළ පිරියත හා උපකරණ මිලට ගැනීම | (92,426,135) | (122,710,644) |
| දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ආදායම | 43,550 | 11,020,918 |
| ආයෝජන ආදයම් ලැබීම භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු | 39,221,013 | 44,855,362 |
| 2<br>ප්‍රාග්ධන වත්කම් සදහා රජයේ ප්‍රදානයන් | 234,855,000 | 150,000,000 |

| | | |
|---|---|---|
| ලංකා බැංකුව ආයතනික ශාඛාවෙන් ලංකා බැංකුව ටොරින්ටන් ශාඛාවට මුදල් මාරු කිරීම | 64,147,754 | 43,600,000 |
| ලංකා බැංකුව ටොරින්ටන් ශාඛාවෙන් ලංකා බැංකුව ආයතනික ශාඛාවට මුදල් මාරු කිරීම | ( 5,784,147) | 148,000,300 |
| මුදල් මාරු කිරීමේ ගාස්තු | 2,500 | 1900- |
| ලංසු බැඳුම්කර සඳහා ඇපකර ගාස්තු | 1,003,520 | - |
| මහා භාණ්ඩාගාරයට යවන ලද විශේෂ බද්දක් ලෙස අවසන් කිරීම | 1,915,328 | - |
| කල් පිරෙන තෙක් තබා ගන්නා ආයෝජන වල - ස්ථාවර තැන්පතු වල ආයෝජනය | (35,884,614) | (8,632,600) |
| භාණ්ඩාගාර බිල්පත් කල්පිරීම | 1,573,096 | 1,445,887 |
| භාණ්ඩාගාර බිල්පත් වට්ටම් කිරීම | | - |
| භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම | (65,353,630) | (193,826,363) |
| ආයෝජන කටයුතු වලින් ජනනය වන ශුද්ධ මූල්‍ය ප්‍රවාහය | **143,313,236** | **73,754,761** |
| මූල්‍ය කටයුතු වලින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය | | |
| බැංකු ණය ලබා ගැනීම | 200,000,000 | - |
| කෙටි කාලීන ණය ලබා ගැනීම - ICC World Cup තරඟාවලියට ගෙවීම සඳහා | 73,000,000 | 73,000,000 |
| කෙටි කාලීන ණය - ICC World Cup තරඟාවලියට) වාරික ගෙවීම | (18,250,000) | - |
| බැංකු ඇපකරය | (82,116,362) | - |
| බැංකු ණය ගෙවීම | (33,136,975) | (48,736,843) |
| මූල්‍ය කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය | **139,496,664** | **(24,263,157)** |
| වර්ෂය තුළ මුදල් සමාන දෑ වල වැඩි වීම/අඩුවීම | 373,991,827 | (321,741,534) |
| වර්ෂය ආරම්භයේ ශේෂය | (482,668,683) | (160,927,147) |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **(108,676,857)** | **(482,668,683)** |

| | | |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වන මුදල් ප්‍රවාහය | | - |
| බදු පෙර ශුද්ධ ලාභය/අලාභය | (236,774,998) | (467,539,830) |
| පෙර වර්ෂයට අදාල - සොහාධාරා වාර්ථා වැඩසටහන වෙනුවෙන් ලැබූ වටිනාකම | - | 5,000,000 |
| පෙර වර්ෂයට අදාල නත්තල් රාජ්‍ය උත්සවය සඳහා ලැබීම | - | 967,770 |
| පෙර වර්ෂයට අදාල - ලැබිය යුතු ආදායම් ගැලපීම (චීන ජාත්‍යන්තර රූපවාහිනී ආයතනය) | (38,540) | - |
| ආයෝජන පොළී ආදයම | (34,211,114) | (42,599,894) |
| දේපළ පිරියත හා උපකරණ විකිණීමේ ලාභය | (26,131) | (10,963,181) |
| විදේශ ප්‍රදානයන් ක්‍රමක්ෂය | (24,555,761) | (24,555,761) |
| ප්‍රති වෙළඳ ගිවිසුම් ආදයම් | (5,956,0000 | (6,755,500) |
| ප්‍රති වෙළඳ ගිවිසුම් වියදම් | 360,000 | 1,053,790 |
| ප්‍රාග්ධන වත්කම් සඳහා රාජ්‍ය ප්‍රදානයන්ක්‍රමක්ෂය | (84,972,613) | (57,074,996) |
| ක්ෂය | 94,374,042 | 100,958,365 |
| අඩමාණ ණය වෙන් කිරීම - සේවා දයක ණයගැතියන් | 11,992,003 | 5,207,559 |
| අඩමාණ ණය වෙන් කිරීම - සේවක ණයගැතියන් | (37,202) | (765) |
| අඩමාණ ණය වෙන් කිරීම - විවිධ ණයගැතියන් | 1,583,888 | 2,725,721 |
| දේපළ පිරියත හා උපකරණ විකිණීමේ අලාභය | 17,847 | - |
| බැංකු පොළිය | 29,257,239 | 36,540,437 |
| බැංකු ණය පොළිය | 21,997,612 | 6,246,433 |
| හදිසි වියදම් අවුරුදු වැඩසටහන සදහා | | - |

| | | |
|---|---|---|
| ත්‍යාග | | |
| අස්පෘශ වත්කම් ක්‍රමක්ෂය (මිල දී ගත් ටෙලි නාට්‍ය) | 49,840,500 | 31,582,194 |
| අස්පෘශ වත්කම් ක්‍රමක්ෂය ( මිල දී ගත් විදේශීය වැඩසටහන් ) | 3,630,627 | 1,954,206 |
| අස්පෘශ වත්කම් ක්‍රමක්ෂය (සංස්ථාවේ නිෂ්පාදිත ටෙලි නාට්‍ය) | 4,828,883 | 4,828,883 |
| අස්පෘශ වත්කම් ක්‍රමක්ෂය (සංස්ථාවේ නිෂ්පාදිත වෙනත් වැඩසටහන්) | 3,274,661 | 3,274,661 |
| අස්පෘශ වත්කම් ක්‍රමක්ෂය ( දේශීය වැඩසටහන් විකාශය නොවූ ) | - | 2,994,100 |
| අස්පෘශ වත්කම් ක්‍රමක්ෂය (විදේශීය වැඩසටහන් ප්‍රදාන NHK) | 14,720,000 | 14,720,000 |
| අස්පෘශ වත්කම් ක්‍රමක්ෂය (දේශීය වැඩසටහන් කෙරීගෙන යන ) | | - |
| පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා වෙන් කිරීම | 30,000,000 | 36,113,702 |
| | | - |
| මෙහෙයුම් කටයුතු වලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර | 120,695,057 | (355,322,107) |
| (වැඩිවීම)/ අඩුවීම - නොනිමි වැඩ | | - |
| (වැඩිවීම)/ අඩුවීම - තොග | 3,435,738 | 2,223,290 |
| වැඩිවීම/(අඩුවීම) - ලැබිය යුතු දෑ (ගැලපීම් 2) | 88,238,028 | 9,891,471 |
| වැඩිවීම/(අඩුවීම) - ගෙවිය යුතු දෑ (ගැලපීම් 3) | 211,617,617 | 42,708,388 |
| මෙහෙයුම් කටයුතු වලින් ජනනය වන මුදල් ප්‍රවාහයන් | 182,596,327 | (299,607,033) |

**ගැලපීම් 2**

**ලැබිය යුතු ගිණුම් වල වැඩිවීම/අඩුවීම**

| | **2020** රු. | **2019** රු. |
|---|---|---|
| වෙළඳ ලැබිය යුතු දෑ | 16,463,836 | 22,443,241 |
| ණය හා ලැබිය යුතු දෑ (භාණ්ඩාගාර බිල්පත් හැර) | 17,778,682 | 22,500,522 |
| වෙනත් ලැබිය යුතු දෑ | 54,774,207 | (36,083,890) |
| කලින් ගෙවීම් | (778,696) | 1,726,067 |
| | 88,238,028 | 8,881,471 |

**ගැලපීම් 3**

**ගෙවිය යුතු ගිණුම් වල වැඩිවීම්/අඩුවීම**

| | **2020** රු. | **2019** රු. |
|---|---|---|
| වෙළඳ ගෙවිය යුතු දෑ | (5,859,755) | 3,329,866 |
| වෙනත් මූල්‍ය වගකීම් | 202,441,584 | 51,102,621 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 15,035,788 | (11,724,100) |
| | **211,617,617** | **42,708,388** |

## ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
## මූල්‍ය වාර්තා සැකසීම හා සම්බන්ධ සටහන්

### 1. සාමාන්‍ය තොරතුරු

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන)1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යටතේ සංස්ථාපනය කර ඇත. ශ්‍රී ලාංකීය ජාතියේ දෘශ්‍ය මාධ්‍යයේ පෙරගමන්කරු වශයෙන් කටයුතු කරන සංස්ථාවේ ප්‍රධාන අරමුණ වන්නේ, දැනුම, විනෝදය හා අධ්‍යාපනය ලොව පුරා විසිර සිටින ශ්‍රී ලාංකේය සමාජය වෙත ලබාදීමයි.

2020 වර්ෂයේ දෙසැම්බර් මස 31 දින වනවිට සංස්ථාවේ සිටින සේවක සංඛ්‍යාව 890 කි. ( ස්ථිර, කොන්ත්‍රාත් සහ අනියම් සේවකයින්)
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය වාර්තා නිකුත් කරනු ලබන්නේ 2021අප්‍රේල්07 වන දින ය.

### 2. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) යොදාගැනීම හා පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් අනුමත කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව හා 1995 අංක 19 දරන ශ්‍රී  ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන්ගේ අවශ්‍යතා අනුව සංස්ථාව මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත.

2012 ජනවාරි 01 සිට ආයතනවලට අදාළ වන පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති නිකුත් කරන ලදී.

### 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා යොදා ගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්තී පහත දක්වා ඇත. මෙම ප්‍රතිපත්තී වෙනත් ආකාරයකට දක්වා ඇති අවස්ථාවලදී හැර සෑම වර්ෂයකදීම නොවෙනස්ව යොදා ගනු ලැබේ.

### 3.1 පිළියෙල කිරීමේ පදනම

සංස්ථාවේ මූල්‍ය වාර්තා පිළියෙල කර තිබෙන්නේ ශ්‍රී  ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය. මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය පදනමට අනුකූලව පිළියෙල කර ඇත. උද්ධමනකාරී සාධක මත ගිණුම්වලට ඇතිවන බලපෑම් සඳහා ගැලපීම් කර නැත. මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින්  ඉදිරිපත් කර තිබේ.

මූල්‍ය වාර්තා SLFRS වලට අනුකූලව පිළියෙල කිරීමේ දී අවශ්‍ය අවස්ථා වලදී ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිත කිරීමට සිදුවේ. එමෙන්ම සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගනිමින් කළමනාකරණය ගනු ලබන තීරණ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී අවශ්‍ය වේ.

සටහන් අංක 07 මගින් මූල්‍ය වාර්තා සැකසීමේ දී භාවිත කළ ඉතාමත් වැදගත් තීරණ, සංකීර්ණ තත්ත්වයන්, උපකල්පන හා ඇස්තමේන්තු හෙළිදරව් කර ඇත.

ප්‍රතිපත්ති සංශෝධනයන් සහ අර්ථ නිරූපණය කිරීම් අලුතින් වෙනස් වුව ද 2012 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන වර්ෂයේ දී හා ඊට පෙර ක්‍රියාත්මක නොවූ වෙනස්වීම් පහත දැක්වේ.

1. IFRS13 ට අනුව "සාධාරණ වටිනාකම ඇගයීමේ" අරමුණ වන්නේ සංගතතාව ඉහළනැංවීමත්, සංකීර්ණ තත්ත්ව අඩු කිරීමත්ය. ඒ සඳහා සාධාරණ වටිනාකම පිළිබඳ නිරවද්‍ය නිර්වචනයන් ලබාදීමත්, සාධාරණ වටිනාකම මැනීමට මූලාශ්‍රයන් ලබාදීමත්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව හෙළිදරව් කිරීමේ නියමයන් ලබාදීමත් සිදු කරයි.

2. IFRS9 මගින් ප්‍රකාශ කරනු ලබන්නේ "මූල්‍ය සාධන පත්‍ර " හෙවත් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වර්ගීකරණය මැනීම හා හඳුනා ගැනීමයි.LKAS 39 මූල්‍ය සාධන පත්‍ර හදුනාගැනීම හා මැනීම යන ප්‍රතිපත්තිය වෙනුවට IFRS 9 පිහිටුවන ලදී. ඒ අනුව, මූල්‍ය වත්කම් මිනුම් දඬු 2 ක් යටතේ බෙදා වෙන් කිරීම සිදු කෙරේ. එනම්, සාධාරණ අගය හා ක්‍රම ක්ෂය පිරිවැය පදනමයි. මූලික හඳුනා ගැනීම මගින් නිර්ණය කිරීම සිදු කෙරේ. බෙදා වෙන් කිරීම රඳා පවතිනුයේ ආයතනයක් තම මූල්‍ය සාධන පත්‍ර ද කළමනාකරණය කර ගන්නා ව්‍යාපාරික ආකෘතිය අනුව සහ සාධන පත්‍රවල ගිවිසුම් ප්‍රකාර මූල්‍ය ප්‍රවාහයන්හි ස්වභාවය අනුවය. මූල්‍ය වගකීම් ගැන කතාකිරීමේ දී තවදුරටත්LKAS 39 හි සඳහන් බොහෝ අවශ්‍යතා ඒ ආකාරයෙන් ම පවතී. මෙහි ප්‍රධාන වෙනස නම් සාධාරණ අගය යන විකල්පය, මූල්‍ය වගකීම්වල දී සලකා බැලීම, සාධාරණ අගය වෙනස්වීම ආයතන ගෙවිය යුතු ණය අවදානමේ කොටසක් වශයෙන් ගිණුම්කරණ අයෝග්‍යතාවක් ඇති නොවන පරිදි වාර්තා කිරීම සිදු කළ යුත්තේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ද එසේ නොමැති නම් ආදායම් ප්‍රකාශයේම ද යන්නයි. සංස්ථාව මේ දක්වා IFRS 9 හි මුළු බලපෑම තක්සේරු කර ඇත.

### 3.2 ව්‍යවහාර මුදල්

#### (ඒ) ව්‍යවහාර හා ප්‍රකාශිත මුදල් ඒකක

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් අයිතමයන් මැනීම සිදු කරන්නේ සංස්ථාව ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය අනුවය (ක්‍රියාකාරී මුදල් ඒකක). මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන්නේ ශ්‍රී ලංකා රුපියල්වලින් වන අතර එය සංස්ථාවේ ව්‍යවහාර හා ප්‍රකාශිත මුදල් ඒකකය වේ.

#### (බී) ගනුදෙනු හා ශේෂයන්

විදේශ මුදල් ගනුදෙනු පරිවර්තනය කරන ලද්දේ ගනුදෙනුවට අදාළ දිනයේ පැවති විනිමය අනුපාතිකය අනුවය. මූල්‍ය වත්කම් හා වගකීම්වලට අදාළ ගනුදෙනු වර්ෂ අවසානයේ පවතින විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කළ විට එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන යම් ලාභයක් හෝ අලාභයක් වේ නම් ආදායම් ප්‍රකාශයේ දැක්විය යුතුය.
ණය ගැනීම්, මුදල් හා මුදල් හා සමාන දෑ සහ ඒ හා සම්බන්ධ විදේශ විනිමය ලාභ හෝ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ "මූල්‍ය ආදායම් හෝ පිරිවැය" වශයෙන් දක්වා ඇත. අනෙකුත් සියලු විනිමය හුවමාරු ලාභ හෝ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ "අනෙකුත් (අලාභ) / ලාභ" ලෙස දක්වා ඇත.

### 3.3 දේපල, පිරියත හා උපකරණ

ඉඩම් හා ගොඩනැගිලි සමන්විත වන්නේ සම්ප්‍රේෂණාගාර සහ ප්‍රධාන කාර්යාල වලිනි. සියලු දේපළ පිරියත හා උපකරණ පවත්වාගෙන යන්නේ ඓතිහාසික පිරිවැය අඩු කිරීම ක්ෂය යන පදනමටය. ඓතිහාසික පිරිවැයට අදාළ වියදම් වනුයේ වත්කම අත්පත් කරගැනීමට සෘජුවම අදාළ වූ වියදම්ය.

යම් වත්කමක අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබේ නම් සහ වත්කමේ පිරිවැය නිශ්චිතව ගණනය කළ හැකි නම් එවැනි වත්කම් සම්බන්ධයෙන් ඇතිවන පසුකාලීන වියදම් වත්කමේ පවත්වාගෙන යාමේ පිරිවැය වශයෙන් හෝ වෙනමම වත්කමක් වශයෙන් යන ආකාර දෙකෙන් සුදුසු ආකාරයකට පවත්වා ගත හැක. ප්‍රතිස්ථාපනය කළ හැකි කොටස්වල පවත්වාගෙන යාමේ පිරිවැය මෙහි දී නොසැලකේ. අනෙකුත් සියලු අලුත්වැඩියා හා නඩත්තු වියදම්, වියදම දැරූ මූල්‍ය කාලපරිච්ඡේදයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී සලකා බලනු ලැබේ.
ඉඩම් ක්ෂය කරනු නොලැබේ. අනෙකුත් වත්කම්වල පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කර ලැබෙන වටිනාකම එම වත්කම්වල ඵලදායී ජීවකාලය තුළ සරල මාර්ග ක්ෂය ක්‍රමය මගින් ක්ෂය කරනු ලැබේ.

**වගුව 1 - දේපල පිරියත හා උපකරණවල ක්ෂය අනුපාත**

| | අනුපාත |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| පරිගණක | 20% |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 10% |
| විදුලි උපකරණ | 20% |
| මෝටර් රථ | 25% |
| කාර්යාලීය උපකරණ | 20% |
| පුස්තකාල තොග | 20% |
| රූපවාහිනී යන්ත්‍ර | 20% |
| වෙනත් වත්කම් | 20% |

අවශ්‍ය නම් සෑම ගිණුම් වර්ෂයක් අවසානයේදීම වත්කමක අවශේෂ වටිනාකම සහ ඵලදායි ආයු කාලය නැවත ගණනය කර යාවත්කාලීන කිරීම සිදු කළ හැක.
වත්කමෙන් පවත්වාගෙනයාමේ පිරිවැය එම වත්කමේ ආපසු ලබාගත හැකි අගයට වඩා වැඩි නම් එම වෙනස ඉක්මනින් කපාහැරිය යුතුය. වත්කමේ විකිණීමේ ලාභය හෝ අලාභ ආදායම් ප්‍රශනයෙහි අනෙකුත් ලාභ /(අලාභ) යටතේ දැක්වේ.
සම්පූර්ණයෙන් ක්‍ෂය කර ඇති ඇතැම් ස්ථාවර වත්කම් තවදුරටත් සංස්ථාව තුළ භාවිතා කරමින් පවතී. ඒ සඳහා අමතර ගිනුම් සටහනක් නොයෙදේ.

## 3.4 මූල්‍ය සාධන පත්‍ර

### (ඒ) මූල්‍යය වත්කම්

ශේෂය ණයගැති ප්‍රතිපාදනයෙන් කපා හරිනු ලැබේ. එලෙස කපාහැරි ණයගැතියෝ පසු අවස්ථාවක අයකර

### 3.4.1 වර්ගීකරණය

සංස්ථාව තම මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි. පරිණත දින දක්වා තබා ගන්නා මූල්‍ය සාධන පත්‍ර ණය හා ලැබිය යුතු ගිණුම් හා විකිණීම සඳහා ඇති මූල්‍ය සාධන පත්‍ර වශයෙනි. වර්ගීකරණය රඳා පවතිනුයේ මූල්‍ය වත්කම් අත්පත් කරගත් අරමුණ අනුව හා කළමනාකරණයේ තීරණ මතය.

### (ඒ) පරිණත දින දක්වා තබා ගන්නා මූල්‍ය සාධන පත්‍ර

මෙය සමන්විත වනුයේ ස්ථාවර හෝ නිශ්චිත ගෙවීමක් ඇති සහ නිශ්චිත කල්පිරීමේ දිනයක් ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහිත ස්ථාවර තැන්පතුවලිනි. මේවා පරිණත දින දක්වා තබාගැනීමට සංස්ථාවේ කළමනාකරණයට හැකියාවක් මෙන් ම නියත අරමුණක් ඇත. (සටහන් 10 බලන්න)

### (බී) ණය හා ලැබිය යුතු ගිණුම්

ණය හා ලැබිය යුතු ගිණුම් යනු ක්‍රියාකාරී වෙළෙඳපොලේ මිල කිරීමක් නොකළ ස්ථිර හෝ නිශ්චිත ගෙවීමක් ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මෙයට ගිණුම් වර්ෂය අවසානයේ මාස 12 කට අඩු පරිණත කාලයක් සහිත ජංගම වත්කම් අදාළ වේ. සංස්ථාවේ ශේෂ පත්‍රයේ ණය හා ලැබිය යුතු ගිණුම්වල ඇතුළත් වන්නේ "වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ" සහ මුදල් හා මුදල් සමාන දෑය.(සටහන් 13 බලන්න)

### (සී) විකිණීම සඳහා ඇති මූල්‍ය සාධන පත්‍ර

මෙයට අයත් වන්නේ අනිකුත් වර්ගයකට අයත් නොවන සියලුම ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. එනම් ගිණුම්කරණ කාලපරිච්ඡේදය අවසානයේ මාස 12 ක් ඇතුලත කළමනාකරණය විසින් විකිණීමට තීරණය කරන්නේ නම් මිස නැතහොත් පරිණත දින දක්වා තබා ගන්නා ජංගම නොවන වත්කම් මෙයට ඇතුළත් වේ. එබැවින් මෙය සමන්විත වූයේ ලංකා පුවත් (පෞද්ගලික) සීමිත සමාගමේ මිල නොකළ කොටස්වලිනි.

### (ඩී) මූල්‍ය වගකීම්

IAS 39 අනුව වගකීම් වර්ගීකරණය කරනුයේ සාධාරණ අගයට ප්‍රත්‍යාගණනය කළ මූල්‍ය වගකීම් හා අනෙකුත් වගකීම් වශයෙනි. ගෙවා අවසන් වූ අවලංගු කළ හා කල් ඉකුත් වූ වගකීම් සම්බන්ධයෙන් වන බැඳියාව මූල්‍ය වගකීමක් වශයෙන් නොසැලකේ.

## 3.5 තොග

සංස්ථාවේ තොග වන්නේ පරිභෝජන භාණ්ඩ තොගයි. (සංස්ථාවේ තොග පවත්වාගෙන යනු ලබන්නේ පරිහරණය කිරීම සඳහා වන අතර එම තොග අලෙවි කරනු නොලැබේ.) එබැවින් තොග ඒවායේ පිරිවැය මත අගය කරනු ලැබේ. තොග අගය කරනු ලබන්නේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු පදනම අනුවය.

## 3.6 වෙළෙඳ ණයගැතියෝ

### 3.6.1 ප්‍රතිපාදන - වෙළෙඳ ලැබීම් / සේවාදායක ණයගැතියන්

වෙළෙඳ ලැබීම් පවත්වාගෙන යනුයේ නැවත ලබාගතහැකියැයි අපේක්ෂා කරන වටිනාකමටය. සංස්ථාවට ලැබිය යුතු නියමිත වටිනාකම ලබාගත නොහැකි බවට පැහැදිලි සාක්ෂි පවතින අවස්ථාවල දී ඒ සඳහා ප්‍රතිපාදන පවත්වා ගනී. වෙළඳ ණයගැතියන් ප්‍රතිපාදන යටතේ අඩු කරනුයේ ණයගැතියන් විශාල මූල්‍ය අර්බුදයන්ට පත්ව ඇතිවිටෙක, ණයගැතියන් බංකොලොත්වීමේ සම්භාවිතාවයක් පවතින විට මූල්‍ය ප්‍රතිසංවිධානය වීමක දී ණය ගෙවීම් දීර්ඝ කාලයක් පැහැර හැරීම යන අවස්ථාවන්වලදීය. විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඇති බෙදාහැරීමේ වියදම් යටතේ වර්ෂයේ ඌණ ප්‍රතිපාදනය වියදමක් වශයෙන් දක්වන අතර අදාළ වත්කම් ගිණුමෙන් එම ප්‍රතිපාදනය අඩු කරනු ලැබේ. නැවත අයකරගත නොහැකි වෙළෙඳ ණයගැතිගත්විට එම ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ බෙදාහැරීමේ වියදම් වලින් ඉවත් කරනු ලැබේ.

**2 වගුව සේවාදයක ණයගැති ප්‍රතිපාදනය - 2020/12/31**

**රු. වලින්**

| | |
|---|---:|
| 2020/01/01 ප්‍රතිපාදනය | 101,104,171 |
| 2020 වර්ෂය සඳහා අයකිරීම් | 11,992,003 |
| 2020/12/31 දිනට ප්‍රතිපාදනය | 113,096,174 |

### 3.6.2 විවිධ ණයගැතියන්ගේ ප්‍රතිපාදනය

**3 වන වගුව - විවිධ ණයගැතියන්ගේ ප්‍රතිපාදනය - 2020/12/31**

**රු. වලින්**

| | |
|---|---:|
| 2020/01/01 ප්‍රතිපාදනය | **33,141,986** |
| 2020 වර්ෂය සඳහා අයකිරීම් | 1,583,888 |
| 2020/12/31 දිනට ප්‍රතිපාදනය | **34,725,874** |

### 3.6.3 - වෙනත් ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදනය

#### 3.6.3.1) සේවක ණය

සේවක ණයවලට පහත දැක්වෙන ණය වර්ගයන් යටතේ සුදුසුකම්ලත් සේවකයින් වෙත දෙනු ලැබූ මුදල් ඇතුළත්ය.

- ආපදා ණය
- විශේෂ ණය
- ප්‍රවාහන ණය
- නිවාස ණය
- වෙනත් ණය

සේවක ණය සම්බන්ධයෙන් බොල් ණය වශයෙන් පිළිබිඹු කෙරෙනුයේ සංස්ථාවේ තවදුරටත් සේවයේ නොමැති (විශ්‍රාම ගොස්, ඉල්ලා අස් වී හෝ මිය ගොස් ඇති) සේවකයින්ගේ නැවත අයකරගැනීමට අපහසු මුදල් සඳහා වූ ප්‍රතිපාදනයයි.

**4 වගුව - සේවක ණය සඳහා වෙන් කිරීම - 2020/12/31**

**රු. වලින්**

| | |
|---|---|
| 2020/01/01 ප්‍රතිපාදනය | 172,661 |
| 2020 වර්ෂය සඳහා අයකිරීම් | (37,202) |
| 2020/12/31 දිනට ප්‍රතිපාදනය | 135,459 |

**3.6.3.2) සේවක අත්තිකාරම්**

පහත දැක්වෙන අත්තිකාරම් ප්‍රභේද යටතේ සුදුසුකම් ලත් සේවකයින්ට ලබාදුන් මුදල් ප්‍රමාණයන්ගෙන් සේවක අත්තිකාරම් සමන්විත වේ.

- වැඩසටහන් සඳහා අත්තිකාරම්
- සේවකයින් සඳහා අත්තිකාරම් (විවිධ)
- විදේශ ගමන් සඳහා අත්තිකාරම්
- කාමර ගාස්තු සඳහා අත්තිකාරම්

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ තවදුරටත් සේවයේ නොමැති (විශ්‍රාම ගොස් හෝ ඉල්ලා අස් වී හෝ මියගොස්)ඇති සේවකයින්ගෙන් නැවත අය කරගැනීමට අපහසු අත්තිකාරම් මුදල් පිළිබිඹු කෙරෙන සේ සේවක අත්තිකාරම් සඳහා බොල් ණය සඳහා වූ ප්‍රතිපාදනය වෙන් කර ඇත.

**3.7 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය**

| | |
|---|---|
| බදු වට්නාකම සඳහා ගැලපීම | 7,753,181 |
| පෙර වර්ෂයට අදාල ලැබිය යුතු ආදායම් ගැලපීම් චීන ජාත්‍යන්තර රූපවාහිනී ආයතනය මඟින් | (38,540) |

**3.8 මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ වලට ඇතුළත් වනුයේ අත ඇති මුදල් හා බැංකු ජංගම ගිණුමයි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ බැංකු අයිරාව පෙන්වා ඇත්තේ ජංගම වගකීම්වලට ඇති ණය ගැනීම් යටතේය. බැංකු ගිණුම් ප්‍රකාශයට අනුව 2020/12/31 දිනට ගිණුම් ශේෂය/අයිරාව ලංකා බැංකුව ආයතනික ශාඛාව

රු.(243,076,540.46) සහ ලංකා බැංකුව ටොරින්ටන් ශාඛාව රු. 201,933,126 ක් ද මහජන බංකුවේ ගිණුම් ශේෂය රු.50,000/=ක් ද වේ.

### 3.9 වෙළඳ ගෙවීම් / වගකීම්

වර්ෂයක් ඇතුළත හෝ ඊට අඩු කාළයක් තුළ ගෙවියයුතු වගකීම් (හෝ සමාන්‍ය ව්‍යාපාරයේ ක්‍රියාකාරී චක්‍රය තුළ) ජංගම වගකීම් ලෙසත් එසේ කෙටිකාලීන නොවන වගකීම් ජංගම නොවන වගකීම් ලෙසත් වර්ගීකරණය කෙරේ.
වෙළඳ ගෙවීම් මූලිකවම වෙළඳපළ අගයට හඳුනා ගැනේ.

### 3.10 වර්තමාන හා විලම්හිත ආදායම් බදු

කාලපරිච්ඡේදයේ බදු වියදමට වර්තමාන හා විලම්හිත බදු අයත්වේ. සෘජුව හිමිකම සමඟ සම්බන්ධ හෝ අනෙකුත් කාලපරිච්ඡේදයක විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන් සමඟ සම්බන්ධ ඉදිරියට ප්‍රකාශයට ගනු ලැබේ. මෙහිදී සෘජුව හිමිකම සමඟ සම්බන්ධ හෝ අනෙකුත් කාලපරිච්ඡේදයක විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සමඟ සම්බන්ධ බදු  වෙන් වෙන්ව හඳුනාගැනීම අවශ්‍ය වේ.

වර්තමාන ආදායම් බද්ද ගණනය කරනු ලබන්නේ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට හා පසුව සිදු කළ සංශෝධනයන්ට අනුවය. බදු රෙගුලාසි වලට අනුව බදු ගණනය කිරීමට යොදා ගන්නා දෑ කළමනාකරණය විසින් කලින් කලට සලකා බලනු ලැබේ. ඒ අනුව බදු අධිකාරියට ගෙවීමට නියමිත බදු ප්‍රමාණය ගණනය කෙරේ.

වගකීම් ක්‍රමය භාවිත කර විලම්භිත බදු ගණනය කරන්නේ වත්කම් හා වගකීම් අතර වෙනස බදු පදනමට සලකා එය එම වත්කම් හා වගකීම්වල මූල්‍ය වාර්තාවලට ගන්නා පවත්වාගෙනයාමේ වටිනාකම අතර වෙනස සලකා බලාය. විලම්භිත ආදායම් බද්ද ගණනය කිරීමේ දී ඉහත සඳහන් කළ වෙනස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට බලපැවැත්වෙන බදු ප්‍රතිශතයෙන් වැඩි කරනු ලැබේ. මෙහිදී උපලබ්ධික වූ උපචිත ආදායම් බදු වත්කම හෝ බේරුම් කළ උපචිත ආදායම් බදු වගකීම ලැබේ.

විලම්භිත ආදායම් බදු වත්කම පවත්වා ගැනීමෙන් අනාගතයේ දී බදු අය කළ හැකි ලාභය අඩු කිරීමට එය භාවිතකෙරේ. විලම්හිත ආදායම් බදු වත්කම සහ වගකීම එකිනෙකට හිලව් කිරීම නීතිය මගින් බලාත්මක අවස්ථාවල දී කළ හැකිය.

5 වගුව - විලම්භිත බදු 2020/12/31 දිනට

රු. වලින්

| විස්තරය | ශුද්ධ පොත් අගය | ශුද්ධ බදු අගය | කාළ වෙනස | බදු රේටය | විලම්භිත බද්ද |
|---|---|---|---|---|---|
| දේපල,පිරියත හා උපකරණ | 458,612,337 | 271,251,054 | 187,361,283 | 28% | 52,461,159 |
| පාරිතෝෂික වෙන්කිරීම සහ වෙනත් වෙන්කිරීම | 374,179,481 | - | 374,179,481 | 28% | (100,770,255) |
| | | | | | (52,309,095) |

**සටහන**

| | |
|---|---|
| මුලු වත්කම් වල ශුද්ධ පොත් අගය | 466,272,860 |
| අඩුකලා | |
| ඉඩම් | (7,660,503) |
| මෝටර් රථ(ශු.පො.අ.) - 2010 | (1) |
| මෝටර් රථ(ශු.පො.අ.) - 2011 | (2) |
| JICA ප්‍රදානය | (16) |
| මෝටර් රථ ප්‍රදානය | (1) |
| දේපල,පිරියත හා උපකරණ | 458,612,337 |

**සටහන**

| | |
|---|---|
| පාරිතෝෂික වෙන්කිරීම | 226,221,975 |
| සේවාදායක ණයගැතියන් සඳහා වෙන්කිරීම | 113,096,174 |
| සේවක ණයගැතියන් සඳහා වෙන්කිරීම | 135,459 |
| විවිධ ණයගැතියන් සඳහා වෙන්කිරීම | 34,725,874 |
| පාරිතෝෂික වෙන්කිරීම සහ වෙනත් වෙන්කිරීම් | 374,179,481 |

### 3.11 අසම්භාව්‍ය වගකීම්

සංස්ථාව පසුගිය අවස්ථාවන්වල දී සිදු කළ නීතිමය හා ගිවිසුම් ප්‍රකාර බැදීම්වල ප්‍රතිඵලයක් ලෙස එම බැඳීම් අවසන් කිරීමට ආර්ථිකමය ප්‍රතිලාභ පිටතට ගලායාමේ සම්භාවිතාවක් පවතින හා විශ්වාස කළ හැකි ඇස්තමේන්තුවක් එම බැඳියාවන් පිළිබඳව කළ හැකි වගකීම් අසම්භාව්‍ය වගකීම් වේ.

සංස්ථාවට එරෙහිව නඩු 9 ක් පවරා ඇත. සංස්ථාවට එරෙහිව දෙනු ලබන අධිකරණ නියෝගයක දී නඩු 9 සඳහාම පැමිණිලිකරුවන් වෙත ගෙවීමට සිදු විය හැකි යයි තක්සේරු කරන ලද වන්දි මුදල වන රු. 918,950,000.

### 3.12 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යනු සේවකයෙකු විශ්‍රාමයෑමේ දී සාමාන්‍යයෙන් වයස, සේවා කාලය හා වන්දි මුදල යන සාධක එකක් හෝ කිහිපයක් පදනම් කරගෙන ලැබෙන විශ්‍රාම දීමනාවයි.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මට අනුව ශේෂ පත්‍රයට ඇතුළත් කරන පාරිතෝෂික වගකීම වනුයේ ශේෂ පත්‍ර දිනට නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ වර්තමාන අගයයි. නිශ්චිත ප්‍රතිලාභ ගණනය කිරීමේ දී හඳුනා නොගත් අතීත සේවා වියදම සැලකිල්ලට ගනියි. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම ස්වාධීන ආයු ගණනයෙකු ලවා Projected unit credit ක්‍රමයට අනුව වාර්ෂිකව ගණනය කරනු ලැබේ. මෙහිදී වර්තමාන අගය තීරණය කිරීමට ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලායාමේ ප්‍රවාහයන් රජයේ බැඳුම්කර හා ක්‍රියාකාරී වෙළෙඳපොලේ පවතින ඉහළ තත්ත්වයේ සමාගම් බැඳුම්කර වල පොලී අනුපාතික යොදා ගෙන වට්ටම් කරනු ලැබේ.

මෙමගින් ඇතිවන ලාභය හෝ අලාභයන් ඉහත උපකල්පන වෙනස්වීමෙන් ඇතිවන වෙනසත් අදාළ වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ. මෙහි දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 (LKAS 19) පදනම් කර ගනිමින් ගණනය කිරීම සිදු කර ඇත.

සේවා වියදම විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම සකසන කාලපරිච්ඡේදය සඳහා සරල මාර්ග ක්‍රමයට එක් එක් වර්ෂයට අවශෝෂණය කළ යුතුය.

2020/12/31 දිනට නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම ස්වාධීන ආයු ගණනයෙකු වන පියල් එස්. ගුණතිලක විසින් ගණනය කරන ඇත.

මෙම ක්‍රමය යටතේ පාරිතෝෂික ප්‍රතිලාභ ගණනය කිරීමට යොදා ගත් ප්‍රධාන කල්පිතයන් පහත දැක්වේ.

- වට්ටම් අනුපාතය 10.37% කි. (අනාගත මුදල් ප්‍රවාහයෙහි වර්තමාන වටිනාකම ගණනය කිරීමට යොදා ගන්නා පොලී අනුපාතය)
- අනාගත වැටුප් වැඩිවීම් අනුපාතය 4% වශයෙනි.
- විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 ක් වශයෙනි.

ආයතනය අඛණ්ඩව පවතීය යන සංකල්පය පදනම් කර ගන්නා අතර විශ්‍රාම ප්‍රතිලාභ සඳහා පෙර අරමුදලක් තබා නොගනියි.

**6 වගුව - මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි දැක්වෙන වටිනාකම**

රු. වලින්

| | |
|---|---|
| 01/01/2020 දිනට ශේෂය | 224,679,135 |
| 2020 වර්ෂය සඳහා වෙන්කිරීම | 30,000,000 |
| 2020 වර්ෂය තුල ගෙවීම් | (28,457,161) |
| 31/12/2020 දිනට ශේෂය | 226,221,975 |

### 3.13 ප්‍රදානයන්

දේපල, පිරියත හා උපකරණ සම්බන්ධ ප්‍රදානයන් ඇතුළත් වනුයේ ජංගම නොවන වගකීම්වල විලම්භිත ප්‍රදානයන් යටතේ වන අතර සරල මාර්ග ක්‍රමයට අනුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට එම වත්කමේ ඵලදායී ජීවිත කාලය පුරා හර කෙරේ.

### 3.13 -1 දේශීය ප්‍රදානයන්

**දේශීය** ප්‍රදානයන් - උපකරණ සඳහා ලැබෙන ප්‍රදානයන් 20% අනුපාතයටත් මෝටර් රථ 25% වාර්ෂික අනුපාතයටත් ක්‍රමක්ෂය කරනු ලැබේ. 2016 වර්ෂය තුල රජයේ ප්‍රදානයක් ලෙස සංස්ථාවට රු.7,400,000/= වටිනාකමැති මෝටර් කාරයක් සහ රු.4,100,000/= වටිනාකමැති වෑන්රථයක් ලබා දෙන ලදී. 2017 වර්ෂය තුල සංස්ථාවට සංහිඳියාවේ නාළිකාව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට රු.171,000,000/= ද වැඩසටහන් නිෂ්පාදනය සඳහා රු.9,000,000/= ද දේශීය ප්‍රදානයන් ලෙස ලබා දී ඇත. 2018 වර්ෂය සඳහා රජයේ අයවැය ප්‍රතිපාදන යටතේ ප්‍රාග්ධන වත්කම් මිළදී ගැනීම සඳහා රුපියල් මිලියන 100 ක ප්‍රදනයක් **ද** 2019 වර්ෂයේ රුපියල් මිලියන 150 ප්‍රදානයක් ද ලබාදෙන ලදී. 2020 වර්ෂය තුල රු. මිලියන 235 ලබා දී ඇත

### 3.13- 2 විදේශීය ප්‍රදානයන්

සංස්ථාවට උපකරණ වශයෙන් රු. 654,665,339 ක විදේශීය ප්‍රදානයක් ලැබී තිබිණි. මෙම මුදල අදාළ උපකරණවල ආයු කාලය මුළුල්ලේ ගෙවී යන සේ ක්‍රමක්ෂය කොට ඇති අතර 2016 වර්ෂයට අදාළ මුදල රු. 2,596,040.18 කි. මෙය ආදායම් ප්‍රකාශයට දී ඇති සටහන්වල විදේශීය ප්‍රදානයන් ක්‍රමක්ෂය කිරීම වශයෙන් වෙනම දක්වා ඇත.

ජපන් රජයේ ආධාරයක් වශයෙන් JICA ශ්‍රී ලංකා යටතේ 2012/12/27 වන දින රු. 66,773,684.69 ක් වටිනා උපකරණ සංස්ථාවට ලැබුණි. මෙම උපකරණ සංස්ථාවට ලැබුණේ 2D සහ 3D සජීවීකරණය(සංස්කරණය) කිරීම සඳහාය. එම උපකරණවල ක්‍රමක්ෂය වටිනාකම 2013 වර්ෂයේ සිට එහි ඵලදායී ආයු කාලය(වසර 5) තුළ ක්‍රමක්ෂය කරන ලදී.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව තුල ජපන් රූපවාහිනී වැඩසටහන් වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 73.6ක් වටිනාකමැති (ජපන් යෙන් මිලියන 52.6) වැඩසටහන් තොගයක් ජපන් සංස්කෘතික ආධාර ප්‍රදාන වැඩසටහන 2015/2016 යටතේ ලබා දෙන ලදී. ඒ අනුව භාණ්ඩාගාරය විසින් එම ව්‍යාපෘතිය කියාත්මක කිරීම සඳහා රු.42,720,573/44 ප්‍රදාන පදනම යටතේ ලබාදීමට එකඟ වෙන ලදී. එම වටිනාකමින් රු.මිලියන 20 මුදලක් 2017 වර්ෂයේදී ලබාදී ඇති අතර **ඉතිරි** වටිනාක**ම්** 2018 සහ 2019 වර්**ෂ වල** ලැබී ඇත. එම වටිනාකම ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ (වැඩසටහන් නිෂ්පාදනය සඳහා විදේශ ප්‍රදාන) දක්වා ඇත.

එමෙන්ම 2017 වර්ෂය තුල රු. 36,198,604/65 වටිනාකමැති RAPA Project යටතේ කොරියානු රජයෙන් මාධ්‍ය වත්කම් කළමනාකරණය සඳහා ඩිජිටල් සංරක්ෂණ පද්ධතියක් ලබා දෙන ලදී. 2020 වර්ෂය තුල රු. 7,252,063 වටිනාකමැති RAPA Project යටතේලබා දෙන ලදී

### 3.14 - පිරිවැටුම

සංස්ථාවේ පිරිවැටුම ගිණුම් තබනුයේ උපචිත පදනමටය. ආයෝජන ආදායම ගිණුම් තබනුයේ ද එම පදනමටය.

පිරිවැටුම සැලකීමේ දී කාලපරිච්ඡේදයට අදාළව ලැබූ හා ලැබිය යුතු සියලු ආදායම්වල සාධාරණ අගය සැලකිල්ලට ගෙන ඇත. සංස්ථාව ආදායම් වශයෙන් සැලකිල්ලට ගන්නේ විශ්වාසයෙන් වටිනාකම මැනිය හැකි

හා එම ආදායම්වල අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලා එන්නේ නම් පමණි.

ගුවන්කාල අලෙවියෙන් ලැබෙන ආදායම සංස්ථාවේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රමය වේ. ආදායම් ප්‍රකාශයේ ඇතුළත් අනෙකුත් ආදායම් මූලාශ්‍රයන් ආදායම් ප්‍රකාශයේ සටහන්වල දැක්වේ.

### 3.15 වියදම් පිළිබඳ ගිණුම් තැබීම

සංස්ථාවේ වියදම් උපචිත පදනමට ගිණුම් තබා ඇත. දෛනික මෙහෙයුම් සිදු කිරීම හා දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම ආකාරයට පවත්වාගෙනයාම සඳහා දෛනිකව වැය වන සියලු වියදම් ද මෙයට ඇතුළත් වේ.

අයිරා පොලී වියදම ඇති වූ අවස්ථාවන් හි දී එය මූල්‍ය ගෙවීම් යටතේ ආදායම් ප්‍රශයට ඇතුළත් කරනු ලැබේ.

### 3.16 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරන්නේ වක්‍ර ක්‍රමය භාවිත කරමිනි. මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වනුයේ අත ඇති මුදල් හා බැංකු ජංගම ගිණුමේ ශේෂයෙනි.

### 3.17 ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍රය සකස් කළ පසු සිදු වූ සියලු ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන අනාවරණය කිරීම හෝ ගැලපීම සිදු කොට ඇත.

### 3.18 රූපවාහිනී සමාජ සුභසාධන අරමුදල

2004 වර්ෂයේ දියත් කළ විවිධ ව්‍යාපෘති මගින් පොදු මහජනතාවගෙන් එකතු කළ මුදලින් සමාජ සුභ සාධන අරමුදල සමන්විත ව ඇත.

**වගුව 7- 2020.12.31 දිනට සමාජ සුභ සාධන අරමුදලේ ශේෂය**

| | |
|---|---|
| | රු. |
| 01/01/2020 දිනට ශේෂය | 476,775 |
| ඉල්ලුම් තැන්පතු සඳහා පොළිය | 10,942 |
| 31/12/2020 දිනට ශේෂය | 487,717 |

සමාජ සුභ සාධන අරමුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කොටසක් වශයෙන් ඇතුළත් කර ඇත.

**1. අස්පෘශ්‍යත වත්කම් (කතෘභාගය වෙනුවෙන් ගෙවීම)**

වැඩසටහන් විකාශන අයිතිය වෙනුවෙන් ගෙවීමට සිදුවන කතෘභාගය (දේශීය හෝ විදේශීය) හෝ සංස්ථාව නිෂ්පාදනය කරන නිෂ්පාදනවල (ටෙලි නාට්‍ය, චලන රූප, චිත්‍ර පට හා වෙනත්) වියදම LKAS 38 ට අනුව අස්පෘශ්‍ය වත්කමක් ලෙස සලකන අතර එසේ සැලකීමට නම් හඳුනාගැනීමේ හැකියාව, පාලනය කළ හැකි බව සහ අනාගතයේ දී ආර්ථිකමය ප්‍රතිලාභ ලබාගත හැකිවීම යන සාධක 3 සම්පූර්ණ විය යුතුය. එසේ වන අස්පෘශ්‍ය වත්කම් පහත ප්‍රතිපත්තිවලට අනුව ක්‍රමක්ෂය කළ යුතු වේ.

**වගුව 8 - ලබාගත් හෝ මිල දී ගත් මෙන්ම සංස්ථාව තුළ නිපදවූ නිෂ්පාදන ක්‍රමක්ෂය කළයුතු ප්‍රතිපත්තිය**

| වර්ගය | ක්‍රමක්ෂය ප්‍රතිපත්ති |
|---|---|
| ලබාගත් හෝ මිල දී ගත් දේශීය ටෙලි නාට්‍ය හා චිත්‍රපට | කොන්ත්‍රාත් ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ දී නියමිත වාර ගණන විකාශය කිරීමට නොහැකි වූ විට ඉතිරි වන කතෘභාග සඳහා වැය කළ වියදම ගිවිසුම් කාලපරිච්ඡේදය අවසානයේ වියදමක් වශයෙන් සැලකිය යුතුය. |
| ලබාගත් හෝ මිල දී ගත් දේශීය ටෙලි නාට්‍ය හා චිත්‍රපට නොවන දේශීය වැඩසටහන් | කොන්ත්‍රාත් ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ දී නියමිත වාර ගණන විකාශය කිරීමට නොහැකි වූ විට ඉතිරි වන කතෘභාග සඳහා වැය කළ වියදම ගිවිසුම් කාලපරිච්ඡේදය අවසානයේ වියදමක් වශයෙන් සැලකිය යුතුය. |
| ලබාගත් හෝ මිල දී ගත් විදේශීය චිත්‍රපට හෝ සංගීත වැඩසටහන් | කොන්ත්‍රාත් ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ දී නියමිත වාර ගණන විකාශය කිරීමට නොහැකි වූ විට ඉතිරි වන කතෘභාග සඳහා වැය කළ වියදම ගිවිසුම් කාලපරිච්ඡේදය අවසානයේ වියදමක් වශයෙන් සැලකිය යුතුය. |

| | |
|---|---|
| ලබාගත් හෝ මිල දී ගත් විදේශීය චිත්‍රපට හා සංගීත වැඩසටහන් නොවන විදේශීය වැඩසටහන් | කොන්ත්‍රාත් ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ දී නියමිත වාර ගණන විකාශය කිරීමට නොහැකි වූ විට ඉතිරි වන කතෘභාග සඳහා වැය කළ වියදම ගිවිසුම් කාලපරිච්ඡේදය අවසානයේ වියදමක් වශයෙන් සැලකිය යුතුය. |
| සංස්ථාව නිෂ්පාදනය කරන ටෙලි නාට්‍ය | පළමුවර විකාශය කරන විට වියදමෙන් 50% ක් ද, ඉතිරි 50% වසර 10 ඇතුළත සමාන වාරික වලින් ද ක්ෂය කළ යුතුය. |
| සංස්ථාව විසින් නිෂ්පාදනය කරන ටෙලි නාට්‍ය නොවන වැඩසටහන් | පළමුවර විකාශය කරන විට වියදමෙන් 50% ක් ද, ඉතිරි 50% වසර 10 ඇතුළත සමාන වාරික වලින් ද ක්ෂය කළ යුතුය. |
| ගිවිසුමෙහි ගිවිසුම වලංගු කාලය පිළිබඳ සීමා කිරීමක් නොකළ මිල දී ගත් හෝ ලබාගත් විදේශීය චිත්‍රපට හා සංගීත වැඩසටහන් | පළමුවර විකාශය කරන විට වියදමෙන් 50% ක් ද, ඉතිරි 50% වසර 10 ඇතුළත සමාන වාරික වලින් ද ක්ෂය කළ යුතුය. |
| ගිවිසුමෙහි ගිවිසුම වලංගු කාලය පිළිබඳ සීමා කිරීමක් නොකළ මිල දී ගත් හෝ ලබාගත් විදේශීය චිත්‍රපට හා සංගීත වැඩසටහන් නොවන වැඩසටහන්. | පළමුවර විකාශය කරන විට වියදමෙන් 50% ක් ද, ඉතිරි 50% වසර 10 ඇතුළත සමාන වාරික වලින් ද ක්ෂය කළ යුතුය. |

හඳුනාගැනීමේ හැකියාව, පාලනය කළ හැකි බව හා අනාගතයේ දී ආර්ථිකමය ප්‍රතිලාභ ලබාගත හැකිවීම යන සාධක 3 න් එකක් හෝ කිහිපයක් සම්පූර්ණ නොවන වැඩසටහන්වල කතෘභාග වියදම (පළමු විකාශයෙන් පසු) ගිණුම්වලට සලකා බලයි.

## වගුව 9 - කර්තෘභාග වියදම

| රු. වලින් | මිලදී ගත් ටෙලි නාට්‍ය | මිලදී ගත් විදේශීය වැඩසටහන් | සංස්ථාවේ නිෂ්පාදිත ටෙලි නාට්‍ය | දේශීය වැඩසටහන් විකාශය නොවූ | දේශීය වැඩසටහන් කෙරීගෙන යන | සංස්ථාවේ නිෂ්පාදිත වෙනත් වැඩසටහන් | විදේශීය වැඩසටහන් ප්‍රදානය (NHK) |
|---|---|---|---|---|---|---|---|
| 01/01/2020 දිනට ශේෂය | 97,265,000 | 3,630,627 | 19,163,741 | - | - | 13,007,369 | 44,160,000 |
| එකතුවීම් | 33,700,000 | - | - | - | - | - | - |
| 2020 වර්ෂය සඳහා ක්‍රමක්ෂය | (49,840,500) | (3,630,627) | (4,828,883) | - | - | (3,274,661) | (14,720,000) |
| මාරු කිරීම් | - | - | - | - | - | - | |
| 31/12/2020දින ට ශේෂය | 81,124,500 | - | 14,334,858 | - | - | 9,732,708 | 29,440,000 |

### 1. අයිරා පහසුකම් සඳහා වූ සුරැකුම්

අයිරා පහසුකමෙහි හා ණයවර ලිපියේ ශුන්‍ය ආන්තිකයේ ප්‍රමාණය මත පදනම්ව, බැංකුව වෙත සංස්ථාව විසින් යම් සුරැකුමක් ලබාදීම අවශ්‍ය විය හැක. එබැවින්, අයිරා පහසුකම් හා ණයවර ලිපි ශූන්‍ය ආන්තික පහසුකම ලබාගනු පිණිස බැංකුව වෙත (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාර) සුරැකුම් වශයෙන් සංස්ථාව විසින් රු. මිලියන 328ක ස්ථාවර තැන්පතු ප්‍රමාණයක්ලබාදෙන ලදී.

6. ආයෝජන ආදායම්

10 වගුව - ආයෝජන ආදායම් 2020

| ආයෝජන වර්ගය | වටිනාකම රු. |
|---|---|
| භාණ්ඩාගාර බිල්පත් ලංකා බැංකුව | 50,406 |
| ස්ථාවර තැන්පතු ලංකා බැංකුව | 31,182,709 |
| ස්ථාවර තැන්පතු (රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව) | 2,015,686 |
| රාජ්‍ය ආයතන සඳහා අතිරික්ත අරමුදල (Stute Surples Trust Fund) | 35,104 |
| විශේෂ නිවාස ණය යෝජනා ක්‍රමය (රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව) | 272,683 |
| ඉතුරුම් ගිණුම (ලංකා බැංකුව) | 307,559 |
| නැවත මිලදී ගැනීම් ගිවිසුම් (REPO) | 346,966 |
| **එකතුව** | 34,211,114 |

7. **තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු හා තීන්දු**

ඇස්තමේන්තු හා තීන්දු නොකඩවා ඇගයීමට ලක් කෙරෙන අතර පවත්නා තත්ත්වයන් යටතේ යුක්ති සහගත යැයි විශ්වාස කරන්නාවූ අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන්ද ඇතුළත් ඓතිහාසික අත්දැකීම් හා සෙසු සාධක මත පදනම් වේ.

**තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු හා උපකල්පන**

සංස්ථාව විසින් අනාගතයට අදාළ වන්නාවූ ඇස්තමේන්තු හා උපකල්පනයන් සිදුකරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන්නාවූ ගිණුම්කරණ ඇස්තමේන්තු නිර්වචනානුකූලවම, ආශ්‍රිත සැබෑ ප්‍රතිඵලයනට සමාන වනුයේ කලාතුරකිනි. එළැඹෙන මූල්‍ය වර්ෂය ඇතුළත පවත්නා ආශ්‍රිත වත්කම් හා බැරකම් ප්‍රමාණයන් කෙරෙහි ද්‍රව්‍යාත්මක ගැලපීමක් සිදුකිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති ඇස්තමේන්තු හා උපකල්පනයන් පහත ආමන්ත්‍රණය කරනු ලැබ ඇත.

**(අ) ආදායම් බදු**

විවිධාකාර වූ අධිකරණමය බල ක්ෂේත්‍ර වෙත ආදායම් බදු ගෙවීමට සංස්ථාව යටත් වේ. ආදායම් බදු සඳහා වූ ලෝක ව්‍යාප්ත ප්‍රතිපාදන තීරණය කිරීම උදෙසා සැලකිය යුතු තීන්දු, තීරණ ගැනීමේ හැකියාවක් පැවතිය යුතුය. අවසන් බදු පිළිබඳ තීරණය අවිනිශ්චිත වූ බොහෝ ගනුදෙනු හා ගණනය කිරීම් පවතී. සමාගම විසින් අතිරේක බදු ගෙවීමට සිදුවනු ඇත්තේද යන්න පිළිබඳව වූ ඇස්තමේන්තු මත පදනම්ව අපේක්ෂිත බදු විගණන ගැටලු ආශ්‍රිත වගකීම් හඳුනාගනු ලබයි. ආරම්භක වශයෙන් සටහන් කරන ලද්දාවූ සංඛ්‍යාවනට වඩා මෙකී කරුණුවලට අදාළ අවසන් බදු ප්‍රතිඵලය වෙනස් වන්නාවූ තැන්හි, එබඳු විෂමතාවයන් එම තීරණ ගනු ලැබූ කාලයට අදාළ ජංගම හා උපලබ්ධිගත ආදායම් බදු වත්කම් වෙත බලපෑමක් සිදු කරනු ඇත.

**(ආ) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ**

විශ්‍රාම වැටුප් බැඳීම්හි වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිතයෙන් ආයුෂ්ගණක පදනමක් මත තීරණය කරන්නාවූ සාධක ගණනාවක් මත රඳා පවතී. විශ්‍රාම වැටුප් සඳහා වූ ශුද්ධ පිරිවැය (ආදායම) තීරණය කිරීමෙහි ලා භාවිත කෙරෙන උපකල්පන තුළට වට්ටම් අනුපාතද ඇතුළත් වේ. මෙකී උපකල්පනයන්හි යම් වෙනස්වීමක් සිදු වුවහොත් එය විශ්‍රාම වැටුප් පිළිබඳ වගකීම්හි පවත්නා ප්‍රමාණයට බලපානු ඇත.

සංස්ථාව විසින් ඒ ඒ වර්ෂ අවසානයේදී සුදුසු වට්ටම් අනුපාතය තීරණය කරනු ලබයි. මෙය වූ කලී විශ්‍රාම වැටුප් වගකීම් පියවීම සඳහා අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂා කරන්නාවූ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය තීරණය කිරීමට භාවිත කළ යුතු පොළී අනුපාතිකයයි.

විශ්‍රාම වැටුප් වගකීම් ආශ්‍රිත සෙසු ප්‍රධාන උපකල්පන යම් පමණකට වර්තමාන වෙළඳපළතත්ත්වයන් මත පදනම් වේ.

**(ඇ) ව්‍යුත්පන්නයන්ගේ හා සෙසු මූල්‍යයෝපකරණයන්ගේ සාධාරණ අගය**

සක්‍රිය වෙළඳපලක් තුළ අලෙවි නොකෙරෙන මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගය තක්සේරු ශිල්ප ක්‍රම භාවිතයෙන් තීරණය කෙරේ. ක්‍රම ගණනාවක් තෝරා ගැනීමට හා වාර්තාකරනු ලබන ඒ ඒ කාල පරිච්ඡේදය අවසන පවත්නා වෙළඳපල තත්ත්වයන් මත ප්‍රධාන වශයෙන් රඳා පවත්නා උපකල්පන සිදු කිරීමට සංස්ථාව විසින් ස්වකීය තීන්දු භාවිත කරනු ලබයි. සක්‍රිය වෙළඳපලයන්හි ආලෙවි නොකෙරෙන්නාවූ අලෙවිය සඳහා පවත්නා විවිධ මූල්‍යමය වත්කමක් සඳහා සංස්ථාව විසින් වට්ටම්ගත මුදල් ප්‍රවාහ විග්‍රහය යොදාගෙන ඇත.

## 8. මූල්‍ය අවදානම් කළමනාකරණය

### 8.1 මූල්‍ය අවදානම් සාධක

සංස්ථාවේ ක්‍රියාකාරකම් විසින් එය මූල්‍යමය අවදානම් ගණනාවක් වෙත නිරාකරණය කරනු ලබයි. වෙළඳපල අවදානම, ණය අවදානම හා ද්‍රවශීලතා අවදානම වශයෙනි. අවදානම් කළමනාකරණය අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති යටතේ කළමනාකාරිත්වය විසින් සිදු කරනු ලබයි. කළමනාකාරිත්වය නිතිපතා මූල්‍ය අවදානම් තත්ත්ව හඳුනාගැනීම හා ඇගයුම්කරණය කරයි.

### 8.2 වෙළඳපල අවදානම්

#### 1. විදේශ විනිමය අවදානම

ආයතනයේ ක්‍රියාත්මක නොවන මුදල් වර්ගයක් මගින් අනාගතයේ හඳුනාගත් වත්කම් හා වගකීම් දැක්වෙන අවස්ථාවන්හි විදේශ විනිමය අවදානම ඉස්මතු වේ.සංස්ථාව සතුව විදේශ මුදල් මගින් පෙන්වනු ලබන ලැබිය යුතු හෝ ගෙවිය යුතු දේ නොමැති බැවින් සංස්ථාව විදේශ විනිමය අවදානමකට නිරාවරණයව නොපවතී.

#### 2. පොළී අනුපාතික අවදානම

නිරපේක්ෂ පොළී අනුපාතික මට්ටමෙහි සිදුවන විපර්යාස හේතුකොට සිදුවන හානිකර මූල්‍ය බලපෑමක අවදානම පොළී අනුපාතික අවදානම වශයෙන් හැඳින්වේ. සංස්ථාව විෂයෙහි ශේෂ පත්‍ර දිනය වන විට පොළී ගෙවිය යුතුව පවත්නා ණය ගැනීම් නොමැත. පොළීගෙවිය යුතුව පවත්නා එකම උපකරණය වන භාණ්ඩාගාර බිල්පත් මත කර ඇති ආයෝජනය හා කල්බදු වගකීම එතරම් වැදගත් නොවේ. එබැවින් පොළී අනුපාතික අවදානම දැරිය හැකි මට්ටමක පවතී.

#### 3. මිල අවදානම

වෙළඳ භාණ්ඩයන්හි හා සම කොටස් මිල ගණන්වල වෙනස්වීම් හේතුකොට ඇතිවන්නාවූ හානිකර මූල්‍ය බලපෑමේ අවදානම මිල අවදානම වශයෙන් හැඳින්වේ. අලෙවිය සඳහා පවත්නා කොටස් වශයෙන් කාණ්ඩගත ලැයිස්තුගත නොකළ කෙටස්හි සංස්ථාව විසින් ආයෝජනය කර ඇත්තේ වුවද, මෙකී කොටස් සක්‍රිය වෙළඳපලක අලෙවි නොකරන බැවින් සංස්ථාව මිල අවදානමකට නිරාවරණයව නොමැත.

### 8.3 ණය අවදානම

මුදල් හා මුදල් සමාන දේ, බැංකු හා මූල්‍යාතනයන්හි තැන්පතු මෙන්ම ශේෂව පවත්නාලැබිය යුතු දේහා ඉටුකළ ගනුදෙනු ද ඇතුළත් පාරිභෝගිකයන් වෙත වූ ණය නිරාවරණයන්ද වෙතින් ණය අවදානමඉස්මතු වේ. ප්‍රමිතිගත ගෙවීම් හා සේවා සම්පාදන නියමයන් හාකොන්දේසි ලබා දීමට ප්‍රථම ස්වකීය එක් එක් නව සේවාදායකයා වෙත ණය අවදානම කළමනාකරණය හා විග්‍රහ කිරීම ඒ ඒ නිලධාරියාගේ වගකීම වේ.

**වගුව 11 – 2020 වර්ෂය සඳහා සේවාදායක ණයගැති කාල විශ්ලේෂණය**

| | **2020** | **2019** |
|---|---|---|
| | රු.000 | රු.000 |
| ණය කාලසීමාව ඇතුළත | | |
| මාස0 – 1 | 120,871 | 104,014 |
| පෙර සිට අයවිය යුතු | | |
| මාස1 – 3 | 183,090 | 217,746 |
| මාස3 – 6 | 25,083 | 44,225 |
| මාස 6 ට වැඩි | 178,749 | 152,331 |
| ලැබිය යුතු සමස්ත වෙළඳ ණය | 507,793 | 518,316 |
| උපචය | 113,096 | (101,104) |
| ශුද්ධ වෙළඳමය ලැබිය යුතු දේ | 394,697 | 417,212 |

**9. ආශ්‍රිත පාර්ශව හෙළිදරව්කිරීම්**

ශ්‍රී.ල.ගි.ප්‍ර. 24 ට අනුව සම්බන්ධිත පාර්ශව සමඟ සංස්ථාව සිදු කරන සාමාන්‍ය ව්‍යාපාරික ගනුදෙනු පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **අංකය** | **නම** | **තනතුර** | **සම්බන්ධිත පාර්ශව ගනුදෙනු** | **ලිපිනය** |
|---|---|---|---|---|
| **01** | වෛද්‍ය යද්දෙහිගේ නිහාල් ජයතිලක | සභාපති | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | 465/2, වැලිවිට පාර, කඩුවෙල |
| **02** | **ප්‍රසන්න හෙන්නායක මහතා** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | නො, 190/3ඒ, **පීටර් ඩී පෙරේරා ඇවනිව්**, කොහුවල |
| **03** | **ඉන්දික ජයරත්න මහතා** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, සභාපති - ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | 976,කෝට්ටෙ පාර, ඇතුල්කෝට්ටෙ. |

| | | | | |
|---|---|---|---|---|
| **04** | මංජුල මාකුඹුර මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | 358, මායා මාවත, මාකුඹුර, පන්නිපිටිය. |
| **05** | ජයන්ත ධර්මදාස මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | නො. 7, ලොන්ඩන් ටෙරස්, කොළඹ 07. |
| **06** | ඉන්දික විජයබාහු ලියනගේව ගේ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | 901/4, නුවර පාර, කුළුණිය, |
| **07** | එන්. කේ. අජිත් ගුණරත්න නාරගල මහතා | අධ්‍යක්ෂ ජනරාල් | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | නො, **23බී, කටුවාවල මාවත, ඇම්බිල්ලවත්ත පාර, බොරලැස්ගමුව**. |
| **08** | **පී. ජී. පී. ගාල්ලගේ මහතා** | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | 30/37, කටුවාවල පාර, මහරගම. |
| **09** | A.H.E.R.P එදිරිසිංහ මහත්මිය | ප්‍රධාන ගණකාධිකාරී | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | නො, 36, වල්පොළ, මුල්ලේරියාව නව නගරය |
| **10** | **එච්.එච්. කස්තුරිආරච්චි මහතා** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | 26/19, සුරම්‍ය මාවත, වත්තෙගෙදර, මහරගම |
| **11** | P.B.G සුමේද අතුලසිරි මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් **(වැඩසටහන්/අලෙවි)** | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | 234/J, කදුරුගහ වත්ත මාවත, කොටිකාවත්ත |
| **12** | එස්. ආර්. ඩබ්ලිව්. එම්. ආර්. පී. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | ඉලුප්පුගමුව, වැලිපැන්නගහමුල්ල |

| | | | | |
|---|---|---|---|---|
| | සත්කුමාර මහතා | | | |
| 13 | **පී. කේ. එස්. සුබෝධිනී මහත්මිය** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | **253, සෙවන කනත්ත පාර, වඳුරමුල්ල, පානදුර.** |
| 14 | **පී. ජී. ආර්. හේමන්ති කුමාරි** | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් **(පාලන)** | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | **46/16, ඇවරිහේන පාර, පොල්හේන්ගොඩ, කොළඹ 05.** |
| **15** | චිරින් විජේකෝන් **මහත්මිය** | **අංශ ප්‍රධානි**/අධ්‍යක්ෂ (අධ්‍යාපන වැඩසටහන්) | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | 381 / 97, රජ උයන, වැලිවිට, මාලබේ. |
| 16 | **පාලිත කේ. විජේසිංහ** | අධ්‍යක්ෂ **(නිෂ්පාදන සේවා)** | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | **නො. 225, මහවත්ත පාර, වේවැල්දූව, කැළණිය.** |

**මූල්‍ය, ප්‍රකාශ හා සම්බන්ධිත සටහන්**
**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | **2020** රු. | **2019** රු. |
|---|---|---|
| **01. ආදායම** | | |
| රූපවාහිනී ගුවන්කාල අලෙවිය - චැනල් 1 | 888,101,744 | 1,092,596,171 |
| රූපවාහිනී ගුවන්කාල අලෙවිය - චැනල් අයි | 84,081,866 | 532,926,949 |
| රූපවාහිනී ගුවන්කාල අලෙවිය - නේත්‍රා චැනල් | 69,137,809 | 83,489,401 |
| රූපවාහිනී ගුවන්කාල අලෙවිය ප්‍රති වෙළද ගිවිසුම් | 5,956,000 | 6,755,500 |
| ගුවන්කාල අලෙවිය මත ජාතිය ගොඩනැගීමේ බද්ද | 1,848,932 | 27,179,877 |
| **මුළු ආදායම** | **1,049,126,350** | **1,742,947,899** |
| **02. වෙනත් මෙහෙයුම් ආදායම්** | | |
| නිෂ්පාදන ආදායම | 154,305,702 | 144,203,040 |
| ආයෝජන ආදායම (10 වන වගුව බලන්න) | 34,211,114 | 42,599,894 |
| හුවමාරු ගාස්තු | 394,880 | 774,069 |
| වත්කම් විකිණීමෙන් ලාභය | 26,131 | 10,963,181 |
| ආපනශාලාවෙන් කුලිය | 60,000 | 60,000 |
| දෙපාර්තමේන්තුවේ දඩ මුදල් | 387,613 | 1,162,233 |
| සේවක ණය පොලිය | 4,116,491 | 6,116,301 |
| විවිධ ආදායම් | 2,475,252 | 5,671,454 |
| විදේශ ආධාර ක්‍රමක්ෂය | 24,555,761 | 24,555,761 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | | |

| | | |
|---|---|---|
| | 299,722 | 527,278 |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | 270,387 | 357,817 |
| වැඩසටහන් ද්‍රව්‍ය අලෙවිය | 1,660,152 | 3,446,388 |
| ලියාපදිංචි කිරීමේ ගාස්තුව රූපවාහිනී අලෙවිකරුවන් | 3,241 | 5,063 |
| සංස්ථා පහසුකම් පරිහරණය (විදේශීය) | 175,000 | 1,272,574 |
| සංස්ථා පහසුකම් පරිහරණය (දේශීය) | 39,280,816 | 39,667,783 |
| වැඩසටහන් නිෂ්පාදනය සඳහා ලද විදේශ ආධාර | 1,797,000 | 4,612,786 |
| නැණ මිහිර ප්‍රශ්න පත්‍ර විකිණීමෙන් ලද ආදායම | 19,501,935 | 10,190,555 |
| විනිමය හුවමාරු | - | 534 |
| වෙනත් ගාස්තු ප්‍රතිපූර්ණය - සේවාදායක | - | - |
| වැඩසටහන් වියදම් ප්‍රතිපූර්ණය | - | 2,799,707 |
| අලෙවි ප්‍රවර්ධන ආදායම් | - | 191,304 |
| ගූගල් සේවාව නැරඹීමේ දායකත්වය | 10,602,795 | 7,462,269 |
| තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ලබාදීමේ ගාස්තු | 122 | 147 |
| ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීමෙන් ලද ආදායම | - | 395,625 |
| ප්‍රාග්ධන භාණ්ඩ සඳහා රජයේ ආධාර ක්‍රමක්ෂය | 84,972,613 | 57,074,996 |
| **මුළු වෙනත් මෙහෙයුම් ආදායම්** | **379,096,728** | **364,110,758** |
| 2.1 රජයේ දයකත්වය | 310,000,000 | - |
| | **310,000,000** | **-** |
| **3.විකුණුම් පිරිවැය** | | |
| **3.1 අධ්‍යාපන වැඩසටහන් වියදම්** | | |

| | | |
|---|---|---|
| ශිල්පීය ගාස්තු | 3,679,275 | 4,628,820 |
| සංග්‍රහ වියදම් | 712,491 | 891,751 |
| වේශ නිරූපන ද්‍රව්‍ය | 150,696 | 276,099 |
| පානීය ජලය සඳහා වියදම් | 19,745 | 60,375 |
| වෙනත් වියදම් | 46,595 | 208,377 |
| වැඩසටහන් පිටපත් හා රූපවාහිනී විකාශන අයිතිය මිල දී ගැනීම | 45,000 | - |
| වේදිකා නිර්මාණය | 464,422 | 307,459 |
| දෘශ්‍ය කැසට්පට සහ ටේප් | 438,537 | 864,528 |
| ප්‍රවාහන පහසුකම් කුලියට ගැනීම | - | 28,000 |
| උපකරණ කුලියට ගැනීම | 1,369,500 | 666,650 |
| ශබ්ද උපකරණ කුලියට ගැනීම | 300,000 | 75,800 |
| විදුලිය | 3,700 | 7,600 |
| මෝටර් රථ සඳහා ඉන්ධන | 132,036 | 155,690 |
| ජෙනරේටර් සඳහා ඉන්ධන | - | 800 |
| නවාතැන් | 557,000 | 911,500 |
| ගමන් වියදම් හා යැපීම් දීමනා | 486,068 | 863,336 |
| රූගත කරන ස්ථාන කුලියට ගැනීම/ඉසව් | 15,500 | 3,000 |
| විශේෂ අයිතම | 206,000 | 1,046,000 |
| | **8,626,564** | **10,995,785** |
| චැනල් අයි / නේත්‍රා | | |
| ශිල්පීය ගාස්තු | 1,700,430 | 4,706,180 |
| සංග්‍රහ වියදම් | 69,585 | 263,550 |
| | | |

| | | |
|---|---|---|
| උපකරණ කුලියට ගැනීම | 152,400 | 156,880 |
| ප්‍රවාහන පහසුකම් කුලියට ගැනීම | 9,000 | - |
| ශබ්ද උපකරණ කුලියට ගැනීම | - | 153,000 |
| විදුලිය | 6,000 | 6,000 |
| විදුලි බිල්පත් ප්‍රතිපූර්ණය (Fairway Towers) | 2,286,246 | 2,778,349 |
| විකාශණ කුළුණ භාවිතා කිරීමේ කුලිය | 3,762,000 | 3,638,081 |
| වෙනත් වියදම් | 55,518 | 319,799 |
| ගමන් වියදම් හා යැපීම් දීමනා | 55,485 | 199,562 |
| නිශ්චල ඡායාරූප | | - |
| වැඩසටහන් ද්‍රව්‍ය මිලදී ගැනීම (විදේශීය) | 11,094,000 | 33,975,195 |
| නවාතැන් | 76,000 | 297,500 |
| දෘශ්‍ය කැසට් පට සහ ටේප් | 125,056 | 294,293 |
| වේදිකා නිර්මාණය හා පසුතල නිර්මාණය | 99,470 | 477,211 |
| මෝටර් රථ සඳහා ඉන්ධන | - | 57,770 |
| ජෙනරේටර් සඳහා ඉන්ධන | 2,482 | 1,600 |
| පහසුකම් කුලියට ගැනීම (වේදිකා/ශබ්ද) | - | 153,000 |
| රූගත කරන ස්ථාන කුලියට ගැනීම/ ඉසව් | 4,000 | 84,000 |
| මාධ්‍යරූප හා සජීවිකරණ ද්‍රව්‍ය | - | 34,299 |
| පානීය ජලය සඳහා වියදම | 13,068 | 10,484 |
| වේශ නිරූපන ද්‍රව්‍ය | 2,830 | - |
| චැනල් අයි වැඩසටහන් වියදම් | **19,513,570** | **47,606,753** |
| **3.2 විවිධ වැඩසටහන් වියදම්** | | |
| ශිල්පීය ගෙවීම් | 14,232,919 | 26,530,234 |
| | | |

| | | |
|---|---|---|
| පූර්ව දර්ශන හා නිරීක්ෂණ ගාස්තු | 224,100 | 498,300 |
| සංග්‍රහ වියදම් | 2,770,995 | 4,111,032 |
| වැඩසටහන් පිටපත් හා රූපවාහිනී විකාශන අයිතිය මිල දී ගැනීම | 115,236,958 | 481,295,781 |
| වේදිකා නිර්මාණය, රූගත ස්ථාන පසුතල ආම්පන්න | 1,609,753 | 3,943,731 |
| වේශ නිරූපන ද්‍රව්‍ය | 302,399 | 310,399 |
| දෘශ්‍ය කැසට් පට සහ ටේප් | 901,371 | 2,322,283 |
| මාධ්‍යරූප හා සජීවීකරණ ද්‍රව්‍ය | | - |
| නිශ්චල ඡායාරූප | 104,506 | 119,006 |
| උපකරණ පහසුකම් කුලියට ගැනීම | 10,035,135 | 11,175,069 |
| වෙනත් වියදම් | 1,204,886 | 2,534,356 |
| වැඩසටහන් ද්‍රව්‍ය මිලදී ගැනීම (විදේශීය) | 17,162,405 | 16,694,118 |
| ගමන් වියදම් හා යැපීම් දීමනාව | 1,454,661 | 3,237,400 |
| විශේෂ අයිතම | 168,000 | 2,268,750 |
| නවාතැන් ගාස්තු | 2,195,900 | 5,486,000 |
| EARTH WATCHMAN ප්‍රවර්ධන වැඩසටහන | - | 1,157,590 |
| විදුලිය | 176,773 | 247,773 |
| චිත්‍රාගාර පහසුකම් කුලියට ගැනීම (ශබ්ද) | 781,898 | 1,431,758 |
| ශබ්ද උපකරණ කුලියට ගැනීම | 772,000 | 1,057,000 |
| ප්‍රවාහන පහසුකම් කුලියට ගැනීම | 617,157 | 1,122,857 |
| ජෙනරේටර් සඳහා ඉන්ධන | 10,748 | 68,798 |
| මෝටර් රථ සඳහා ඉන්ධන | 198,773 | 449,803 |
| රූගත කරන ස්ථාන කුලියට ගැනීම/ඉසව් | 240,070 | 454,070 |

| | | |
|---|---|---|
| පානීය ජලය සඳහා වියදම | 212,168 | 523,551 |
| **විවිධ වැඩසටහන් වියදම්** | **170,613,573** | **567,039,659** |
| **3.3 ප්‍රවෘත්ති වැඩසටහන් වියදම්** | | |
| ප්‍රවෘත්ති ඉදිරිපත් කරන්නන් /සංස්කාරකවරුන් වෙත ගෙවීම් | 5,867,945 | 5,764,900 |
| ප්‍රවෘත්ති රැස්කිරීම - දේශීය | 23,692,275 | 23,090,500 |
| ප්‍රවෘත්ති රැස්කිරීම - විදේශීය | 7,116,067 | 6,812,727 |
| වෙනත් වියදම් | 191,978 | 329,529 |
| මෝටර්රථ සඳහා ඉන්ධන | - | 75,119 |
| චන්ද්‍රිකා හා ආශ්‍රිත ගාස්තු - විදේශීය | 694,845 | 2,069,871 |
| චන්ද්‍රිකා හා ආශ්‍රිත ගාස්තු -දේශීය | - | 3,690 |
| ආසියානු ගුවන් විදුලි සංගමයේ ස්ථාවර හා විචල්‍ය ගාස්තු | 4,104,000 | 3,949,657 |
| ප්‍රවාහන පහසුකම් ගැනීම | 14,787,005 | 15,119,999 |
| වෙබ් ධාරාගත කිරීමේ සේවාවන් | 2,700,00 | 2,200,000 |
| දෘශ්‍ය පටි සහ ටේප් | 236,285 | 368,012 |
| සංග්‍රහ වියදම් | 1,289,533 | 2,466,257 |
| ප්‍රවෘත්ති පසුතල නිර්මාණය | - | - |
| ශිල්පීය ගෙවීම් | 4,042,615 | 5,632,990 |
| ප්‍රවාහන පහසුකම් කුලියට ගැනීම(කාළීන සිදුවීම්) | - | 30,000 |
| උපකරණ පහසුකම් කුලියට ගැනීම | 1,148,068 | 1,070,568 |
| ශබ්ද උපකරණ කුලියට ගැනීම | 132,250 | 132,250 |
| ගමන් වියදම් හා යැපීම් දීමනාව | 757,195 | 1,600,266 |
| | | |

| | | |
|---|---|---|
| මාධ්‍යරූප හා සජීවීකරණ ද්‍රව්‍ය | 13,309 | 88,330 |
| නවාතැන් පහසුකම් | 946,100 | 2,981,000 |
| පසුතල සහ වේදිකා නිර්මාණය | 827,982 | 741,251 |
| පානීය ජලය වෙනුවෙන් වියදම් | 34,188 | 83,525 |
| පහසුකම් කුලියට ගැනීම (වේදිකා/ශබ්ද) | 168,723 | 189,723 |
| නිශ්චල ඡායාරූප | 20,000 | 20,000 |
| පසුතල හා රූගතස්ථාන කුලියට ගැනීම (කාලීන සිදුවීම්) | 144,221 | 144,221 |
| සජීවී ධාරාගත කිරීම් | 2,700,000 | 2,200,000 |
| ජෙනරේටර් සඳහා ඉන්ධන | 25,945 | 4,100 |
| විශේෂ අයිතමය | 376,902 | 275,902 |
| **ප්‍රවෘත්ති වැඩසටහන් වියදම්** | **72,017,430** | **77,444,387** |
| **3.4 වාණිජ වැඩසටහන් නිෂ්පාදන වියදම්** | | |
| ශිල්පීය ගෙවීම් | 552,725 | 1,258,450 |
| සංග්‍රහ වියදම් | 6,535 | 195,138 |
| වේදිකා නිර්මාණය / රූගත ස්ථාන හා පසුතල ආම්පන්න | 391,845 | 1,271,697 |
| ප්‍රවාහන පහසුකම් සඳහා කුලිය | - | 2,000 |
| උපකරණ පහසුකම් සඳහා කුලිය | 261,950 | 860,885 |
| වෙනත් වියදම් | 8,789 | 45,981 |
| ගමන් වියදම් හා යැපීම් දීමනා | 90,500 | 255,550 |
| නවාතැන් හා ඉසව් | 159,500 | 609,400 |
| ජෙනරේටර් සඳහා ඉන්ධන | 17,946 | 69,024 |
| විදුලිය | - | 8,000 |
| | | |

| | | |
|---|---|---|
| දෘශ්‍ය පටි හා ටේප් | 35,384 | 52,663 |
| රූගත කරන ස්ථාන කුලියට ගැනීම/ඉසව් | - | 86,895 |
| පානීය ජලය සඳහා වියදම් | 6,264 | 66,803 |
| **වාණිජ වැඩසටහන් වියදම්** | **1,531,438** | **4,782,485** |
| **3.5 වෙනත් නිෂ්පාදන වියදම්** | | |
| වැටුප් හා වෙනත් දීමනා (නිෂ්පාදන කාර්යය මණ්ඩලය) | | |
| වැටුප් දීමනා - ස්ථිර සේවක | 426,362,032 | 390,509,406 |
| වැටුප් දීමනා - කොන්ත්‍රාත් | 6,170,675 | 19,009,872 |
| වැටුප් දීමනා - සහන | 5,865,193 | 11,169,645 |
| අතිකාල | 150,982,007 | 171,067,390 |
| සේවක අර්ථ සාධක අරමුදල් සංස්ථා දායකය | 66,324,698 | 63,186,173 |
| සේවක භාරකාර අරමුදල් සංස්ථා දායකය | 13,265,688 | 12,633,142 |
| නිවාඩු දින දීමනා | 42,178,256 | 46,363,873 |
| සති අන්ත දීමනාව (විධායක) | 2,030,260 | 2,430,150 |
| දුෂ්කරතාවය/උච්චය/බරවැඩ | 5,994,526 | 5,878,561 |
| කාර්යභාර නිලධාරී/ඉංජිනේරු දීමනා | 1,456,538 | 1,351,350 |
| ආහාර දීමනාව - විධායක නොවන | 7,283,250 | 7.414.125 |
| දිරි දීමනා | 24,416,700 | 23,081,231 |
| ප්‍රවාහන දීමනාව | 11,048,177 | 13,012,963 |
| ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 29,932,608 | 24,981,475 |
| ප්‍රසාද දීමනා | 9,097,169 | 8,505,175 |
| විදුලිය - (75%) | 71,198,316 | 79,805,072 |
| විදුලි ජනක යන්ත්‍ර සඳහා ඉන්ධන පිරිවැය | 1,579,650 | 1,903,861 |

| | | |
|---|---|---|
| ධාවන වියදම් (75%) | 7,185,220 | 7,633,172 |
| අලුත්වැඩියා හා නඩත්තු වියදම් - උපකරණ | 12,761,241 | 9,592,818 |
| විදේශ වැඩසටහන් මත වන බද්ද | | - |
| ප්‍රති වෙළෙඳ ගිවිසුම් මත වන වියදම් | 360,000 | 1,053,790 |
| සංඛ්‍යාත වියදම් | 4,746,199 | 7,172,457 |
| සම්ප්‍රේෂණාගාර කුලී වියදම් | 13,927,223 | 15,700,831 |
| කොළඹ - පලාලි දෘශ්‍ය සම්ප්‍රේෂණ සබඳතාව | 3,453,267 | 4,343,980 |
| උපදේශනය සහ පාලනය සඳහා දත්ත පරිපථ ගාස්තු | 317,856 | 1,029,145 |
| තෙවන පාර්ශවයකින් යටිතල පහසුකම් කුලියට ගැනීම | - | - |
| | **917,936,748** | **928,829,656** |
| 3.6 **ක්ෂය** | | |
| **ක්ෂය** | 78,189,773 | 81,525,261 |
| **මුළු විකුණුම් පිරිවැය** | **1,268,429,096** | **1,718,223,986** |
| **4. බෙදාහැරීමේ වියදම්** | | |
| නියෝජිත කොමිස් | 125,940,083 | 229,022,463 |
| සේවාදයකයින් සඳහා වට්ටම් අනුපාත ගැලපීම | - | 3,513,135 |
| අලෙවිකරණ කළමනාකරු සඳහා දිරි දීමනා ගෙවීම | 240,898 | - |
| ප්‍රවර්ධන වියදම් | 381,735 | 6,397,560 |
| රූ චන්ටටේට්මන්ට්හි පටිගත කළ ඩීවීඩීපට වියදම (අලවිය සඳහා) | 704,418 | 1,152,868 |
| **අඩමාන ණය ප්‍රතිපාදනය** | | |
| - සේවක | (37,202) | (765) |

| | | |
|---|---|---|
| - විවිධ | 1,583,888 | 2,725,721 |
| - සේවාදායක | 11,992,003 | 5,207,559 |
| **බෙදාහැරීමේ වියදම්** | **140,805,822** | **248,018,540** |
| **5. පරිපාලන වියදම්** | | |
| සාමාජික පාරිතෝෂිකය | 2,210,000 | 1,650,350 |
| වැටුප්/දීමනා - ස්ථිර කාර්ය මණ්ඩලය | 142,120,677 | 130,169,802 |
| වැටුප් / දීමනා - කොන්ත්‍රාත් | 2,056,892 | 6,336,624 |
| වැටුප් / දීමනා - සහන කාර්ය මණ්ඩලය | 1,955,064 | 3,723,215 |
| අතිකාල | 50,327,336 | 57,022,463 |
| සේවක අර්ථ සාධක අරමුදලේ සංස්ථා දායකත්වය | 22,108,233 | 21,062,058 |
| සේවක භාරකාර අරමුදලේ සංස්ථා දායකත්වය | 4,421,896 | 4,211,047 |
| නිවාඩු දින දීමනාව | 14,059,419 | 15,454,624 |
| විධායක නිලධාරීන් සඳහා සති අන්ත ගෙවීම් | 676,753 | 810,050 |
| දුෂ්කරතාව/උච්චය/ බරවැඩ | 1,998,175 | 1,959,520 |
| කාර්යභාර නිලධාරි/ ඉංජිනේරු ගාස්තු | 485,513 | 450,450 |
| වෘත්තීයවේදී විධායකයින් සඳහා සාමාජික ගාස්තු | 22,352 | 82,657 |
| විශ්‍රාම හා අනත්දරු අරමුදල් | 170,544 | 191,505 |
| ආහාර දීමනා - විධායක නොවන ශ්‍රේණි සඳහා | 2,427,750 | 2,471,375 |
| දිරි දීමනා | 8,138,900 | 7,693,744 |
| ප්‍රවාහන දීමනාව | 3,682,726 | 4,337,654 |
| ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 9,977,536 | 8,327,158 |
| | | |

| | | |
|---|---|---|
| දිරි දීමනා , පාරිතෝෂික හා වන්දි | 1,140,000 | 2,903,423 |
| ප්‍රසාද දීමනා | 3,032,390 | 2,835,058 |
| ක්‍රීඩා සුබසාධනය සඳහා | 43,000 | 69,100 |
| කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් | 20,750 | 26,000 |
| රක්ෂණ වාරිකය - වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | 29,533,106 | 29,127,150 |
| රක්ෂණ වාරිකය - හදිසි අනතුරු හා ජීවිත රක්ෂණය | 1,167,549 | 854,192 |
| ගමන් වියදම් හා යැපීම් දීමනාව - දේශීය | 730,370 | 957,837 |
| ගමන් වියදම් හා යැපීම් දීමනාව - සැතපුම් කුලී දීමනාව | 6,677,451 | 4,875,885 |
| ගමන් වියදම් හා යැපීම් දීමනාව - විදේශීය | 252,614 | 6,004,474 |
| වෙනත් වියදම් - විදේශීය ගමන් | 18,031 | 45,731 |
| සංස්ථා සංග්‍රහ හා විනෝද කටයුතු | 955,339 | 1,769,495 |
| කුලී, වරිපනම් හා බදු | 16,993,014 | 17,615,567 |
| විදුලිය හා බලශක්තිය | 23,732,772 | 26,601,691 |
| දුරකථන ගාස්තු ස්ථාවර ගෙවීම් | 12,948,546 | 11,386,023 |
| ආරක්ෂක සේවා | 11,320,486 | 9,741,796 |
| තැපැල් | 675,810 | 579,503 |
| මුද්‍රණය හා ලිපිද්‍රව්‍ය | 4,630,866 | 7,012,554 |
| පුවත්පත් සහ වාර සඟරා | 1,221,140 | 1,817,820 |
| කාර්යාල අවශ්‍යතා | 4,888,061 | 1,605,405 |
| වත්කම් විකිණීමේ අලාභය | 17,847 | - |
| විනිමය හුවමාරු අලාභයන් | - | 3,325 |
| විවිධ වියදම් | 3,097,274 | 4,963,948 |

| | | |
|---|---|---|
| ටෙන්ඩර් හා බඳවාගැනීම් සඳහා ප්‍රචාරක දැන්වීම් | 4,207,231 | 1,408,600 |
| අධිකරණයේ නඩුවලට වන්දි | 297,580 | - |
| මෝටර් වාහන ධාවන වියදම් | 2,395,073 | 2,544,391 |
| මෝටර් වාහන කුලී වියදම් | 12,315,908 | 10,699,683 |
| රක්ෂණය - ගොඩනැගිලි හා වෙනත් වත්කම් | 2,330,917 | 2,885,508 |
| බලපත්‍ර හා රක්ෂණය - මෝටර් වාහන | 1,234,306 | 1,533,609 |
| අලුත්වැඩියා සහ නඩත්තුව - ගොඩනැගිලි | 11,736,065 | 11,734,798 |
| අලුත්වැඩියා සහ නඩත්තුව - භූමිය | 2,793,959 | 2,400,359 |
| අලුත්වැඩියා සහ නඩත්තුව - වෙනත් වත්කම් | 622,990 | 851,240 |
| ජලය | 2,558,645 | 3,262,800 |
| කැන්ටීම සඳහා | 312,000 | |
| නවාතැන් පහසුකම් | 325,670 | 441,391 |
| අන්තර්ජාල පහසුකම් සඳහා ගාස්තු | 2,605,645 | 4,738,705 |
| නිෂ්පාදකයින් සඳහා දිරි දීමනා | - | 55,000 |
| සංහිඳියාවේ නාළිකාවේ වියදම් | | - |
| සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් - පොදු | - | 115,500 |
| සංවත්සර සැමරුම | 685,649 | 1,193,160 |
| මහජන ඇමතුම් පද්ධතිය - ගාස්තු හා කුලිය | 95,076 | 95,076 |
| මෝටර් වාහන අලුත්වැඩියාවන් | 8,318,613 | 7,736,005 |
| ප්‍රචාරණය හා ප්‍රවර්ධන වැඩකටයුතු | | - |
| පුහුණු වියදම් (අභ්‍යන්තරික) | 1,648,863 | 2,222,914 |
| නැණමිහිර ප්‍රශ්නපත්‍ර මුද්‍රණ වියදම් | 7,997,500 | 5,814,510 |
| | | |

| | | |
|---|---|---|
| පරිත්‍යාග | 200,000 | 300,000 |
| විකාශය කරනු ලබන ගීත සඳහා කතෘභාගය ගෙවීම | 39,000 | - |
| ඩිප්ලෝමා පාඨමාලාව සඳහා වියදම් | | - |
| ජාතික අවශ්‍යතා | | - |
| දායක මුදල් - AIBD ආයතනය | 7,754,033 | 7,005,054 |
| පර්යේෂණ හා සමාලෝචන වියදම් | 1,653,000 | 1,658,163 |
| මැතිවරණ රාජකාරි සඳහා වියදම් | 200,000 | 568,595 |
| විශේෂ බදු-භාණ්ඩාගාරය | 1,915,328 | - |
| ABU | 652,254 | - |
| ක්ෂය | 16,184,269 | 19,433,103 |
| ජාතික ගොඩනැගීමේ බද්ද | - | 32,934,120 |
| | **481,015,755** | **518,382,560** |
| පාරිභෝගික බැඳියාව සඳහා ගාස්තු | 30,000,000 | 36,113,702 |
| **පරිපාලන වියදම්** | **511,015,755** | **554,496,262** |
| **6. මූල්‍ය සහ වෙනත් ගාස්තු** | | |
| බැංකු ගාස්තු | 569,744 | 6,636,897 |
| බැංකු අයිරා පොලිය | 29,257,239 | 36,540,437 |
| බැංකු ඇප ගාස්තු | 9,116,362 | - |
| බැංකු ණය පොළිය | 12,881,250 | 6,246,433 |
| විගණන ගාස්තු | 1,200,000 | 1,500,000 |
| නීති ගාස්තු | 1,698,981 | 2,751,482 |
| මුද්දර බද්ද | 23,825 | 34,450 |
| මූල්‍ය සහ වෙනත් කපාහැරීම් | | - |
| | | |

| | | |
|---|---|---|
| උපදේශක හා වෙනත් වෘත්තීය ගාස්තු | - | 150,000 |
| **මූල්‍ය සහ වෙනත් ගාස්තු** | **54,747,402** | **53,859,699** |
| **7. බදුකරණය** | | |
| | | - |
| හඳුනාගත් සත්‍ය ප්‍රතිලාභය | - | (40,125,273) |
| හඳුනාගත් සත්‍ය ප්‍රතිලාභය | - | **(40,125,273)** |
| වසර අවසානයට ලාභය/අලාභය | (234,300,093) | (467,539,830) |
| රජයේ ප්‍රදාන | 310,000,000 | - |
| වසර අවසානයට ලාභය/අලාභය( රජයේ ප්‍රධාන හැර) | (544,300,093) | (467,539,830) |
| ක්ෂය | 94,374,042 | 100,958,365 |
| පොලී ගෙවීම් | 42,138,490 | 42,786,870 |
| සංස්ථා සංග්‍රහ | 955,339 | 1,769,495 |
| පරිත්‍යාග | 200,000 | 300,000 |
| ප්‍රචාරය හා ප්‍රචාරක ව්‍යාපාර (25% ඉඩ නොදෙන) | | - |
| වාණිජ ප්‍රවර්ධන වියදම් (25% ඉඩ නොදෙන) | 95,434 | 1,599,390 |
| ප්‍රති වෙළෙඳ ගිවිසුම් වියදම් (25% ඉඩ නොදෙන) | 90,000 | 263,448 |
| වත්කම් ඉවත් කිරීමේ ලාභය/ අලාභය | (8,285) | (10,963,181) |
| වත්කම් ඉවත් කිරීම් මත බදු ආශ්‍රිත ලාභය/ අලාභය | 13,171 | 10,988,751 |
| සංවත්සර සැමරුම් | 685,649 | 1,193,160 |
| පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදනය | 30,000,000 | 36,113,702 |
| ගෙවන ලද පාරිතෝෂිකය | (28,457,161 | (44,884,444) |
| බොල් ණය සඳහා ප්‍රතිපාදනය- විවිධ ණයගැතියෝ | 1,583,888 | 2,725,721 |

| | | |
|---|---|---|
| - සේවාදායක | 11,992,003 | 5,207,559 |
| - සේවක | (37,202) | (765) |
| කපා හරින ලද නිශ්චිත අඩමාන ණයගැතියෝ | | |
| පොලී ආදායම | (34,211,114) | (42,599,894) |
| ප්‍රාග්ධන භාණ්ඩ සඳහා රජයේ දීමනාවෙහි ක්‍රමක්ෂය | (84,972,613) | (57,074,996) |
| වැඩසටහන් නිෂ්පාදනය සඳහා විදේශ ප්‍රදන | (1,797,000) | (4,612,786) |
| ප්‍රාග්ධන දීමනාව | (99,841,269) | (85,543,348) |
| විදේශ ප්‍රදානයන්හි ක්‍රමක්ෂය | (24,555,761) | (24,555,761) |
| ව්‍යාපාරික ලාභය /අලාභය | **(636,052,482)** | **(1,001,408,375)** |
| පොලී ආදායම | 34,211,114 | 42,599,894 |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | **34,211,114** | **42,599,894** |
| අලාභ (ව්‍යවස්ථාපිත ආදායමෙන් 35%) | (11,973,890) | (14,909,963) |
| ගෙවන ලද පොලී | (42,138,490) | (42,786,870) |
| තක්සේරු කළ ආදායම | (19,901,266) | 27,689,931 |
| බද්දට යටත් ආදායම | **(19,901,266)** | **27,689,931** |
| ආදායම් බද්ද (28%) | | **7.753.18**0.74 |
| ආදායම් බදු වගකීම් | | **7,753,181** |
| විලම්භිත බද්ද | (2,474,904) | (14,253,612) |
| | (2,474,904) | (6,500,431) |

## 8.දේපල - පිරියත හා උපකරණ

| සටහන | 2018.12.31 දිනට ශේෂය | එකතුවීම් | ගැලපීම් | ඉවත් කිරීම් | 31/12/2019 දිනට ශේෂය | එකතුවීම් | ඉවත් කිරීම් | 31/12/2020 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 7,660,503 | - | - | - | 7,660,503 | - | - | 7,660,503 |
| ගොඩනැගිලි | 271,875,821 | 1,051,296 | - | - | 272,927,117 | - | - | 272,927,117 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 54,787,416 | 828,784 | - | - | 55,616,200 | 357,429 | - | 55,973,629 |
| පිරියත හා උපකරණ | 3,044,086,837 | 32,166,119 | - | (69,888) | 3,076,183,068 | 2,332,048 | (10,493) | 3,088,504,623 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ලබාගත් උපකරණ | - | 75,167,126 | - | - | 75,167,126 | 85,814,751 | - | 160,981,877 |
| කාර්යාලීය උපකරණ | 53,063,100 | 1,178,396 | - | (72,760) | 54,168,736 | 277,979 | (42,550) | 54,404,165 |
| විද්‍යුත් උපකරණ | 7,942,657 | 23,897 | - | - | 7,966,554 | 174,109 | - | 8,140,663 |
| රූපවාහිනී යන්ත්‍ර | 26,260,114 | 48,000 | - | (245,049) | 26,063,065 | - | (148,262) | 25,914,804 |
| පුස්තකාල ග්‍රන්ථ | 2,425,795 | 11,345 | - | - | 2,437,140 | 50,000 | - | 2,487,140 |
| ලුහු මෙවලම් හා උපකරණ | 4,465,006 | 107,243 | - | - | 4,572,249 | 36,215 | - | 4,608,464 |
| පරිගණක | 124,956,715 | 12,100,678 | - | - | 137,057,393 | 575,000 | - | 137,632,393 |
| වෙනත් වත්කම් | 5,241,912 | 27,760 | - | - | 5,269,672 | 59,167 | - | 5,328,838 |
| ගිණුම්කරණ මෘදුකාංග | 9,542,602 | - | - | - | 9,542,602 | - | - | 9,542,602 |
| එන්.ටී.වී චැනලය සඳහා ගත් උපකරණ | 33,159 | - | - | - | 33,159 | - | - | 33,159 |
| මෝටර් වාහන | 111,705,466 | - | - | (8,988,132) | 102,717,335 | - | - | 102,717,335 |
| සංගීත උපකරණ | 170,037 | - | - | - | 170,037 | 1,500 | - | 171,537 |
| කැරවෑන් රථ | 162,142 | - | - | - | 162,142 | - | - | 162,142 |
| ආරක්ෂිත | 2,169,763 | - | - | - | 2,169,763 | - | - | 2,169,763 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| උපකරණ | | | | | | | | |
| JAICA ව්‍යාපෘතිය යටතේ ලද උපකරණ | 66,773,685 | - | - | - | 66,773,685 | - | - | 66,773,685 |
| සංහිඳියාවේ නාළිකාව වෙනුවෙන් ගත් උපකරණ | 151,278,272 | - | - | - | 151,278,272 | - | - | 151,278,272 |
| Container | 3,549,895 | - | - | - | 3,549,895 | - | - | 3,549,895 |
| **වත්කම්වල මුළු වටිනාකම** | **3,948,150,897** | **122,710,644** | **-** | **(9,375,828)** | **4,061,485,712** | **99,678,198** | **(201,304)** | **4,160,962,606** |

## 8.ක්ෂය

| සටහන | 2018.12.31 දිනට ශේෂය | වර්ෂයට අදාල ක්ෂය | ගැල පීම් | ඉවත් කිරීම් | 31/12/2019 දිනට ශේෂය | වර්ෂයට අදාල ක්ෂය | ගැලපීම් | ඉවත් කිරීම් | 31/12/2020 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | - | - | - | - | - | - | - | - | |
| ගොඩනැගිලි | 131,477,365 | 5,437,516 | - | - | 136,914,882 | 5,458,542 | - | - | 142,373,424 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 46,160,393 | 2,255,727 | - | - | 48,416,120 | 2,056,726 | - | - | 50,472,845 |
| පිරියත හා උපකරණ | 2,932,850,825 | 44,761,733 | - | (35,417) | 2,977,577,140 | 29,839,394 | - | (10,492) | 3,007,406,042 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ලබාගත් උපකරණ | | 6,545,721 | - | - | 6,545,721 | 18,094,725 | - | - | 24,640,446 |
| එන්.ටී.වී චැනලය සඳහා ගත් උපකරණ | 33,158 | - | - | - | 33,158 | - | - | - | 33,158 |
| කාර්යාලීය උපකරණ | 49,069,541 | 819,863 | - | (51,069) | 49,838,336 | 814,092 | - | (26,136) | 50,626,291 |
| විද්‍යුත් උපකරණ | 7,862,686 | 83,317 | - | - | 7,946,003 | 59,276 | - | - | 8,005,279 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| රූපවාහිනී යන්ත්‍ර | 23,846,305 | 1,018,265 | - | (245,040) | 24,619,530 | 601,404 | - | (129,411) | 25,091,523 |
| පුස්තකාල ග්‍රන්ථ | 2,325,577 | 58,175 | - | - | 2,383,752 | 48,028 | - | - | 2,431,780 |
| ලුහු මෙවලම් හා උපකරණ | 3,694,390 | 133,745 | - | - | 3,828,135 | 102,733 | - | - | 3,930,868 |
| පරිගණක | 112,382,27 | 6,366,693 | - | - | 118,748,910 | 5,985,122 | - | - | 124,734,032 |
| වෙනත් වත්කම් | 4,695,458 | 205,111 | - | - | 4,900,570 | 160,753 | - | - | 5,061,322 |
| ගිණුම්කරණ මෘදුකාංග | 9,470,816 | 42,096 | - | - | 9,512,911 | 29,681 | - | - | 9,542,593 |
| මෝටර් වාහන | 108,001,126 | 2,903,750 | - | (8,988,131) | 101,916,746 | 796,915 | - | - | 102,713,661 |
| සංගීත උපකරණ | 170,028 | - | - | - | 170,028 | - | - | - | 170,028 |
| කැරවෑන් රථ | 162,140 | - | - | - | 162,140 | - | - | - | 162,140 |
| ආරක්ෂිත උපකරණ | 2,169,761 | - | - | - | 2,169,761 | - | - | - | 2,169,761 |
| JAICA ව්‍යාපෘතිය යටතේ ලද උපකරණ | 66,773,669 | - | - | - | 66,773,669 | - | - | - | 66,773,669 |
| සංහිඳියාවේ නාළිකාව වෙනුවෙන් ගත් උපකරණ | 7,500,089 | 30,255,654 | - | - | 37,755,743 | 30,255,654 | - | - | 68,011,397 |
| Container | 197,491 | 70,998 | - | - | 268,488 | 70,998 | - | - | 339,486 |
| **මුළු ක්ෂය** | **3,508,843,034** | **100,958,365** | **-** | **(9,319,656)** | **3,600,481,742** | **94,374,042** | **-** | **(166,039)** | **3,694,689,746** |

## වත්කම්වල ශුද්ධ පොත් අගය

| | සටහන | 2018.12.31 දිනට ශේෂය | 2019.01.01 දිනට ශේෂය | 31/12/2019 දිනට ශේෂය | 01/01/2020 දිනට ශේෂය | 31/12/2020 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| 8 | පිරිවැය | 3,948,150,897 | 3.948.150.897 | 4,061,485,712 | 4,061,485,712 | 4,160,962,606 |
| | ක්ෂය | (3,508,843,034) | (3,508.843.034) | (3,600,481,742) | (3,600,481,742) | (3,694,689,746) |
| | **දේපල, පිරියත හා උපකරණවල ශුද්ධ පොත් අගය** | **439,307,863** | **439.307.863** | **461,003,970** | **461,003,970** | **466,272,860** |

## නොනිමි වැඩ

| සටහන | 2018.12.31 දිනට ශේෂය | එකතුවීම් | මාරු කිරීම් | 31/12/ 2019 දිනට ශේෂය | එකතුවීම් | මාරු කිරීම් | **31/12/ 2020 දිනට ශේෂය** |
|---|---|---|---|---|---|---|---|
| නොනිමි වැඩ | | 1,505,600 | (1,505,600) | - | 784,162 | 784,162 | - |

| සටහන | 2018.12.31 දිනට ශේෂය | 2019.01.01 දිනට ශේෂය | 31/12/2019 දිනට ශේෂය | 01/01/2020 දිනට ශේෂය | 31/12/2020 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| 8.දේපල, පිරියත හා උපකරණවල ශුද්ධ පොත් | 439,307,863 | 439.307.863 | 461,003,970 | 461,003,970 | 466,272,860 |
| නොනිමි වැඩ | - | - | - | - | - |
| **මුළු වත්කම්** | **439,307,863** | **439.307.863** | **461,003,970** | **461,003,970** | **466,272,860** |

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව**
**මූල්‍ය ප්‍රකාශන සටහන්**

| **සටහන** | 2020 රු. | 2019 රු. | |
|---|---|---|---|
| **9. අස්පෘශ්‍ය වත්කම්** | | | |
| මිල දී ගත් ටෙලි නාට්‍ය | 81,124,500 | 97,265,000 | |
| සංස්ථාව නිපද වූ ටෙලි නාට්‍ය | 14,334,858 | 19,163,741 | |
| සංස්ථාව නිපද වූ අනෙකුත් දෑ | 9,732,708 | 13,007,369 | |
| විදේශයන්ගෙන් මිල දී ගත් වැඩසටහන් අමුද්‍රව්‍ය | - | 3,630,627 | |
| දේශීය වැඩසටහන් (විකාශය නොවූ) | - | - | |
| විදේශීයවැඩසටහන්පදානය (NHK) | 29,440,000 | 44,160,000 | |
| දේශීය වැඩසටහන් (නොනිමි) | | | |
| අස්පෘශ්‍ය වත්කම් | **134,632,066** | **177,226,737** | |
| **10. පරිණත දිනය දක්වා තබාගන්නා මූල්‍ය සාධන පත්‍ර** | | | |
| ස්ථාවර තැන්පතු (ලංකා බැංකුව) | 377,741,390 | 344,019,376 | |
| ස්ථාවර තැන්පතු (රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව) | 24,162,600 | 22,000,000 | |
| | **401,903,990** | **366,019,376** | |
| **11. තොග** | | | |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 1,827,599 | 1,469,115 | |
| අමතර කොටස් - ඉංජිනේරු 1 | 18,052,749 | 18,052,749 | |
| අමතර කොටස් - ඉංජිනේරු 11 | 177,996,532 | 178,344,992 | |
| අමතර කොටස්- ඊ.එන්.ජී. සහ ඉංජිනනේරු | 210,662 | 219,950 | |
| | | | |

| | | | |
|---|---|---|---|
| මාධ්‍යරූප ද්‍රව්‍ය | 1,670 | 1,001 | |
| වේශ නිරූපන ද්‍රව්‍ය | 21,600 | 10,700 | |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 6,037 | 8,092 | |
| මෝටර් වාහන ද්‍රව්‍ය | 1,228,592 | 1,357,794 | |
| ඩීසල් තොග | - | 1,522,040 | |
| කාර්යාලවලට අවශ්‍ය භාණ්ඩ (මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය හැර) | 15,473 | 23,485 | |
| විවිධ දෑ | 130,671 | 215,255 | |
| ප්‍රාග්ධන භාණ්ඩ | | - | |
| ප්‍රධාන ගබඩාවේ ඇති දෘශ්‍ය පට හා ටේප් | 360,874 | 2,318,016 | |
| විද්‍යුත් පාරිභෝජන ද්‍රව්‍ය | 222,875 | 244,151 | |
| පුස්තකාලයේ ඇති දෘශ්‍ය පට හා ටේප් | 271,824 | 154,140 | |
| පටිගත කළ කැසට්පට | 733,777 | 575,192 | |
| තොග | **201,080,934** | **204,516,673** | |
| **12. වෙළඳ ලැබිය යුතු දේ** | | | |
| සේවාදායක ණයගැතියෝ | 507,792,953 | 518,315,788 | |
| අගරු චෙක්පත් | 57,500 | 42,500 | |
| අඩුකලා - සේවාදායක ක්‍රමක්ෂය | (113,096,174) | (101,104,171) | |
| වෙළඳ ණයගැතියෝ | **394,754,279** | **417,254,118** | |
| **13. ණය හා වෙනත් ලැබිය යුතු දෑ** | | | |
| **13.1.භාණ්ඩාගාර බිල්පත්** | | | |
| භාණ්ඩාගාර බිල්පත් | 826,764 | 2,596,016 | |
| | **826,764** | **2,596,016** | |
| | | | |

| | | | |
|---|---|---|---|
| **13.2. ණයගැතියෝ - සේවක** | | | |
| රූපවාහිනී ණය - වෙනත් ණය | 35,452 | 35,452 | |
| ආපදා ණය | 59,380,696 | 72,273,664 | |
| උත්සව අත්තිකාරම් | 409,200 | 307,800 | |
| ප්‍රවාහන ණය | 17,146,242 | 22,988,301 | |
| විශේෂ ණය | 11,852,326 | 16,416,227 | |
| වෙනත් ණය | - | - | |
| රෙදිපිළි ණය | 94,700 | 2,778,267 | |
| නිවාස ණය | 68,688,947 | 60,586,534 | |
| සේවක ණයගැතියෝ | **157,607,563** | **175,386,245** | |
| (-) සේවක ණය ක්‍රමක්ෂය | (135,459) | (172,661) | |
| | **157,472,104** | **175,213,584** | |
| ණය සහ වෙනත් ලැබිය යුතු දෑ | **158,298,867** | **177,809,600** | |
| **14.වෙනත් ලැබිය යුතු දෑ** | | | |
| **14.1. අත්තිකාරම් හා තැන්පතු** | | | |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිවාස ණය අරමුදල | 6,758,720 | 13,288,676 | |
| මාර්ගස්ථ තොග | 42,464,532 | 114,985,792 | |
| ණයවර ලිපි සඳහා අත්තිකාරම් | - | 1,590 | |
| සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් - මිලට ගැනීම් (දේශීය ආයතන) | 2,635,921 | 1,669,191 | |
| සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් (වැඩසටහන් නිෂ්පාදන) | 5,633,246 | 5,131,612 | |
| සේවකයින් වෙත අත්තිකාරම් - විවිධ | 481,029 | 697,275 | |
| අලෙවි නියෝජිතයින් වෙත අත්තිකාරම් | 650,000 | - | |

| | | | |
|---|---|---|---|
| | | - | |
| සේවකයින් වෙත අත්තිකාරම් - වැඩසටහන් අත්තිකාරම් | 1,139,846 | 1,165,798 | |
| සේවාවන් සඳහා තැන්පතු - ආපසු ගෙවීම් | 3,647,307 | 3,197,307 | |
| කාමර ගාස්තු සඳහා අත්තිකාරම් | 428,000 | 319,000 | |
| මුද්දර අගිමය පරිපාලන අංශය | 81,640 | 72,865 | |
| විදේශ මිල දී ගැනීම් අත්තිකාරම් - අමතර කොටස් | 9,233,586 | 9,233,586 | |
| ගමන් වියදම් අත්තිකාරම් - විදේශ | - | 30,646 | |
| සේවකයින්ට දුන් අත්තිකාරම් මිල දී ගැනීම | 1,435,717 | 601,026 | |
| රඳවා ගැනීමේ බද්ද | 36,974,494 | 36,974,494 | |
| අත ඉතිරි සුලු මුදල් | - | - | |
| ගමන් වියදම් අත්තිකාරම් - දේශීය | | | |
| ආර්ථික සේවා ගාස්තු බද්ද (ESC) | 22,225,059 | 22,225,059 | |
| තැන්පතු හා අත්තිකාරම් | **133,789,097** | **209,593,916** | |
| **14.2. විවිධ ණයගැතියෝ** | | | |
| විවිධ ණයගැතියෝ | 1,974,549 | 2,351,954 | |
| විශ්‍රාම ලත් /ඉල්ලා අස් වූ සේවකයින්ගෙන් ලැබිය යුතු දෑ | 80,358 | 80,358 | |
| ලැබිය යුතු ආදායම්( දේශීය ආදායම් හා අනෙකුත් ආයතන) | 78,356,177 | 56,989,115 | |
| ලැබිය යුතු ආදායම් - ආයෝජන පොළී ආදායම් | 12,304,451 | 17,314,350 | |
| සේවක ණයගැතියෝ - විවිධ | 54,082 | 42,644 | |

| | | | |
|---|---|---|---|
| රක්ෂණ සංස්ථාව - වෛද්‍ය යෝජනා ක්‍රමය | 229,791 | 200,515 | |
| කාසි ගැලපුම් | 29,998 | 30,116 | |
| විවිධ ණයගැතියෝ | **93,029,405** | **77,008,692** | |
| අඩු කළා - විවිධ ණයගැති ක්‍රමක්ෂය | (34,725,874) | (33,141,986) | |
| | 58,303,531 | 43,866,706 | |
| වෙනත් ලැබිය යුතු දෑ | **192,092,628** | **253,460,622** | |
| **15. මුදල්,බැංකු ශේෂය හා ඒක්ෂණ තැන්පතු** | | | |
| ලංකා බැංකු ඉතුරුම් ගිණුම | 5,362,625 | 1,097,793 | |
| ඉල්ලුම් තැන්පතු | | | |
| ස්ථාවර තැන්පතු කෙටිකාලීන | 25,293,953 | - | |
| නැවත මිලදී ගැනීමේ ගිවිසුම්(REPO) | | - | |
| මහජන බැංකුව ජංගම ගිණුම | 50,000 | 50,000 | |
| ලංකා බැංකු ගිණුම ශේෂය ටොරින්ටන් ශාඛාව | 124,707,235 | - | |
| | **155,413,812** | **1,147,793** | |
| **16.ප්‍රාග්ධන භාණ්ඩ සඳහා රජයේ ප්‍රදානය** | | | |
| ප්‍රාග්ධන භාණ්ඩ සඳහා රජයේ ප්‍රදානය | 483,255,000 | 333,372,613 | |
| | **483,255,000** | **333,372,613** | |
| **17. විශ්‍රාමික පාරිතෝෂිකය** | | | |
| විශ්‍රාමික පාරිතෝෂිකය | 226,221,975 | 224,679,135 | |
| | **226,221,975** | **224,679,135** | |
| **18.වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දේ** | | | |

| | | | |
|---|---|---|---|
| සේවාදායක ණයහිමියෝ | 22,665,031 | 19,598,603 | |
| ගෙවිය යුතු නියෝජිත කොමිස් මුදල | 87,282,685 | 95,826,493 | |
| සේවාදායක මාරුකිරීම්/ආපසු ගෙවීම් | 978,553 | 1,000,927 | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දේ | **110,926,268** | **116,426,023** | |
| **19.වෙනත් මූල්‍ය වගකීම්** | | | |
| උපචිත වියදම් | 165,882,559 | 179,155,943 | |
| ලබා නොගත් වැටුප් හා වේතන | 285,370 | 332,923 | |
| රඳවා ගත් මුදල් - කොන්ත්‍රාත් | 39,208 | 7,788 | |
| ඇපකර - කොන්ත්‍රාත් හා සැපයුම් | 94,241 | 94,241 | |
| ණයහිමි පාලනය | 9,580,443 | 7,238,460 | |
| අවලංගු වූ චෙක්පත් - ආයතනික ශාඛාව | 242,046,087 | 41,488,923 | |
| ශිල්පීය ගෙවීම් (අවලංගු වූ චෙක්පත්) | 7,104,750 | 2,899,115 | |
| රඳවාගත් මුදල් - ශ්‍රී.ලං.රූ. සංස්ථා - සේවකයෝ | 7,000 | 7000 | |
| ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා | 90 | 90 | |
| කලින් ලැබීම් | 9,924,503 | 7,798,036 | |
| නැවත ගෙවන ටෙන්ඩර් තැන්පතු | 1,433,816 | 1,409,621 | |
| ගෙවිය යුතු වැටුප් | 64,739,873 | 57,007,809 | |
| රූපවාහිනී කෞතුකාගාරය සඳහා අරමුදල | 10,002 | 10,002 | |
| සී.අයි.ආර්. මුද්දර බද්ද | (12,550) | (9,500) | |
| ගෙවිය යුතු නැරඹුම් දායකත්වය | 2,416,207 | 3,763,815 | |
| රාජ්‍ය අමාත්‍යාංශය | 273,362 | 179,112 | |
| | | | |

| | | | |
|---|---|---|---|
| පාරිතෝෂික මත දඩ සඳහා ප්‍රතිපාදනය | 73,745 | 73,745 | |
| ගෙවිය යුතු විවිධ වියදම් - සුව සහන | 73,574 | 73,574 | |
| ලාභාංශ ප්‍රතිපාදනය (රජයට) | 32,368,342 | 32,368,342 | |
| වෙනත් මූල්‍ය වගකීම් | **536,340,622** | **333,899,038** | |
| 20.වෙනත් ගෙවිය යුතු දෑ | | | |
| රඳවා ගැනීමේ බදු | 1,743,081 | 2,130,916 | |
| ආදායම් බදු | - | 7,753,181 | |
| එකතු කළ අගය මත බදු පාලන ගිණුම | 16,092,055 | 340,675 | |
| රඳවා ගත් පිරිවැටුම් බද්ද | 4,447 | 4,447 | |
| උපයන විට ගෙවීම් බද්ද | 179,908 | 507,665 | |
| **වෙනත් ගෙවිය යුතු දෑ** | **18,019,491** | **10,736,884** | |
| 21.බැංකු අයිරාව | | | |
| බැංකු අයිරාව - ලංකා බැංකු Torrington ශාඛාව | - | 47,686,979 | |
| බැංකු අයිරාව - ලංකා බැංකු ආයතනික ශාඛාව | 258,728,044 | 435,031,703 | |
| බැංකු අයිරාව | **258,728,044** | **482,718,683** | |
| 22. බැංකු ණය | | | |
| 22.1 බැංකු ණය ජංගම කොටස | 55,813,953 | 15,604,561 | |
| 22.1 බැංකු ණය ජංගම නොවන කොටස | 139,534,884 | - | |
| 22.3 කෙටි කාළීන ණය - ICC World Cup ක්‍රිකට් තරඟාවලිය සඳහා | 54,750,000 | 73,000,000 | |
| | **250,098,837** | **88,604,561** | |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඑම්/බී/එස්එල්ආර්සී/1/එෆ්/2020   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2021 දෙසැම්බර් 29 දින

සභාපති,

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කල මතය

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්,සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   oag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 32 වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂයේ රු. 97,969,813 ක් වූ ගෙවිය යුතු නියෝජිත කොමිස් ශේෂයෙන් රු. 10,687,128 ක් වූ ලැබිය යුතු නියෝජිත කොමිස් ශේෂ හිලව් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 හි 9 වන වගන්තියට පටහැනිව සංස්ථාව විසින් තොගවල ශුද්ධ උපලබ්ධි අගය ඇස්තමේන්තු කිරීමකින් තොරව, පිරිවැය වූ රු.201,080,934 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව ගත්මිල රු. 3,386,515,041 ක්වූ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනට භාවිතාකරන දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත ක්ෂය වෙන්කිරීම රු. 3,694,689,745 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද ක්ෂය උපලේඛනයේ රු. 3,703,594,072 ක් වුයෙන් රු. 8,904,327 ක වෙනසක් විය.

(ඉ) සංස්ථාවේ ඉතිරිකිරීමේ බැංකු ගිණුමේ ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ මුදල් හා බැංකු ශේෂය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල්වලට සමාන දෑ අතර රු. 5,362,625 ක වෙනසක් විය.

(ඊ) 2018 වර්ෂයේදී සංස්ථාව වෙත ලැබුණු රු.මිලියන 100 ක රාජ්‍ය ප්‍රදානය මගින් 2019 වර්ෂයේ දී සංස්ථාව විසින් රු. 75,167,126 ක උපකරණ මිලදී ගෙන තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 අනුව මෙම උපකරණ සඳහා ක්‍රම ක්ෂය ගණනය කිරීමේ දී මිලදී ගත් උපකරණ වටිනාකම මත ක්‍රම ක්ෂය ගණනය කරනු වෙනුවට රු. මිලියන 100 ක් වූ සම්පූර්ණ රාජ්‍ය ප්‍රදානය මත ක්‍රම ක්ෂය ගණනය කිරීම හේතුවෙන් 2020 වර්ෂය සඳහා රු. 4,966,575 ක වටිනාකමින් වෙනත් ආදායම් වැඩියෙන් සහ රාජ්‍ය ප්‍රදාන අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සංස්ථාව විසින් ලංකා පුවත් ආයතනයෙන් කොටස් මිල දී ගැනීම සඳහා 1985 සහ 1992 වර්ෂවලදී රු.1,104,000 ක් ආයෝජනය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය දක්වාම කිසිදු ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණු අතර ආයෝජනවල අයිතිය, පැවැත්ම හා වටිනාකම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන සංස්ථාව සතුව නොතිබුණි.

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද, කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත් පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව,මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඌ), (ක), 2.3 (ඌ),(ඔ), (ඒ) ඡේදවල නිරීක්ෂණ හැර අතුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමාකිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ට) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීතිරීති/ විධිවිධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371(5) වගන්ති | (i) එක් අවස්ථාවකදී ලබාදිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක් වුවද වැඩසටහන් නවාතැන් පහසුකම් සැපයීම සහ මිලදී ගැනීම සඳහා අවස්ථා 46 කදී සීමාව ඉක්මවා රු.40,406,563 ක් ලබා දී තිබුණි.<br>(ii) අදාල කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට අවස්ථා 09 කදී ලබාදී තිබුණු වර්ෂය ඉක්මවූ අත්තිකාරම් ශේෂය රු. 6, 606,962 ක් විය. |

(ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 2015 ජූනි 16 දිනැති අංක පීඊඩී 3/2015 දරන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට අනුව සභාපතිවරයාට ගෙවිය යුතු දීමනාවට අමතරව විශේෂ දීමනා හා වෙනත් දීමනා ලෙස රු. 548,388 සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි. |
| (ii) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන චක්‍රලේඛයේ | ප්‍රවාහන හා ඉන්ධන දීමනාව සඳහා හිමිකම් නොමැති නිලධාරීන් 99 දෙනෙකුට ප්‍රවාහන හා ඉන්ධන දීමනාව |

2.3 ඡේදය — ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 8,203,940 ක් ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍යය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර නොමැති බව

## 2.3 වෙනත් කරුණු

(අ) සංස්ථාවේ සමාලෝචිත වර්ෂ අවසානයට මුළු සේවාදායක ණයගැති ශේෂය රු. 507,789,779 ක් වූ අතර ඉන් රු. 229,200,950 ක් හෙවත් සියයට 45 ක් මිලියන 50 වැඩි වටිනාකම් සහිත රාජ්‍ය ආයතනයක් ඇතුළු ණයගැතියන් 10 දෙනෙකුගෙන් නියෝජනය වී තිබුණි. එහි ඇතුළත් ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමග එළඹී විධිමත් ගිවිසුමක් නොමැති වීම නිසා බැංකුවෙන් ලැබිය යුතු මිලියන 10ක් අයකර ගැනීමට නීතිමය පියවර ගනු ලැබුවද අයකර ගැනීම අවිනිශ්චිත වී තිබුණි. එසේම රාජ්‍ය ආයතන 32 ක් ඇතුළුව 170 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණු වසර 5 ඉක්මවූ රු.97,117,914 ක් වටිනා ණයගැති ශේෂයෙන් රු. 78,480,159 ක් නියෝජනය කරන ණයගැතියන් 153 දෙනෙකු වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සංස්ථාව ස්ථාපිත 1982 වර්ෂයේ සිට ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යනු ලබන කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි අක්කර 8 ක් පමණ විශාල ඉඩම සහ ගොඩනැගිලි සංකීර්ණයෙහි නෛතික අයිතිය පවරාගෙන එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2020 වර්ෂය තුළදී ගාස්තු අයකළ යුතු වුවද ගාස්තු අයකිරීමෙන් තොරව විකාශය කළ වැඩසටහන් 80 ක් සඳහා වූ ගුවන් කාලය පැය 119 විනාඩි 37 ක් වෙනුවෙන් රු. 30,250,006 ක වටිනාකමක් සංස්ථාවට අහිමිවී තිබුණි.

(ඈ) සංස්ථාවේ පවත්වා ගෙන යන බැංකු ජංගම ගිණුම් දෙකකට අදාලව සමාලෝචිත වර්ෂයේදී එක් මාසයක් හැර සෑම මාසයකම අනුමත අයිරා සීමාව ඉක්මවා තිබුණු අතර බැංකු අයිරාවන් සඳහා පොලී ලෙස රු. 29,085,302ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

7

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඉ) ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව ලොවට ගෙනයාම හා විදේශගත ලාංකිකයන්ගේ දැනුම රසාස්වාදය ප්‍රවර්ධනය සඳහා චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ ඉතාලියේ හෝ යුරෝපයේ ස්ථාපිත මැදිරියක රූපවාහිනී නාලිකාවක් පවත්වාගෙන යාමටත් ඊට අවශ්‍ය උපකරණ තාවකාලිකව බදු පදනම යටතේ මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය මත ලබා ගැනීමටත් 2014 දෙසැම්බර් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව අත්තිකාරම් වශයෙන් 2015 ජනවාරි 02 දින රු.3,454,279 ක් පෞද්ගලික සමාගමකට මුදල් අමාත්‍යංශ එකඟතාවයෙන් තොරව ගෙවා තිබුණද 2015 වර්ෂයෙන් පසුව මෙම කාර්යය සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණු අතර ගෙවූ අත්තිකාරම අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථිර තනතුරු පුරප්පාඩු 182 ක් හා වැඩ බලන තනතුරු 28 ක් පැවතුණු අතර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව නොතිබුණු තනතුරු 14 ක් සඳහා ස්ථිර සේවකයන් 27 දෙනෙකු, කොන්ත්‍රාත් සේවකයින් 12 දෙනෙකු සහ සේවකයන් 02 ක් කාර්ය පැවරුම් පදනම යටතේ බඳවාගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

8